
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565ක් වූ ඇසළ අවඅටවක පෝය දින, 2021 ජූලි 31 සෙනසුරාදා , BUDUSARANA SATURDAY JULY 31, 2021

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 56 වැනි කාණ්ඩය, 06 වැනි පත්‍රය , පිටු 20 ආරම්භය 1965 - 06 - 13 මිල රු. 40.00



මිසදිටු බමුණකු පැහැදීම

# ජීවිතයටත් කළමනාකරණයක් ඕනෑ

**බුදුරජාණන් වහන්සේ මානව සම්පත සේ ම අනෙක් සියල්ල මනාව ක්‍රියාවේ යෙදවූ උත්තරීතර නායකයෙකි. අවු 45 වැනි සීමිත කාල සීමාවක දී ගොඩනැගූ ශාසනය නිරුපද්‍රිත ව වසර 2600 ගතවන මෙහොතේදීත් නොවෙනස් ව පවතී. නායකයෙක් ලෙස උන්වහන්සේ තුළ පැවති කළමනාකාරීත්වයට මීට වඩා නිදසුන් අවශ්‍ය නොවේ.**

සත් සතිය ආරම්භයේ සිට ම අවසාන බුද්ධ වචනය දක්වා උන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීමෙන් එය පැහැදිලි කරගත හැකි ය. සුජාතාව ලබාදුන් කිරිපිඬු දානය බත් පිඩු 49 ක් සකසා වැළඳීමේ ශක්තිය සති හතක් දක්වා ම ප්‍රමාණවත් වුණි. සත්සතිය යනු හුදෙක් කළගුණ සැලකීම පමණක් නොවූ අතර අනාගත ධර්ම ප්‍රචාරය සැලසුම් කළ කාලසීමාවයි.

ආයතනයක් හෝ පුද්ගල කණ්ඩායමක් මනාව මෙහෙයවා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නම් නිවැරැදි පූර්ව සැලසුමක් අවශ්‍යය. එසේ නොමැති වූ විට අතරමඟ සියල්ල නතර විය හැකිය. සත්සතිය පුරාවට ම උන්වහන්සේ සැලසුම් කළේ මේ සියල්ලයි. තමාට උපකාර කළ සොබා දහමට මුලින් ම කෘතගුණ සැලකූ උන්වහන්සේ මානවයාට නොමැකෙන පාඩමක් කියා දුන්හ. මඟදී හමුවන උපකට ධර්මය නොදෙසා තමන් වහන්සේ අරමුණු කරගත් පස්වග මහණුන්ම ඉලක්ක කොට ගැනීම පැසසිය යුත්තකි. නායකයකු නම් එවැනි දැක්මක් අත්‍යවශ්‍ය ය.

පස්වග මහණුන්ට ධර්මය දේශනා කිරීමේ දී ද කළමනාකරණ මූලධර්ම රැකි අයුරු උන්වහන්සේගේ දේශනාව තුළින් ම පැහැදිලිය. එනම් මෙහි දී වැදගත් ම ආදර්ශය වන්නේ කාල අරපිරිමැස් ම හා ආහාර සම්පත් අරපිරිමැස්මයි. පිණ්ඩපාතය සඳහා පස්නම එක් අවස්ථාවේ නොයවා තුන්නමකට ධර්මය දේශනා කරන අතර දෙනමක් පිණ්ඩපාතයේ වැඩියහ.

තවත් විටෙක දෙනමකට ධර්මය දෙසා ඇති අතර තුන්නමක් පිණ්ඩපාතයට යැවූහ. එම ආහාර දානය සියලු දෙනාම වැළඳූහ. ඉන් උන්වහන්සේ කාලය උපරිම ප්‍රයෝජනයෙහි යෙදවූ ආකාරයත් තෘෂ්ණාවෙන් අනවශ්‍ය ලෙස පරිභෝජන රටාව හැඩගස්වා නොගත් බවත් පැහැදිලිවේ. අවශ්‍යතාවය මත මිස තිබෙන සියල්ල අනවශ්‍ය ලෙස යොදා ගැනීම බුදුරදුන්ගේ ලක්ෂණය නොවූහ. එසේ උන්වහන්සේ සම්පත් හා කාලය මනාව යෙදවීම තුළ සසුන ශක්තිමත් ව ඇරඹීමට ශක්තිය ඇති කරගත්හ.

පළමු රහත් හැට නම අමතා සඳහන් කරන බුද්ධ අවවාදය සැලකිල්ලට ගැනීමේ දී පවා බුදුරදුන්ගේ ඉහත ගුණය මනාව හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම එහි දී පැහැදිලි වන්නේ මානව සම්පත් කළමනාකරණයයි.

දෙදෙනකු එක මග නොයෙන ලෙසත් බොහේ දෙනෙකුට හිතසුව පිණිස ගම් දනව්වල ගොස් ධර්මය ප්‍රචාරය කරන ලෙසත් හිතුමතේ ධර්මය නොදෙසා මුල මැද අග පැහැදිලිව කරුණු දේශනා කරන ලෙසත් පෙන්වා දුන්හ.

හැටනමකින් යුත් කණ්ඩායමක් තුළින් ඉතා කෙටිකාලයක දී උතුම් ධර්මය බොහෝ පිරිසකට ළඟාවූයේ මෙම ක්‍රියාමාර්ග නිසාවෙනි. අඩු ශ්‍රමයකින් වැඩි ඵලදායීතාවක් ඇති කිරීමෙහිලා බුද්ධ චරිතය මහඟු පූර්වාදර්ශයකි.

එසේ ම ඇතැම්විට කාර්යක්ෂම වූව ද ඒ තරමට ඵලදායීනොවන අවස්ථා සාමාන්‍ය ජීවිත තුළ දැකිය හැක. බුදුරදුන්ගේ ධර්ම ප්‍රචාරය එසේ නොවේ. මුල මැද අග අර්ථ සම්පන්න ව ප්‍රයෝජනවත් ලෙස එම කාර්ය ඉටු කිරීමට උන්වහන්සේ මාර්ගෝපදේශකත්වය ලබා දුනි.

අවවාදයෙන් පමණක් නොනැවතී එය ක්‍රියාවෙන් පවා උන්වහන්සේ ඔප්පු කර පෙන්වීය. බොහෝ නායකත්වයන් තුළ මෙය දැකිය නොහැකි දුර්ලභ කාරණයකි. තම ශිෂ්‍යයන් චාරිකාවෙහි යොදවා තමන් වහන්සේ ද උරුවේලාවට වැඩම කළ හ. ඉහළින් ආදර්ශය ලැබෙන වටපිටාවක පහළ ස්තර ඒ සඳහා නිරායාසයෙන් ම පෙළඹේ.

බුදුරදුන්ගේදින චරියාව ගෙන බලන විට ද කාල කළමනාකරණය ඉතා හොඳින් හඳුනාගත හැකිය. තමන්ගේ වටිනා කාලය ඒ ඒ ජනවර්ග හා ජීව කොටස්හි සුබ විහරණය සඳහා යෙදවූ අයුරු ඉතා ප්‍රශස්ත ය.

බුදුරදුන්ගේදින චරියාව කොටස් 05 කින් සමන්විත ය. තම දවස අන්‍යයන්ට උපකාරිවීමේ පහසුව තකා කාලය මෙලෙස බෙදා ගත්හ. එය මෙසේ ය.

පෙරවරු කිස – උදයවරුව මධ්‍යහ්න දක්වා උන්වහන්සේගේ ධර්ම ප්‍රචාරය සඳහා යෙදවීම.

පස්වරු කිස – තම ශ්‍රාවකයන්ට දහම් දෙසීම කමටහන් දීම තම කුටියට වී සමවත් සුවයෙන් සිටීම

පෙරයම් කිස – රාත්‍රියෙහි ප්‍රථම කාල සීමාව 6 සිට 10 දක්වා භික්ෂූන්ට ධර්ම දේශනා කිරීම සඳහා යෙදවීම.

මැදියම් කිස – රාත්‍රී 10 සිට අලුයම 02 දක්වා දෙවි බඹුන් සඳහා ධර්ම දේශනා කිරීම.

පැසුළුයම් කිස – අලුයම 2 සිට 06 දක්වා කාලය මෙය ද කොටස් 04 කින් යුතුවේ.

මෙලෙස බොහෝ පිරිසකට වැඩි සෙතක් සැලසෙන අයුරින් කාලය බෙදා වෙන් කරගත්හ. ආත්මාර්ථය වෙනුවට පරාර්ථය වෙනුවෙන් උන්වහන්සේ තම කාලය කැප කළහ.

තම උදාරතර අරමුණු සාධනය කිරීමෙහිලා සසුන්ගත වූ භික්ෂූන් වහන්සේ නිසි අවස්ථාවන්හි දී ඇගයීමට ලක් කිරීමට කටයුතු කළහ. එසේ ම ඔවුන් දිරිගැන්වීම් ලෙස තනතුරු ප්‍රදානය කළහ. දක්ෂ මානව සම්පත් කළමනාකරුවකු තුළ තිබිය යුතු එවන් ලක්ෂණ බුදුරදුන් තුළ නොඅඩුව තිබුණි. පුද්ගල ශක්තිය අගය කළා පමණක් නොව එයට වටිනාකමක් එකතු කළහ. තනතුරු යනු වගකීම් ලෙසත් එය ඉටුකළ හැකි පිරිස් තෝරා බේරා ගැනීමට උන්වහන්සේ අතිශයින් සමත් වූහ. ඒ තුළින් සංඝ නැමති සංස්ථාව බාධක ජයගනිමින් පවත්වා ගෙන යාමට උන්වහන්සේ සමත් වූහ.

අග්‍රඋපස්ථායක තනතුරට පත්කිරීම ම කෙතරම් ප්‍රයෝජනවත් ද යන්න පළමු ධර්ම සංගායනාවේ උන්වහන්සේ ඉටු කළ කාර්යභාරයෙන් ම වඩා පැහැදිලිය.

තනතුරු පිදීමේ දී හැකියාව පිළිබඳ මිස ඥතීත්වය හිතවත්කම් සැලකිල්ලට නොගත්හ. උපාලි හිමියන්ට විනයධර භික්ෂූන් අතර අග්‍රස්ථානය ලබාදීම මීට කදිම නිදසුනකි.

තනතුරට සුදුස්සකු නැතිනම් නුසුදුසු අය පත්කරනවාට වඩා පුටුව හිස්ව තැබීම වඩා සුදුසුයැයි පැවසීම ඉතා අගනේ ය. බුදුරදුන් කිසිවිටෙකත් සුදුසු නොවන කෙනෙකුට තනතුරු පිරිනැමුවේ නැත.

අන්‍ය මතයන්ට ඇහුම්කන් දෙමින් වඩා නිවැරැදි ලෙස තම සංස්ථාව පවත්වාගෙන යාමට උන්වහන්සේ වගබලා ගත්හ. ඕනෑම ආයතනයක යල්පැනගිය සංකල්ප හෝ නීති කාලයට අනුරූපව වෙනස්විය යුතු ය. එහි දී විශේෂඥ දැනුම පමණක් ප්‍රමාණවත් නොවන අතර දේශගුණික හා කාලගුණික සාධකයන් පවා සැලකිල්ලට ගත යුතු ය. ඊට අයත්වන කුඩා සහ අනු කුඩා කණ්ඩායම්වල සහය උපදෙස් ගරු කිරීම වැදගත් ය. බුද්ධ චරිතය පුරාවට ම මෙම ලක්ෂණය පැවතුණි.

එසේ ම මව්පියන්ගෙන් නො අසා දරුවන් පැවිදි නොකිරීමට සුද්ධෝදන රජුගේ ඉල්ලීම පිළිගැනීම, නානකඩය අනුදැන වදාරීමට විශාඛාවගේ ඉල්ලීම, එසේ ම කොසොල් රජුගේ හා බිම්බිසාර රජුගේ ඇතැම් ඉල්ලීම් පිළිගැනීම මත ශික්ෂා පැනවීම තුළින් බුදුරදුන්ගේ අන්‍යමතයන්ට ඇහුම්කන්දීම මොනවට පැහැදිලිය. වස් ශික්ෂාව සමාදන්වීමට භික්ෂූන්ට අනුදැන වදාළේ ද අන්‍ය ආගමික කණ්ඩායම් කළ චෝදනාවකට පිළිතුරු ලෙස ය. කණ්ඩායමක්, පිරිසක්, ආයතනයක් ලෙස ඉදිරි ගමනක් ඇතිවන්නේ එවිටය.

වර්ග, පාට, පක්ෂ, භේද නොතකා බුදුරදුන් යහපත් දෑ තම සංඝ සමාජයේ මෙන් ම පොදු ජනතාව උදෙසා යොදා ගැනීමට කටයුතු කළහ. ජෛනයන්ගේ පංච විරතිය පඤ්චශීලය ලෙස යොදා ගනිමින් මිනිස් ක්‍රියාවන් පාලනය කිරීමට අවස්ථාව උදා කර ගත්හ. පාලනය, සංයමය, ඉවසීම සෑම කාර්යකදීම විපුල ඵල ලැබීමට වැදගත් හේතුවකි. ඒ අරුතින් ගත්විට පඤ්චශීලයේ ප්‍රයෝජන අතිමහත් ය.

බුද්ධ පරිනිර්වාණය මෙන් ම ඒ මඟ තුළ සිදුවන සෑම ක්‍රියාකාරකමක් ම මනාව කළමනාකරණය වී ඇති ආකාරය ද ප්‍රශංසනීය ය. ඒ තුළින් ද නායකත්ව ලක්ෂණ මනාව පිළිබිඹු වේ. තමාගෙන් සසුන අවසන් නොවීමටත් අනාගත පරපුරට එය දායාද කරදීම සඳහා ධර්මය ගුරු තනතුරෙහි තබා ගැනීමට උපදෙස් දීම අගය කටයුතු ය.

අවසාන බුද්ධ වචනයෙන් පවා කියැවෙනුයේ කිසිවක් සදාකාලික නොවන නිසා සීමිත කාලය තුළ ක්‍රියාකාරකම් මනාව පාලනය කර යහපත් දේ හෙවත් කුසල් සම්පාදනය කළ යුතු බව ය. අකුසල් යනු ජීවිතයේ නොහැකියාවන් ය.

පුද්ගලයෙකුට නොහැකියාවන් තිබිය යුතු නැත. ඒ සඳහා පැහැදිලි දර්ශනයක් හා වැඩපිළිවෙලක් ඇත්නම් මනසින් එය කළමනාකරණය කරගනිමින් කළ හැකි විය යුතු ය. එපා, අයහපත් යැයි සඳහන් සියල්ලෙන් ඉවත්විය හැකිනම් එය මහත් පිනකි. ඒ සඳහා තමන්ට ලැබෙන සම්පත්, පහසුකම් හා දැනුම කාලයත් සමඟ සසඳ පවත්වා ගැනීම වැදගත් ය. සමස්ත බුද්ධ චරිතයෙන් පමණක් නොව බෝසත් චරිතයෙන් ගත හැකි පරම ආදර්ශය එයයි.

කොළඹ මහානාම විද්‍යාලයේ ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

# සියලු බුදුවරුන්ගේ අනුශාසනය

*සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා*
*සචිත්ත පරියෝදපනං ඒතං බුද්ධාන සාසනං*

**සියලු පව් නොකිරීම ද, කුසල් වැඩි දියුණු කිරීම ද, තමන්ගේ සිත පිරිසුදු කිරීම ද යන මෙය සියලු බුදුවරුන්ගේ ශාසනය හෙවත් අනුශාසනයයි.**





## ඇසළ අව අමවක පෝද

## දම් දෙසුම

**ධම්ම පදයේ බුද්ධ වග්ගයේ සඳහන් මෙම ගාථාව ඇතුළත් වන්නේ සියලු බුදු වරුන්ගේ ඕවාද ප්‍රාතිමෝක්ෂයටයි. “ඛන්ති පරමං තපො තිතික්ඛා” ආදී ගාථාවත් “අනූපවාදෙ අනුපඝාතෝ ” ආදී ගාථාවත් එම ඕවාද ප්‍රාතිමෝක්ෂයට අයත් ය.**

‘ඕවාද ප්‍රාතිමෝක්ෂය’ යනු සියලු බුදුරජාණන් වහන්සේලා ශ්‍රාවක සංඝයාට හික්මීමේ මාර්ගය වශයෙන් දෙසා වදාරණ සංක්ෂිප්ත දේශනාවයි.

දීර්ඝායුෂ්ක බුදුරජාණන් වහන්සේලාගේ ශාසනවල විනය පැනවීමක් සිදු නොවේ. ඒ නිසා උන්වහන්සේලා බුද්ධ ජීවිතය පුරාම සංඝයාගේ හික්මීම පිණිස විනය දේශනාවක් වශයෙන් දෙසන්නේ, අනුශාසනාවක් වශයෙන් පනවන්නේ මේ ඕවාද ප්‍රාතිමෝක්ෂය පමණි.


අපේ ගෞතම බුදුරජාණන් වහන්සේ බඳු අල්පායුෂ්ක බුදු වරුන්ගේ ශාසනවල විනය පැනවීම සිදුවෙයි. එහෙත් උන්වහන්සේලාත් විනය පනවනතුරු අවවාද වශයෙන් දෙසන්නේ මෙම ඕවාද ප්‍රාතිමෝක්ෂයයි. උදානට්ඨ කථා උපෝසථ සූත්‍ර වර්ණාව තුළින් ඒ බව පෙනේ.

අපේ බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ද බුද්ධත්වයෙන් මුල් විසිවස තුළ විනය පැනවීමක් සිදු නොවීය. එම කාලය තුළ උන්වහන්සේ අඩමසකට වරක් පොහෝ දිනවල සංඝයා රැස්කොට මේ ඕවාද ප්‍රාතිමෝක්ෂ දේශනාව පමණක් සිදු කළහ. එය බුදුවරුන් සංඝයා සමඟ පොහොය කිරීම ද වේ.

උදාන පාලියේ මෙන්ම අංගුත්තර අට්ඨක නිපාතයේ උපෝසථ සූත්‍රයේ සඳහන් වන පරිදි එක් පොහොය කරන දිනක ප්‍රාතිමෝක්ෂ දේශනාවට රැස් වූ භික්ෂූන් අතර දුස්සීල භික්ෂුවක් සිටීම නිසා බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා පොහොය කිරීම සඳහටම අත්හිටුවා වදාළහ. එහිදී උන්වහන්සේ වදාළේ “මහණෙනි අද පටන් කොට මම පොහොය නොකරමි. පාමොක් නොදෙසමි. තථාගතයන් වහන්සේලා අපිරිසිදු පිරිස් මැද පොහොය නොකරන්නාහ, පාමොක් නොදෙසන්නාහ. යන මේ කාරණය සිදුවිය නොහැක්කකි යනුවෙනි.

එතැන් පටන් සංඝයාට පොහොය කරන්නටත් ප්‍රාතිමෝක්ෂ දෙසන්නටත් අනුදැන වදාළහ. එසේ එහිදී දෙසන්නට නියම කළේ මෙම ඕවාද ප්‍රාතිමෝක්ෂ නොව ආණාප්‍රාතිමෝක්ෂයයි. එනම් බුදුරදුන් විසින් සංඝයාට පනවා වදාළ විනය ශික්ෂාපද සමූහයයි. ඒ අනුව එම ශික්ෂාපද සමූහය ද ‘ප්‍රාතිමෝක්ෂ’ නමින් හැඳින්වෙයි.

එතැන් පටන් භික්ෂූන්ට අවවාද කරන අවස්ථාවල “මහණෙනි ඉතා කුඩා වරදෙහි පවා බිය දකිමින් ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවරව වෙසෙන්නැයි” වදාළේ මේ විනය ප්‍රාතිමෝක්ෂය ගැනයි. එතැන් පටන් සංඝයා වහන්සේ සෑම අඩමසකට වරක්ම පොහොය සීමාවට රැස්ව මේ විනය ප්‍රාතිමෝක්ෂය දේශනා කරති. පොහොය කිරීම යනු එයයි. එයට බුදුවරු සහභාගී වන්නේ නැත.



අමරපුර මහා නිකායේ
උත්තරීතර මහානායක
අග්ගමහා පණ්ඩිත
**දෙඩම්පහළ**
**චන්දසිරි මහ නාහිමි**

මෙතෙක් කී කරුණු අනුව “සබ්බ පාපස්ස අකරණං ” ආදී ගාථාව බුද්ධ ශාසනයක සමස්ත පණිවුඩය සමස්ත අනුශාසනාව ගැබ් කොට ඉතා සංක්ෂිප්ත ව දේශනා කරනු ලබන සුවිශේෂී දේශනාවක් බව පැහැදිලි වේ.

මෙය දේශනා කරන බොහෝ දෙනා මෙහි අන්තිම පදය “ඒතං බුද්ධානු ශාසනං ” යනුවෙන් වරදවා කියති. එහි නිවැරැදි පදය වන්නේ “ ඒතං බුද්ධාන ශාසනං ”යනුවෙනි. මෙහි විග්‍රහය මෙය බුදුවරුන්ගේ ශාසනය යන්නයි. “ශාසනය” යනු ශික්ෂා මාර්ගයයි. ප්‍රතිපදාවයි. ධර්ම විනය යනු ද එයයි. ‘ශාසන’ යන්නෙහි ‘පණිවුඩය’ යන අර්ථයක් ද ඇත.

ඒ අනුව ශික්ෂණය සඳහා දෙන අවවාදය, අනුශාසනාව නැතහොත් මඟ පෙන්වීම ද ශාසන නම් වෙයි. “සබ්බ පාපස්ස අකරණං” නෙත්තිප්පකරණ පාලියේ සඳහන්වන පරිදි 'සබ්බ පාපයන්' ත්‍රිවිධ දුශ්චරිතයයි.

එනම් කාය දුශ්චරිත , වචී දුශ්චරිත සහ මනො දුශ්චරිත යි. අකුසල මුල් ක්‍රියාත්මක වීමේදී පුද්ගලයා සතර අගතියට යයි. පත්නොවියයුතු තැනට පත්වේ. එයින් හෙතෙම පාපයන් සිදු කරයි.

ඒ අගතීන් අතුරින් ඡන්දයෙන් අගතියට යාම, ලෝභය නිසා සිදුවේ.

දෝසාගතියට යාම ද්වේශය නිසා සිදු වේ.

භය මෝහයන්ගෙන් අගතියට යාම මෝහය නිසා සිදු වේ.

මේ මේ අකුසල මූලයන්ගෙන් අගතියට පත්ව පව් සිදු කරගැනීමේ ගමන වළකාලන ප්‍රතික්‍රියාවන් ද බුදු දහමෙහි දක්වා තිබේ.

ඒ අනුව ලෝභය අසුභානුස්සතියෙන් හෙවත් රූපාදී ධර්මයන්ගේ අසුභය මෙනෙහි කිරීමෙන් ප්‍රහානය වෙයි. ද්වේශය මෛත්‍රියෙන් ප්‍රහාණය වෙයි. මෝහය විදර්ශනා ප්‍රඥාවෙන් ප්‍රහාණය වෙයි.

එසේම ලෝභය උපේක්ෂාවෙන් ද ප්‍රහාණය වේ. එනම් අරමුණ පිළිබඳව සුභ වශයෙන් මෙනෙහි නොකොට මධ්‍යස්ථවීමෙන් ලෝභය සංසිඳේ. ධ්‍යාන මාර්ගයේදී කාමච්ඡන්ද නීවරණය උපේක්ෂා ධ්‍යානාංගයෙන් සංසිඳෙන බව දැක්වෙන්නේ මේ අනුව ය. එහි කාමච්ඡන්ද යනු ද ලෝභයයි.

ද්වේශය මෛත්‍රී කරුණා දෙකෙන් ද, මෝහය මුදිතාවෙන් ද දුරුවෙන බව දැක්වේ. මුදිතාව යනු ලෝකයාගේ දියුණුව සතුට දැක තමනුත් සතුටුවීමේ ගුණයයි. එය කළ හැක්කේ නුවණින් කල්පනා කරන අයකුට පමණි. ඒ නුවණ නැති කල ඒවා තමන්ට නැතිවීම ගැන හීන මානයට හෝ අනුන්ට තිබීම ගැන ඊර්ෂ්‍යාවට හෝ පත් වෙයි. මුදිතාවෙන් මෝහය දුරුවේ යැයි කීවේ එයයි. මෙසේ ලෝභ, ද්වේශ හා මෝහයන් මැඩපැවැත්වූ තැනැත්තාගේ පාපයට නැඹුරුවීම වළකයි. “සබ්බ පාපස්ස අකරණං” යනුවෙන් සියලු පව් නොකිරීම හෝ සියලු පවින් වැළකීම සිදු වන්නේ මේ ආකාරයෙනි.

“කුසලස්ස උපසම්පදා” මිත්‍යා අංග අට දුරුවන විට සම්‍යක් අංග අට සම්පූර්ණ වේ. ඒ අනුව සම්මා දිට්ඨි , සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මා සමාධි යන සම්‍යක් අංග අට හෙවත් යහපත් මාර්ග අංග අට සම්පූර්ණ කිරීම සම්පාදනය කිරීම අර්හත්වය සඳහා යන බෞද්ධ මාර්ගයේදී “කුසලස්ස උපසම්පදා” යනුවෙන් ගැනේ.

“සචිත්ත පරියොදපනං” යනු පෙර බුදුවරුන්ගේ පටන් පැවත එන මාර්ගය වැඩීමයි. “පරියොදපන” යනු පිරිසිදු කිරීමයි. ඒ අනුව තමාගේ සිත පිරිසිදු කිරීමේ ක්‍රම දෙකකි. පළමුවැන්න සමථ විදර්ශනා මාර්ගයෙන් නීවරණ විශ්කම්භන වශයෙන් ප්‍රහානය කොට සිත පිරිසිදු කිරීමයි. දෙවැන්න ආර්ය මාර්ගය වැඩීමෙන් අනුශය ධර්ම සහමුලින්ම උදුරා දැමීමයි.

සිත පිරිසිදුකරන ආර්ය මාර්ගයේ පින්වත් ඔබත් ගමන්කොට උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගෙන උතම් නිවනින් සැනසෙත්වා.

මීළඟ බුදුසරණ කලාපය ඇසළ අමාවක පෝ ද අගෝස්තු 07 සෙනසුරාද

# වස් ආරාධනය සහ වස් කාලය

**අවුරුද්දේ දෙළොස් මාසය ප්‍රධාන වශයෙන් සෘතු තුනකට බෙදේ. එනම්, හේමන්ත සෘතුව, ගිම්හාන සෘතුව වස්සාන සෘතුව යනුවෙනි.**

මෙහි වස්සාන සෘතුව ලෙස දැක්වෙන්නේ ඇසළ මස අවපෑළවිය පටන් ඉල් මස පුන් පොහොය දක්වා සාර මස් කාලයයි. බුදුන් වහන්සේ පහළ වූ භාරතය තුළ අදටත් ඉහත කී සෘතුවල ඒ ඒ කාර්යයන් ස්වභාවික වශයෙන් සිදුවෙනවා දැකගත හැකි ය.

වස්කාලය වනාහි වැසි වසින කාලයයි. අනෙකුත් සෘතු දෙකට වඩා වස්සාන සෘතුව තුළ එකදිගට වැසි ඇද හැලීම සිදුවේ.

ලොව්තුරු බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබ, පළමු මංගල ධර්ම දේශනය වූ දම්සක් පැවතුම් සූත්‍ර දේශනය බරණැස ඉසිපතනයේදී පස්වග මහණුන්හට දේශනා කරන්නට යෙදුණේ ද මෙකී වස්සාන සෘතුව ආරම්භ වන ඇසළ පුන් පොහෝ දිනකදීය. එසේ එම දේශනය සිදුකොට බුදුපියාණන් වහන්සේ පළමු වැසි සාර මස එහිම වැඩ විසූ සේක. මෙතැන් සිට බොහෝ කාලයක් යනතුරු වස් විසීමේ නීතියක් උන්වහන්සේ පනවා තිබුණේ නැත. එහෙත් ආවේණික ධර්මයක් ලෙස බුදුන් වහන්සේත්, රහතන් වහන්සේලාත් මුලදී ස්වභාවික පුරුද්දක් ලෙස වස් කාලයෙහි චාරිකාවේ නොගොස් එකම තැන වැඩ වාසය කළහ.

මෙසේ කල් ගතවත්ම ක්‍රමයෙන් භික්ෂු පිරිස වර්ධනය වීමෙන් අනතුරුව භික්ෂු පිරිසේ ගති පැවතුම්, සිරිත් විරිත් ආදිය ද වෙනස් වන්නට විය. ඒ අනුව වැසි කාලය තුළ දී ද ගම්, නියම්ගම් සැරිසරමින් ධර්මය ප්‍රචාරණය කරන්නට ද උන්වහන්සේලා කටයුතු කළ අතර, එය විවිධ ජනයාගේ දෝෂයට ලක්වන්නට විය.

ඒ හුදෙක් නිඝණ්ඨනාථ ආදී ශාස්තෘවරුන් මුල් කරගත් භක්තිකයන්ගෙනි. එයට ප්‍රධාන හේතුව වූයේ ඔවුන්ගේ ආගම සීමාන්තික අවිහිංසාවාදී දහමක් වීමයි. වැසිකාලය තුළ ඇවිදීමෙන් දලු ලා වැඩෙන කුඩා, කුඩා තණකොළ ආදී ශාක පත්‍ර විනාශ වීමත්, එය ප්‍රාණඝාතයක් හැටියටත් ඔවුන් අදහස් දැක්වූහ. තිරිසන් සතුන් පවා වැසි කාලයේ තම කූඩුවල, කැදලිවල සිටින නමුත් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක පිරිස තුළ එබන්දක් දක්නට නැත යයි විවිධ චෝදනා එල්ල කළහ.

බුදුදහම තුළ ගස්, කොළන් ආදියට පණ ඇතැයි පිළිගැනෙතත් සත්ත්වයන්ට මෙන් හිතක් ඇති බව නොපිළිගනියි. එසේ හෙයින් තණකොළ ආදී ගස්, පැළැටි වර්ග පෑගීම බුද්ධ ධර්මයේ හැටියට පාපයක් නොවේ. බුදුරජාණන් වහන්සේ ඒ මතය නොපිළිගනිතත් වස් කාලයෙහි එක් තැනකට වී වාසය කිරීම යහපත් බව පවසා ශික්ෂා පදයක් පනවන්නට යෙදුණි. මෙය උපසම්පන්න භික්ෂූන් හා සම්බන්ධ වූ ශික්ෂා පදයකි.

මෙම ශික්ෂා පදය පැනවීමෙන් පසුව මතු වූ ගැටලුව නම් කුමන කාලයක වස් විසීම සිදු කළ යුතු ද යන්නයි.

“අනුජානාමි භික්ඛවේ, වස්සානෙ වස්සං උපගන්තුං” යනුවෙන් වස්සාන සෘතුවෙහි වස් එළඹීමට මෙන්ම පෙර වස්, පසු වස් යනුවෙන් වස් විසීම් දෙකක් පෙන්වමින් අසවල් දිනයෙහි මෙසේ වස් සමාදන් විය හැකියැයි පෙන්වා වදාළහ.

වස් සමාදානය ඉතා වටිනා මෙන්ම අගනා උතුම් වූ විනය කර්මයකි.

වස් සමාදානය තුළ, වස් ආරාධනාව සුවිශේෂී වූවකි. දායක කාරකාදීන්ගේ ආරාධනාවක් ලැබුණත්, නොලැබුණත් සුදුසු ස්ථානයක් නොලැබීම් ආදී බාධාවක් නැතොත් භික්ෂූන් විසින් වස් විසිය යුතු ය. වස් ආරාධනා කරනු ලබන්නේ හුදෙක් දායක පින්වතුන්ගේ ප්‍රයෝජනය පිණිස ය.

මෙකල මෙන් නොව පෙර භික්ෂූන් වහන්සේ නිතර එක තැනක වාසය නොකළහ. අවුරුද්දේ වැඩි කාලයක් ධර්ම චාරිකාවට යෙදවූහ. එයින් දායක ඇත්තන්ට අවශ්‍ය වෙලාවට බණක් ඇසීමට, දනක් පූජා කිරීම ආදි ගැටලු ද මතුවිය. යම් ප්‍රදේශයක භික්ෂූන් වහන්සේලා වස් වසවා ගන්නට ලැබුණොත් සිව්පසයෙන් උපස්ථාන කිරීමෙන් දායක පක්ෂයට පින් සලසා ගැනීමටත්, යහපත සලසා ගැනීමටත් හැකි වන්නේ ය.

මෙහි දී ගිහි, පැවිදි යන දෙපිරිසම අතර අන්‍යොන්‍ය සහ සම්බන්ධතාවයක් ගොඩ නැගෙනවා, මෙන්ම සාමාන්‍ය කාලවලට වඩා මේ කාලය තුළ පින් පුරවා ගැනීමට ද නිරතුරුවම පුළුවනි. මෙසේ සීල, භාවනා දී ගුණධර්ම පිරීමෙන් නිතර කල් ගෙවන නිසා පුණ්‍ය කාලය ලෙස ද මෙම කාලය සම්මත වී තිබේ.

ඉහත කී වස් ආරාධනාව සඳහා පූජා කරනු ලබන පිරිකර අතරින් වැදගත් මෙන්ම ප්‍රධාන තැනක් හිමිවන්නේ වැසි සළුවටයි. අද වන විට වැසි සළුව වෙනුවට තුන් සිවුරට අයත් “අඳන සිවුර” බොහෝ තැන්වල භාවිත කරන බවක් දක්නට ලැබේ. එය වැරදි ක්‍රියා පිළිවෙතකි.

වැසි කාලයෙහි භික්ෂූන් වහන්සේ චාරිකාවේ නොයෙදුණු නමුත්, පිණ්ඩපාත ගමනාදියෙහි යෙදුනු භික්ෂූන් අතර නොතබා වැටෙන වැස්සෙන් තෙමී පීඩා විඳින්නට වූහ. මේ දුටු විශාඛා මහෝපාසිකාව බුදු රජාණන් වහන්සේ වෙත ගොස් ස්වාමීනි, මම ජීවිතාන්තය දක්වා සංඝයාට වැසි සළු පූදන්නට කැමැත්තෙමි'යි කීය.

ඊට අවසරදී මහණෙනි, වැසි සළු අනුදනිමි යැයි වැසි සළු නියම කළහ. මේ වැසි සළුව ද හැඳින්වෙන්නේ සිවුරක් ලෙස ය. නමුත් සඟල, දෙපොට සිවුරුවලට වඩා දිග පළලින් වැඩි ය. භාවිත කළ හැක්කේ වැසි සාර මස තුළ පමණ ය. මේ සිවුර කැපකරුවනට තමන්ම කියා හෝ පිළියෙල කරගත යුතු ය. එහෙත් සෑම කාලයක දී ම එය සෙවිය නොහැකි ය.

පුරාණයේ වස් ආරාධනාවක් සඳහා උපයෝගී කරගන්නා ලද්දේ වස් ගොටුවයි. වස්ගොටුව සකසනු ලබන්නේ විශාල ව සැදුණු පොල් ගෙඩියක් ගෙන බිඳ ඉන් ප්‍රමාණයෙක් විශාල පොල් බෑය ගෙන ඇතුළතින් නටුව පොල් බෑය ඇතුළට තැබෙන පරිදි දළුමුර නැතහොත් බුලත්කොළ වටේට අතුරා ගොටුවක් ආකාරයටයි.


මෙම ගොටුව පෙරළී නොයන සේ පට්ටල කර තැබීම සඳහා දරනුවක් ද සකස් කර ගනියි. එය ගොප් කොළ භාවිත කර සකස් කරනු ලබන අතර, අලංකාරය සඳහා දරනුව වටේට පිටතට විහිදෙන පරිදි ගොප් කොළ ඉතිරි කරයි.

එකී වස්ගොටුව මත වැසි සළුව තබා ආරාධනා කිරීම සිදු කරනු ලබයි. මෙම චාරිත්‍රය දිවයිනේ විවිධ ප්‍රදේශයන් හි, ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණික පරිදි සිදුකරනු ලබයි. වර්තමානය වන විට මෙම සාම්ප්‍රදායික ක්‍රමයන් තරමක් වෙනස් වී ඇති බව ද දක්නට ලැබේ.

මෙම ආරාධනාවේ දී භික්ෂූන් හට විහාරස්ථානයේ වස් සමාදන් වීම සඳහා ආරාධනා කරමින් වස් කාලය තුළ උන්වහන්සේලාට දානය පිළියෙළ කරදීම, අවශ්‍ය බෙහෙත් හේත් ආදී වෛද්‍ය ප්‍රතිකාරද, සෙනසුන් ද, අවශ්‍ය සිවුරු පිරිකර ද ලබා දෙමින් සුඛවිහරණයට අවැසි වටපිටාව සකස් කරදීම දායක කාරක ආදීන්ගේ පරම යුතුකමකි.

භික්ෂූන් වහන්සේ විසින් ද එකී සිවුපසයෙන් උවටැන් කරන දායක පින්වතුන්ට අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කොට වරදෙන් මුදවා ගැනීම ද පරම යුතුකමක් වන්නේ ය. මෙලෙසින් ගිහි, පැවිදි දෙපිරිසම අවබෝධයෙන් වස්සාන කාලය තුළ කටයුතු කරන්නේ නම්, පින් සිතුවිලි මනා කොට වර්ධනය වී සසර කෙළවර උතුම් වූ අමා නිවන ප්‍රත්‍යක්ෂ කර ගැනීම දුෂ්කර නොවන්නේ ම ය.

නැගෙනහිර හෝකන්දර බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථාන විහාරවාසී,
**බැද්දේවල ධම්මකිත්ති හිමි**



# වස්ත්‍රයෙන් අඩක් දුන් ස්ත්‍රියගේ කථාව



අග්ගමහා පණ්ඩිත
**පොල්වත්තේ**
**බුද්ධදත්ත මහ නාහිමි**

සිංහල ධජයෙන් උපලක්ෂිත වූ ශ්‍රීමත් සිංහල, ද්වීපයෙහි සිංහනාද ඇති බුදුරදුන්ගේ ධර්මය පිළිපදින භික්ෂු නමක් විය.

සිංහයෙක් මෙන් නිර්භීතව, තැතිගැනීම් නැතිව, සංකා නැතිව තුන්යම් රැයෙහි භාවනා කළ මෙතෙම පිඬු පිණිස ගියේ ය. එසේ යන භික්ෂු නම දුටු සොරෙක් උන්වහන්සේගේ පාත්‍ර සිවුරු ආදී සියල්ල පැහැරගෙන ගියේ ය. හෙතෙම කොළඅතු ඇඳගෙන සන්සුන් ලෙස ගමන් කළේ ය. කිසිවෙක් ඔහු හැඳින නො ගත්තේය.

එක් ස්තියක් දියට බැස නාද්දී වස්ත්‍ර රහිතව කොළ ඇඳගෙන යන උන්වහන්සේ දැන මෙසේ කීය. ස්වාමිනි ගොඩ තිබෙන වස්ත්‍රය දෙකට ඉරා භාගයක් ගත මැනව. ඉතිරි කොටස මට වන්නේ ය. ඒ කොටස හැඳගෙන තැති ගැනීම් නැතිව සැප සේ වැඩිය මැනැයි කීය.

ඒ කීම ඇසූ භික්ෂුනම ඒ වස්ත්‍රය මැදින් ඉරා කොටසක් හැඳගෙන කැමති තැනකට ගියේ ය. ඒ ස්ත්‍රිය ජීවිතාන්තය දක්වා සිට එයින් චුතව තව්තිසාවෙහි උපණී.

සිත් පහදවන අඟ පසඟින් යුත් මනා රූ ඇති මහත් ප්‍රභා ඇති ඈ උපන්නේ දෙව්විමන් තුනක් මැදය. අවට දෙව්විමන් තුනේ විසූ දේව පුත්‍රයෝ තිදෙන එහි අවුත් ඇය ලබා ගැනීම සඳහා කලහ කළහ. ඒ කාරණය දැනගත් දෙව්රජ එහි ගොස් කරුණු විචාළේ ය. ඒ දෙවිවරු තිදෙනා මෙසේ කීහ.

අපගේ විමන් මැද මේ දෙවඟන උදෙසා මේ කලහය පවතී නම් යමෙක් ඇයට වැඩි ආලය කෙරේ නම් ඔහුට ඈ අයිති වේවා'යි දෙව්රජ කී ය. ඉන් එක් දේව පුත්‍රයෙක් යම් සේ දිලිසෙන ගින්නේ ඇතුළතක් හෝ පිටතක් නැත්තේ ද, එමෙන් ම මම සිතින් ඇට ඇලී සිටිමියි කීය. දෙවෙනි දෙවියා යම් සේ මැටි හා ජලය මිශ්‍ර වූ විට අතරක් නොපෙනේ ද එමෙන් මම ඇයට ඇලී සිටිමියි කීය.


තෙවෙනියා යම් සේ කිරි හා ජලය මිශ්‍ර වූ වට එහි වෙනසක් නොපෙනේ ද එමෙන් මම ඇය කෙරෙහි ඇලී සිටිමි යි කීය. නමුත් ඕතොමෝ සතුටු සිතැතිව ඇඳිලි බැඳගෙන දෙව්රජ කරා අවුත් ඔහු පසු පස්සේ ගොස් ඔහුගේ භාර්යා බවට පත්වූවා ය. අර්ධ වස්ත්‍රයක් දුන් ඕ තොමෝ දිව්‍ය සම්පත් විඳ පසුව නිවන ද ලබන්නී ය.

අප්‍රමේය ගුණ ඇති බුදුරදුන් කෙරෙහි ද ද, කෙලෙස් මඩ දුරුකළ සංඝ නමැති කෙතෙහි ද දුන් අල්ප දෙයක් මහත් ඵල උපදවන්නේ යැයි දැන එහි දන් දිය යුතු ය.

වස්ත්‍රයෙන් අඩක් දුන් ඒ ස්ත්‍රිය බොහෝ කලක් මහත් දෙව්මිනිස් සම්පත් අනුභව කොට අනන්තයේදී භවත්‍රය නමැති සැඩ පහරින් එතෙරට ආර්ය සම්පත්තිය ද ලබන්නී ය.

**(ඉතා පැරැණි සිංහල බණ කතා ග්‍රන්ථයෙනි)**

# විහිළුව



**අත්තුඩාවේ**
**සිරි රාහුල මහ නා හිමි**

තිස්නමක් පමණ භික්ෂූන් වහන්සේ කැලණි මහ සෑය වැඳ අතුරු මඟකින් මහ මඟට පිවිසෙමින් සිටියහ.

ඒ අවස්ථාවේ ගිනි තැබූ හේනක දවස තිස්සේ වැඩ කොට වෙහෙස වී, දා ගිය දරමිටියක් හිස තබා ගෙන, දැලි වැකුණු වැරහැලි රෙදි කඩක් ඉන ඔතාගෙන වැහැරුණු සිරුරක් ඇති වයසක මිනිසෙක් ද ඒ මඟට පිවිසියේ ය.

මේ අසරණ මිනිසා දුටු සාමණේර හිමිවරු එකිනෙකා අමතා අර ඔබගේ පියා ය, සුළු පියා ය, මහප්පාය, සීයා ය කියා විහිළු කරන්නට වූහ. අවසන ඔබගේ නම කුමක්දැයි කියාත් ඇසූහ.

මේ කතා ඇසීමෙන් දෙම්නස් වූ මහලු මිනිසා දර මිටිය බිම දැම්මේ ය. එහි සිටි වැඩිමහලු හිමි නමට ටිකක් නතරවනු මැනවැයි කීයේ ය. රෙදි කඩමල්ල හොඳට ඇඳගෙන තෙරණුවන්ට පසඟ පිහිටුවා වැන්දේ ය. සාමණේරවරු ඒ අවස්ථාවේදී වට වී විහිළු කළහ.

වයස්ගත මහල්ලා මෙසේ ද කීයේ ය.

මට විහිළු කරන ඔබවහන්සේලා මෙපමණකින් සිවුර පෙරවූ තරමින් මහණ කම සම්පූර්ණ යැයි නො සිතනු මැනවි. ඔබ වහන්සේලා කළ යුතු කටයුතු මෙතෙක් අසම්පූර්ණ ය.

හිමිවරුනි, මම මුල දී ඔබවහන්සේලා වැනි ශ්‍රමණයෙක් වීමි. ඔබ වහන්සේලාට සිත එකඟ කිරීම් මාත්‍රයකුදු නැත.එකල මම මහර්ධි ඇත්තෙක් වීමි. අහස පොළොව කෙළෙමි. පොළොව අහස කෙළෙමි. දුර තැන ළං කළෙමි. ළඟ දුර කළෙමි. ක්ෂණයකින් සක්වල දහසක් විනිවිද ගියෙමි.

දැන් වඳුරකුගේ වැනි මේ අත්වලින් එදා සඳ හිරු පිරි මැදීමි. සඳ හිරු පා පුටුව කොට හුන්නෙමි. එවැනි වූ මාගේ ඍද්ධිය ප්‍රමාදය නිසා විනාශ විය. අන්‍යයෝ ද මා මෙන් පමාවෙන් ව්‍යසනයට පත්වෙති. හිමිවරුනි මා අරමුණු කොට අප්‍රමාද වෙත්වායි අවවාද කළේ ය.

ඒ කතාව ඇසීමෙන් සංවේගයට පත් තිස් නමක් භික්ෂූහු විදසුන් වඩා රහත් වූහ. (විභංග අටුවාව)

**(අටුවා රසකතා ග්‍රන්ථයෙනි)**

# අංගුත්තර නිකාය 1 - විරියාරම්භ වර්ගය අංක 07

**අනුක්‍රමික සූත්‍ර අංකය - 61**
**විරියාරම්භ සූත්‍රය**

මහණෙනි, යමක් හේතුකොටගෙන නූපන්නාවූ කුසල් දහම් ඉපදීමටත්, උපන්නාවූ අකුසල් දහම් පිරිහීමටත් හේතුවන වීර්යාරම්භය වැනි අන් එක දහමකුදු මම නොදක්මි. මහණෙනි, පටන්ගන්නා ලද වීර්යය ඇත්තහුට නූපන්නාවූ කුසල් දහම් උපදිත්. උපන්නාවූ අකුසල් දහම් පිරිහෙත්.

**අනුක්‍රමික සූත්‍ර අංකය - 62**
**මහිච්ඡ සූත්‍රය (සෑහීමකට පත්නොවන)**

මහණෙනි, නූපන්නාවූ අකුසල දහම් ඉපදීමටත් උපන් කුසල් දහම් පිරිහීමටත් හේතුවන මේ මහේච්ඡතාව (මහත් ආසාව) හා සමාන අන් එක දහමකුදු මම නොදක්මි. මහණෙනි, මහේච්ඡ පුද්ගලයාට නූපන් අකුසල දහම් උපදියි. උපන් කුසල් දහම් පිරිහෙයි.

**අනුක්‍රමික සූත්‍ර අංකය - 63**
**අප්පිච්ඡ සූත්‍රය (අලෝභි බව)**

මහණෙනි, යමක් හේතුකොට ගෙන නූපන්නා වූ ද කුසල ධර්මයෝ උපදිත් නම්, උපන්නා වූ අකුසල ධර්මයෝ පිරිහෙත් නම් අල්පේච්ඡතාව (ආසා අඩුබව) බඳු අන් එක ධර්මයකුදු මම නොදක්මි. මහණෙනි, අල්පේච්ඡයා හට නූපන්නාවූ කුසල ධර්මයෝ උපදිත් උපන්නාවූ ද අකුසල ධර්මයෝ පිරිහෙත්.

(ඉච්ඡා (ආශාව) සතරෙකි.

**අනිච්ඡතා - තමන් ලැබූ ලාභයෙහි නොසෑහී අනුන් ලැබූ දේට (ඉක්මවා) ආසා කිරීම.**

පාපිච්ඡතා – පාප ඉච්ඡාව, පිළිගැනීමෙහි පවිටු ආසාව එකම කැවුම් බඳුනෙන් බෙදූ, තමා ලැබූ කැවුමෙහි අඩු පාඩු දැකීම. (කුඩාය, පිළිස්සීම ආදී)

මහිච්ඡතා – ලද දෙයින් සතුටු නොවන අධික ආසා ඇති බව. මේ සඳහා නැතිගුණ පෙන්වමින් බොහෝ පවුද කරගනී. මහත් ලාභ පැතීම.

අප්පිච්ඡතා – ආසා අඩුබව, ලදදෙයින් සතුටුවන, පිළිගැනීමෙහි පමණ දන්නා පවත්නා ගුණ සඟවන ස්වභාවය, උදා. මහරහතන් වහන්සේලා. (අටුවා ඇසුරෙනි)

**අනුක්‍රමික සූත්‍ර අංකය - 64**
**අසන්තුට්ඨ සූත්‍රය**

මහණෙනි, යම් ලද දෙයින් සතුටු නොවන බවක් හේතු කොටගෙන පෙර නූපන්නා වූ අකුසල ධර්මයෝ උපදිත් නම් උපන්නා වූ කුසල ධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි ලෝභය වැනි අන් එක ධර්මයකුදු මම නොදක්මි. මහිණෙනි, ලද දෙයකින් සතුටු නොවන්නාහට (අසන්තුට්ඨ) නූපන්නාවූද අකුසල ධර්මයෝ උපදිත් උපන්නා වූ කුසල ධර්මයෝ පිරිහෙත්.

**අනුක්‍රමික සූත්‍ර අංකය - 65**
**සන්තුට්ඨි සූත්‍රය (සතුටු බව)**

මහණෙනි, යමක් හේතුකොට ගෙන නූපන්නාවූද කුසල ධර්මයෝ උපදිත් නම්, උපන්නාවූ අකුසල ධර්මයෝ පිරිහෙත් නම් මහණෙනි, ලද දෙයින් සතුටු බව (අලෝභය) බඳු අන් එක ධර්මයකුදු මම නොදක්මි. මහණෙනි, ලද දෙයින් සතුටු වන්නා හට (සන්තුට්ඨී) නූපන්නා වූ කුසල ධර්මයෝ ද උපදිත්, උපන්නාවූද අකුසල ධර්මයෝ පිරිහෙත්.

**උපකාරක අටුවා සටහන්**

සන්තුට්ඨිකා යනු මෙහි අලෝභ සංඛ්‍යාත සතුටයි. (මෙසේ සතුටුවන පුද්ගලයකු ඇසුරු කරන, භාජනය කරන, ආශ්‍රය කරන තැනැත්තාට ද මේ සතුට සමීප වේ.) මෙහිලා ත්‍රිවිධ සතුටක් ඇත. ඒවා ලැබීම් හෙවත් ප්‍රත්‍යය (සිවුපසය) මුල් කොට වෙන් වෙන් වශයෙන් දක්වති.

**යථාලාභ සන්තෝෂය**

වටිනා හෝ නොවටිනා ප්‍රත්‍යය ලැබුණු විට එයින් සතුටු වීම. අනෙකක් නොපැතීම.

යථාබල සන්තෝෂය

පියවියෙන් කය දුබල වූයේ හෝ ලෙඩ වූයේ හෝ වටිනා ගරු සිවුරක් ලැබ පොරවන්නේ වෙහෙස කර වේ ද එය සලකා සහවාසා භික්ෂුවක් සමඟ එය මාරුකොට ගෙන නොවටිනා ලඝු සිවුරක් ලැබ එයින් සතුටු වීම මෙයින් අදහස් වේ.

යථා සාරුප්‍ය සන්තෝෂය මහත් වටිනා ප්‍රත්‍යයක් (සිවුපසයෙන් එකක් හෝ එයට වැඩි) ලැබ මෙය වටින්නේ මට නොව වැඩිහිටියකුට බහුශ්‍රැතයකුට ගිලන් අයකුට, අල්ප ලාභියෙකුට ආදී වශයෙන් සලකා එවැන්නකුට පිරිනමා තමා ස්වල්ප දැයකින් යැපෙමින් ලබන සතුට මෙහි අදහස් කෙරේ.

**අනුක්‍රමික සූත්‍ර අංකය - 66**
**අයොනිසොමනසිකාර සූත්‍රය**

මහණෙනි, යමක් හේතුකොට ගෙන නූපන්නාවූ ද අකුසල ධර්මයෝ උපදිත් නම්, උපන්නාවූ ද කුසල ධර්මයෝ පිරිහෙත් නම්, මහණෙනි, නුනුවණින් මෙනෙහි කිරීම අයොනිසො මනසිකාරය) වැනි අන් එක ධර්මයකුදු මම නොදක්මි. මහණෙනි, නුනුවණින් මෙනෙහි කරන්නා හට නූපන්නාවූද අකුසල ධර්මයෝ උපදිත්. උපන්නා වූ ද කුසල ධර්මයෝ පිරිහෙත්.

ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තන මණ්ඩලයේ ලේකම්
(බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව)
**කේ.කේ. සුගතපාල**

# හින්දු ජන සම්මත හීන කුලයක උපන් කුලීන මිනිසා

**කුලවතුන්ගේ නොයෙක් වධ හිංසනයන්ගෙන් කුලහීනයෝ ගැහැට වින්දහ. සමාජ තත්ත්වයන් අභිමුඛයේ කුලීනයන්ට හිමි වූයේ අහිමි වීම පමණි. කුලවතුන්ගේ ක්‍රියා කලාපය දෙස බලා සිටීම වරදක් විය. එම වරදට ලද ප්‍රතිවිපාකය වූයේ කුලීනයන්ට තම ශරීරයේ අංග අහිමි වීම යි. එකම මිනිස් ප්‍රජාවක් තුළ උපත ලබා කුලවතුන් යැයි පළඳා ගත් වෙස් මුහුණින් ආරෝපණය වී සමාජයේ තවත් පිරිසක් තලා පෙළා පීඩාවට ලක් කරමින් සාහසික ලෙස සමාජය බිඳහෙළන යුගයක් මෙහිදී ඇරඹිණි. භාරතයේ සෑම ප්‍රාන්තයක ම ඇති කසළ ඉවත් කිරීම, වැසිකිළි සුද්ධ කිරීම, මළ මිණී ඉවත් කිරීම කුලහීනයන් අතින් සිදු විය. එහෙත් ඔවුන් සමාජයේ එළිමහනේ ගමන් කරන්නේ නම් කෙළ ගැසීමට භාජනයක් ගෙලෙහි එල්ලා ගත යුතු අතර, ඔවුන්ගේ පතුල් සලකුණු මැකී යාමට ඉදලක් වැනි උපකරණයක් පසුපසින් ඇදගෙන යා යුතුව පැවැතුණි. මෙවන් සමාජ වපසරියක අම්බෙඩ්කාර් පහළවීම ඉන්දීය කුලහීන සමාජයට මහත් අස්වැසිල්ලක් විය. ඒ අනුව ඉන්දීය කුලහීන සමාජයේ පැවැති දුක්ඛිත තත්ත්වයට විසඳුමක් සෙවීමට මූලිකත්වය ගැනීමට අම්බෙඩ්කාර්තුමාට සිදු විය.**

**නා පැහැදුණු පුද්ගලයන් පැහැදීම සඳහා බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළ සේක. හිම්රාවෝ රාම්ජි අම්බෙඩ්කාර්තුමා ද එම ආදර්ශය ඔස්සේ ගමන් අරඹමින් තම අරමුණු සාර්ථක කර ගැනීම උදෙසා ඉන්දීය ජනයාගේ ප්‍රසාදය දිනා ගැනීමට අප්‍රතිහත ධෛර්යයක් දරන්නට විය. නොයෙක් සත්‍යග්‍රහ, පෙළපාලි සිදු කරන්නට විය.**

සිද්ධාර්ථ කුමාරෝත්පත්තියෙන් වසර 2500 පසුව එනම්, ක්‍රි.ව. 1891 දී හිම්රාවො රාම්ජි අම්බෙඩ්කාර් ඉන්දියාවේ හින්දු භක්තිකයකු වශයෙන් උපත ලැබී ය. එම උප්පත්ති සමයේ හින්දු ජන සමාජය කුල ක්‍රමය යටතේ බෙදී පැවතුණි. උපලේඛන කුල ක්‍රමයට අනුව මොහු අයත් වූයේ 'කුලහීන' ජන කොට්ඨාසයට ය. පසු කාලයේ දී මේ කුලය 'හරිජන' නමින් මහත්මා ගාන්ධිතුමා හඳුන්වා ඇත.

ඉන්දියාව පුරාණයේ සිට ම දැඩිව කුලවාදයෙන් බෙදු ගත් සමාජයක් විය. ඒ බව පුරාණ වෛදික සාහිත්‍යය ග්‍රන්ථ මඟින් ද පැහැදිලි වේ. සමාජය කොටස් සතරකට බෙදු ශුද්‍ර නමින් පහත් කුලහීනයන් වශයෙන් ජන කොටසක් නිර්මාණය කර ඔවුන්ට සමාජ අයිතිවාසිකම් අහිමි කරන්නට විය. එහෙත් මෙම කුලවාදය නමැති කඩතොලුවලට මුවා වී සමාජයේ අතලොස්සක් පමණක් තම සුඛ විහරණය සඳහා විශාල පිරිසකගේ මූලික අයිතිවාසිකම් උදුරා ගත්හ. එහිදී අධ්‍යාපනික නිදහස, ආගමික නිදහස, චින්තනමය නිදහස වශයෙන් කිසිවකට අවසරයක් නොවීය.

පුරාණයේ පැවති පහත් කුලභේදය වර්තමාන ඉන්දීය ජන සමාජය තුළ ද ඉස්මතු කර පෙන්වීමට උත්සාහ දැරීම මෙහි ඇති කනගාටුදායක තත්ත්වයකි.

අම්බෙඩ්කාර්තුමා උපත ලැබූ සමයේ ද මෙම කුල ක්‍රමය ඉන්දියාවේ තදින් ම ව්‍යාප්තව පැවති අතර, එහි බලපෑම ද මහත් විය. කුලවතුන්ගේ නොයෙක් වධ හිංසනයන්ගෙන් කුලහීනයෝ ගැහැට වින්දහ. සමාජ තත්ත්වයන් අභිමුඛයේ කුලීනයන්ට හිමි වූයේ අහිමි වීම පමණි. කුලවතුන්ගේ ක්‍රියා කලාපය දෙස බලා සිටීම වරදක් විය. එම වරදට ලද ප්‍රතිවිපාකය වූයේ කුලීනයන්ට තම ශරීරයේ අංග අහිමි වීම යි. එකම මිනිස් ප්‍රජාවක් තුළ උපත ලබා කුලවතුන් යැයි පළඳා ගත් වෙස් මුහුණින් ආරෝපණය වී සමාජයේ තවත් පිරිසක් තලා පෙළා පීඩාවට ලක් කරමින් සාහසික ලෙස සමාජය බිඳහෙළන යුගයක් මෙහිදී ඇරඹිණි.

භාරතයේ සෑම ප්‍රාන්තයක ම ඇති කසළ ඉවත් කිරීම, වැසිකිළි සුද්ධ කිරීම, මළ මිණී ඉවත් කිරීම කුලහීනයන් අතින් සිදු විය. එහෙත් ඔවුන් සමාජයේ එළිමහනේ ගමන් කරන්නේ නම් කෙළ ගැසීමට භාජනයක් ගෙලෙහි එල්ලා ගත යුතු අතර, ඔවුන්ගේ පතුල් සලකුණු මැකී යාමට ඉදලක් වැනි උපකරණයක් පසුපසින් ඇදගෙන යා යුතුව පැවැතුණි. මෙවන් සමාජ වපසරියක අම්බෙඩ්කාර් පහළවීම ඉන්දීය කුලහීන සමාජයට මහත් අස්වැසිල්ලක් විය.

ඒ අනුව ඉන්දීය කුලහීන සමාජයේ පැවැති දුක්ඛිත තත්ත්වයට විසඳුමක් සෙවීමට මූලිකත්වය ගැනීමට අම්බෙඩ්කාර්තුමාට සිදු විය. එහිදී ඉන්දීය සමාජ ක්‍රමය කුමක් පදනම් කර ගෙන මෙවැනි සමාජ අසාධාරණකම්වලට යොමු වූයේ ද යන්න පිළිබඳ ඔහුට අවබෝධයක් ලබා ගත හැකි වූයේ ය.




හින්දු දහමේ පෙන්වා දෙන වර්ණාශ්‍රම ධර්ම එයට මූලික ම පදනුගතික සාධකය වූ බව එහිදී ඔහුට පසක් විය. මෙම තත්ත්වය පදනම් කරගෙන හින්දු ජනයා, තම සහෝදර ජනතාව පීඩාවට පත් කර ඔවුන් සමාජයේ ඉහළින් වැජඹීමත් පුහුණු මානයෙන් ජීවත්වීමට උත්සාහ දැරීමත් ධ්වනිත වේ.

මෙවැනි සමාජ ක්‍රමයට අම්බෙඩ්කාර් විරුද්ධ විය. ඒ බව ජර්මනියට ගොස් රහසේ සංස්කෘත ඉගෙනගෙන බමුණන් ඉදිරියේ සංස්කෘත භාෂාවෙන් කළ ප්‍රකාශයෙන් විශද වේ. "මූකනායක" පුවත්පතෙහි එම කියමන මෙසේ සඳහන් වේ. "මේ රට අසමානතාවයේ නිවාසස්ථානය යි. බලය හෝ ඥානය නොමැතිව බ්‍රාහ්මණ නොව පීඩිත පන්තිවලට කිසි ලෙසකත් ප්‍රගතියක් ලැබිය නොහැක වශයෙනි.

අම්බෙඩ්කාර්තුමා ස්වකීය සමාජ ක්‍රමය වටහා ගත් දිළිඳු කුලයෙහි උපන්නෙකි. නොයෙක් ගැහැට හමුවේ නොසැලුණු ඔහු ඉන් උගත් පාඩම වූයේ, මෙයින් මිදීමට හින්දු දහම අත්හැරීම යුතු බව ය. ඒ සමගම මිනිසාට තම දුක්ඛ දෝමනස්සයන් ප්‍රකාශ කිරීමට ආගමක් අවශ්‍ය බව ද ඔහුට වැටහී ගියේ ය. ඒ අනුව හින්දු ආගම හැර තම වර්ගයාට පිළිගත හැකි ආගමක් දර්ශනයක් ගැන මෙතුමාගේ අවධානය යොමු විය. ඒ තමා වෙනුවෙන් නොව දුක්ඛිත කුලහීනයා වෙනුවෙන් ය.

මේ වකවානුව වන විට අම්බෙඩ්කාර්තුමා තිස් ලක්ෂයක් පමණ වූ කුල හීනයන්ගේ වීරයා බවට පත් වී සිටියේ ය. මක්නිසා ද යත් කුලහීනයන්ගේ දුක්ඛිත ජීවන තත්ත්වය වෙනුවෙන් ඔවුන්ගේ අසාධාරණකම් සඳහා කතා කිරීම හා පෙනී සිටීම හේතු කොට ගෙන ය.

උපන් ද සිට මිරිකෙමින් තිබූ දුක්ඛිත ඉන්දීය ජීවිත වෙනුවෙන් කෙ තරම් ඉල්ලීම් කළ ද බ්‍රාහ්මණ හින්දු වැඩවසම්වාදය ද, 1930 දශකය වන විට මතුව සිටි ඊනියා නායකකාරකාදීන් ද භීතියට පත්වන ඓතිහාසික යෝජනාවක් ක්‍රි.ව. 1935 ඔක්තෝම්බර් 13 දින මහාරාෂ්ටයේ නාසික් හි යෙවෝලා ප්‍රදේශයේ පැවති පීඩිත පන්ති නායක සමුලුවේ දී සම්මත කර ගැනීමට රාම්ජි වීරයාට හැකි විය. එනම්, "මේ සියලු සත්‍යග්‍රහ සටන් නවතා දමා අපට සුදුසු ආගමක් නිර්මාණයකර ගන්න යන්නයි"

මේ යෝජනාව සමස්ත දලිත් විමුක්ති ව්‍යාපාරය පුරාම පැතිර යන්නට විය. මේත් සමඟ ම අම්බෙඩ්කාර්ගේ කුලහීනයන් මුදවා ගැනීමේ ව්‍යාපාරය ඉන්දීය සමාජයේ අවධානයට ලක්වන්නට වීමෙන් නොයෙක් පිරිස් ඔහුගෙන් විවිධ ප්‍රශ්න නඟන්නට විය. එනම්, "කුල පීඩිත පන්තිය සිය ආගම වෙනස් කිරීමෙන් දිනා ගන්නට බලාපොරොත්තු වන්නේ කුමක් ද? වශයෙන් ය. එහිදී ඔහුගේ පිළිතුර වූයේ "ස්වරාජ්‍ය මඟින් ඉන්දියාව දිනා ගන්නේ කුමක් ද? ඉන්දියාවට ස්වරාජ්‍යය යම් තරමකට අවශ්‍ය වන්නේ ද එපමණකට ම කුලහීන ජනයාට ආගම වෙනස් කිරීම අවශ්‍ය වෙයි.

මෙම ව්‍යාපාර දෙකෙහි ම යටින් දිවෙන චේතනාව වනුයේ නිදහස ලැබීමේ අභිලාෂ යයි" යන්න යි.

තම සරණට ආගමක් අවශ්‍ය වුව ද ඒ වන විට ඉන්දියාවේ හින්දු ආගම හැර වෙනත් ආගම් කිහිපයක් පැවැති අතර එයින් කුමන ආගමක් තෝරා ගන්නේ ද යන්න පිළිබඳව අම්බෙඩ්කාර්තුමාට ගැටලුවක් විය.

ඒ කුලහීන ජනයාගේ අයිතිවාසිකම් දිනා ගනිමින් නිදහසේ ජීවත් වීම ඔවුන්ගේ මූලික අභිප්‍රාය වූ නිසා ය. ඒ වන විට ඉන්දියාවේ පැවැති මුස්ලිම්, සීක්, බෞද්ධ, ක්‍රිස්තියානි ආගම් තම ආගම් වැළඳගන්නා ලෙස ඔහුට ආරාධනා කළහ. මේ අවස්ථාවේ හින්දුවරුන් ද නම්‍යශීලී ප්‍රතිපත්තියක් කුලහීන ජනයාට යොමු කරන්නට විය. එහෙත් මෙය රැවටීමක් බව තේරුම් ගත් අම්බෙඩ්කාර් තම ව්‍යාපාරය තවත් උද්යෝගීමත් ලෙස ඉදිරියට කරගෙන ගියේ ය.

අම්බෙඩ්කාර්තුමාගේ ජීවිතයට නව ආලෝකයක් උදා වූයේ බුදු දහමේ ඉගැන්වීම් අධ්‍යයනයත් සමඟ ය. බෞද්ධ දර්ශනය අධ්‍යයනය කිරීමට මෙතුමාට අවකාශය ලැබෙනුයේ කේ.ඒ. කෙලුස්කාර් විසින් රචිත "බුදුන්ගේ ජීවිතය" නමැති කෘතිය මඟින් ය. මෙම කෘතිය ක්‍රි.ව. 1907 විශ්වවිද්‍යාල ප්‍රවේශයත් සමඟ ඔහු සතු වූ ග්‍රන්ථයකි. බොහෝ පොතපත පරිශීලනය කළ මෙතුමාට මෙය ඉතා අගනා ග්‍රන්ථයක් විය.



ගෞරව ශාස්ත්‍රවේදී
**බෝගහවැව ආනන්ද විපුලසිරි හිමි**

# මල්වතු අස්ගිරි උභය මහා විහාරයීය උපසම්පදවේ අතීත කථාව

05

**වැලිවිට අසරණ සරණ ශ්‍රී සරණංකර සංඝරාජ මා හිමියන්ගේ 323 වන ජන්ම සංවත්සරය, 243 වන අනුස්මරණය හා මහා විහාරවංශික ස්‍යාමෝපසම්පදාවට වසර 268ක් සම්පූර්ණ වීම නිමිත්තෙනි.**

රාජ්‍ය වර්ෂ 1762 දී තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත නාහිමියන් මල්වතු විහාරයේ ද, උරුලෑවත්තේ ධම්මසිද්ධි හිමියන් අස්ගිරි විහාරයේ මහානායක පදවියට පත්කොට අස්ගිරි ගෙඩිගේ විහාරයේ පොහොය සීමාව ද සම්මත කිරීමෙන් අනතුරුව. 1765 දී වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ට උපාධ්‍යාය ධුරයට පත් කළහ. සිංහල භික්ෂූන්ගේ ප්‍රධානත්වයෙන් මල්වතු අස්ගිරි උපසම්පදාව වාර්ෂිකව පැවැත් වීමටත් අනතුරුව, මල්වතු අස්ගිරි උභය මහා විහාරයේම අනුනායක පදිවිය හා කාරක පදවි පත්කොට ලක්දිව විහාරස්ථාන 2400 බැගින් උභය විහාරයටම පිරිනමා යම් කිසි දවසක මල්වතු අස්ගිරි විහාර දෙකෙන් එකක උපසම්පදාව නැති උවහොත් අනික් විහාරයෙන් ගෙන්වා උපසම්දාව පිහිටුවමින් සම්බුද්ධ ශාසනය පැවැත්වීමට කටයුතු සැලැස්වීම නිසාම වසර 268 ක් මුළුල්ලේ අද දක්වාම මල්වතු අස්ගිරි උභය මහා විහාර මගින් උපසම්පදාව සහිත ශාසනික කටයුතු පවත්වාගෙන ඒම සකල ලෝක ජනතාවගේම අපමණ සතුටට හේතු වූ වකි.

එතැන්පටන් උඩ පහත දෙරටම සිය ගණන් සාමණේරවරුන් ඇති වූ අතර, ඒ සියලු දෙනාම මල්වතු මහා විහාරයට පැමිණ උපසම්පදාව ලබා ස්වකීය විහාරස්ථාන මුල්කොට සුවිශාල අධ්‍යාපන, ආගමික, ජාතික සේවාවන් සිදු කිරීමට පටන් ගත්හ.

මල්වතු මහා විහාරයේ අනාගත පැවැත්ම සඳහා අඛණ්ඩව කටයුතු කරගෙන යාමට සංඝරාජ මාහිමියන්ගේ ශිෂ්‍යයන් අතුරින් තිබ්බටුවාවේ ශ්‍රී බුද්ධරක්ඛිත මහා නාහිමි, දරමිටිපොල ධම්මරක්ඛිත මහානාහිමි, ගිණිගත්පිටියේ සංඝරක්ඛිත හිමි, වැරසර රඹුක්වැල්ලේ ධම්මරක්ඛිත අනුනාහිමි, මොරතොට ධම්මක්ඛන්ධ මහානාහිමි, පොල්පිතිගම ශ්‍රී සිද්ධාර්ථ නාහිමි, හුරීකඩුවේ ශ්‍රී සෝභිත නාහිමි, කොටිකාපොල ශ්‍රී රතනජෝති අනුනාහිමි, කඩුවෙල සෝභිත හිමි, ගම්පහේ සුමංගල හිමි, ඊරිමින්නේ විපස්සි නාහිමි, ඇගල්ලේ ඉන්දජෝති හිමි, කොබ්බෑකඩුවේ ශ්‍රී නිවාස කුඩා හිමි, වැලිවිට සරණංකර කුඩා හිමි ඇතුළු ශිෂ්‍ය පිරිස මුල්කොට මල්වතු මහා විහාරයානුබද්ධව ද, මැදවල ආනන්ද හිමි මැදවල ආදී විහාර ද, දෙහිගස්පේ අත්ථදස්සිහිමි අනුරාධපුරයේ රුවන්වැලි සෑය, මිහින්තලය හා කුරුණෑගල සත්කෝරළයේ කළුන්දෑව, මුතුගල, ආදී විහාරත්, කැලණිය ආදී විහාර ද ප්‍රතිසංස්කරණය කරමින් වැඩිදියුණු කළහ.



සෝමවති රජමහා විහාරාධිපති
මහා විහාරවංශික ස්‍යාමෝපාලි
මහා නිකායේ
මල්වතු මහා විහාර පාර්ශ්වයේ
වැඩබලන ලේඛකාධිකාරි
ආචාර්ය
**පහමුණේ සුමංගල හිමි**

ඒ අයුරින්ම දියසුන්නත හිමි, ඇත්නෝරුවේ අත්ථදස්සිහිමි, බඩබාවිට හිමි, කඹුරුගොඩ හිමි, කරිදියපල හිමි, වීරගොඩ හිමි, කොහොබන් කුලමේ හිමි, කිතලව හිමි, ලෙන්දරමුල්ලේ හිමි ආදී හිමිවරුද එකී විහාරස්ථාන දියුණු කරමින් ධර්මශාස්ත්‍රය බෙදා දීමට කටයුතු කළහ.

සඟරජ හිමියන්ගේ උපදෙස් අනුව ලෙන්දරමුල්ලේ අත්ථදස්සි හිමියන්ට බෙලිගල රජමහ විහාරයත්, මැද්දේපොල විහරයත්, බිංගිරි විහාරයේ මීනෑවේ සුමන, පාදෙනි විහාරයේ පහමුණේ ඉන්දජෝති යන හිමිවරුන්ට පහළදෙළොස්පත්තුවේ විසිරීගිය ශිෂ්‍යයන් භාර කරමින් අධ්‍යාපනය ආදිය වැඩිදියුණු කිරීමටත් සැලැස්වූහ.

සතරකෝරළයේ, සත්කෝරළයේ, උතුරු පළාත, මධ්‍යම පළාත ආදී විහාරස්ථාන දියුණු කරලමින් ධර්ම ශාස්ත්‍රාලෝකය වැඩිදියුණු කිරීමට ද සැලැස්වීය.

අස්ගිරි විහාරයේ නාවින්නේ ධම්මදස්සි මහනාහිමි, උරුලෑවත්තේ ධම්මදස්සි මහ නාහිමි, ඉඳුවල්ගොඩ මහනාහිමි, දඹව, රඹුක්වැල්ලේ, පොතුහැර, කණුමලේ, වඳවල, කඩුවෙල, මාවතගම ආදී හිමිවරුන්ගෙන් අස්ගිරි විහාරය මෙන්ම ලක්දිව විවිධ පළාත්වල විහාරස්ථාන වැඩිදියුණු කරමින් ශාස්ත්‍රාලෝකය ලබාදීමට සැලැස් වූහ.

## Lesson for mindfulness - part 9

# Contemplation of the body

**According to the Satipatthana Sutta, in practicing mindfulness, another very important and useful preparation for the meditator is to be aware and mindful of whatever they do, physically or verbally, during the daily routine of their lives.**

This involves the "four foundations of mindfulness" which are: 1) contemplation of the body (kayanupassana), 2) contemplation of feelings/ sensations (Vedananupassanana), 3) contemplation of the state of mind (Chittanupassana), and 4) contemplation of mental objects (Dhammanupassana).

I will begin with the first foundation of "contemplation of the body" (kayanupassana). The Satipatthana Sutta (Nayanaponika) explains the procedure as follows:

He applies clear comprehension; in eating, drinking, chewing and savouring, he applies clear comprehension; in obeying the calls of nature, he applies clear comprehension; in walking, standing, sitting, falling asleep, walking, speaking and being silent, he applies clear comprehension".

Therefore, one should be in the present moment and in their present actions. This does not mean that they should not think of the past or not to plan for the future.

But they should do so in relation to the present action. This is the "clear comprehension" of present action. Rahula notes: People do not generally live their actions in the present moment. They live in the past or in the future. Though they seem to be doing something now, here, they live somewhere else in their thoughts, in their imaginary problems and worries, usually in the memories of the past or in desires and speculations about the future. Therefore they do not live in, nor do they enjoy, what they do at the moment. So they are unhappy and discontented with the present moment, with the work at hand, and naturally they cannot give themselves fully to what they appear to be doing.



Battaramulla
Siri Sudassanarama
sadaham senasuna
**Ven. Dr. Mirisse Dhammika thero**

When one practices mindfulness, it doesn't mean that one should think or repeat "I am doing this" or "I am doing that"; it means that the establishment of mindfulness of the present action should be in our consciousness. The moment one thinks 'I am doing this', one becomes self-conscious, and then one does not live in the action but lives in the idea of 'I'. One should forget oneself completely, and lose oneself in what he/ she does. The moment an actor becomes self- conscious and thinks 'I am acting in front of an audience', his acting is disturbed.

However when he forgets himself in his acting, then he is at his best: he acts well and performs appropriately.

> **"When one practices mindfulness, it doesn't mean that one should think or repeat "I am doing this" or "I am doing that"; it means that the establishment of mindfulness of the present action should be in our consciousness."**

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

ඇසළ අව අටවක 2021.07.31

## සතුට ලබන නිවැරැදි මඟ

"හැමදේම කරන්නේ ජීවත් වන්නටයි' යනු පොදු ව්‍යවහාරයේ සුලබ කියමනකි. එහි දී බොහෝ දෙනෙක් අපේක්ෂා කරන්නේ දුකක් කරදරයක් නැතිව, අගහිගයක් නැතිව සතුටින්, සැපෙන් ජීවත්වීමට ය. එහි වරදක් දැකිය නොහැකි ය. එහෙත් සැප සොයා යන, සතුට සොයා යන ගමනේ බොහෝ දෙනකුට වරදින තැනක් ඇත. ඒ සැප යැයි හඳුනා ගන්නා දේ තුළය. එනම්, ධන, ධාන්‍ය, ගේ දොර, යාන වාහන, ඉඩකඩම්, නිලය, බලය ආදී භෞතිකමය වස්තූන් හි සැප සතුට ඇතැයි සිතීම ය. එහෙත් සතුට රැඳී ඇත්තේ මෙසේ ගොඩ ගසා ගන්නා සම්පත් තුළ යැයි සිතන තාක් අප වෙතින් ගිලිහී යන්නේ ද සතුට ම ය.

ඒ රැස්කර ගැනීමෙහි අසීමාන්තික බව නිසාය. තෘෂ්ණාධික බව නිසා ය. ගිහි ජීවිතය සතුටින් ගෙවන්නට ධනය ඇවැසි ය. එහෙත් ඉවක් බවක් නොමැතිව, යහපත අයහපත නොසලකා ධනය පසු පසම හඹා යනවා නම් ඒ වේගයෙන් ම දුක ද අප පසු පස හඹා එන්නේ ය. නිවැරැදි සතුට නම් උපයා ගන්නා ධනය කළමනාකරණය කර ගනිමින් ආධ්‍යාත්මික ව ලබාන්නා වූ සතුට ය.

ලෝබය, ද්වේෂය, මෝහය ආදී අකුසල මූලයන්ගෙන් මෙහෙයවන සිතිවිලි පාලනය කරමින් අලෝබය, අද්වේෂය, අමෝහය ආදී කුසලමය සිතිවිලි ඇති කර ගනිමින් ලබන්නා වූ සතුට ය.

මනා කොට උගත් ශිල්පය සොර සතුරකුට හෝ, අන් කවරකුට හෝ සොරගත නොහැකි සේ පිරිසුදු සිතකින් ආධ්‍යාත්මික ව ලබන්නා වූ සතුට කිසිවෙකුටත් සොරාගත නොහැකි ය. සැප සදමින්, සතුට සැහැල්ලුව දනවමින් ඒ සුවය සෙවණැල්ලක් සේ අප පසුපස ම එන්නේ ය.

ආධ්‍යාත්මික සුවය ලබන ප්‍රධානතම මාර්ගයක් වන්නේ පින් කිරීම ය. බුදුරජාණන් වහන්සේ ධම්ම පදයේදී දේශනා කොට වදාළේ පින් කරන පුද්ගලයා නිතර පින් කළ යුතු බව ය. පින් රැස් කිරීම සතුටට හේතුවන බව ය.

මේ උදා වී තිබෙන්නේ පින් රැස් කිරීමට ඇති හොඳම කාලයයි. උතුම් වස්සාන කාලයේ සම්බුදු සසුනේ කල්‍යාණ මිත්‍රයන් වහන්සේ ඇසුරු කරමින් මේ ජීවිතයටත්, පරලොව ජීවිතයටත් අවශ්‍ය ධර්මාවවාද ලැබ දස පුණ්‍ය ක්‍රියාවන්හි නිරත වෙමින් ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගන්නට බෞද්ධයාට අන් කවර කාලයකටත් වඩා මෙකල වටිනා අවකාශයක් උදාවේ.

දන්දීම, සිල් රැකීම, භාවනා වැඩීම, පින්දීම, පින් අනුමෝදන් වීම, වතාවත් කිරීම, පිදිය යුත්තන් පිදීම, දහම් දෙසීම, දහම් ඇසීම හා සමදිටු බව දැඩි කිරීම දස පුණ්‍ය ක්‍රියාවන් ය. දස පින් ක්‍රියාවත් යනු ද මේ ගුණ ධර්මයන් ම ය. මේ පින් ක්‍රියා ජීවිතයට සමීප කර ගන්නා තරමට අසහනය දුරු වී යයි. සහනය ම ළඟා වෙයි.

දැඩි ආශාව, තණ්හාව සිතට බරකි. නිතර අපිරිසුදු සිතිවිලි ඇති කරයි. එය දුරු කරගන්නට නම් පළමුව පුරුදු කළ යුතු දන්දීමයි. දානයෙන් සිදුවන්නේ අත් හැරීමයි. ලෝබය දුරුවීමයි.

සිල් රැකීමෙන් කය සහ වචනය සංවර වේ. භාවනා වැඩීමෙන් සිත සංවර වේ. පින් දීම ද මහා පිනකි. නිතර පින්කම්හි නිරතව ඒ පින් අනුමෝදන් කළ යුතු ය. එයින් තමන් කරගත් පින වැඩිවනවා මිස අඩු නොවේ. තමන් කළ පින් අන් අයට අනුමෝදන් කිරීමෙහි පරමාර්ථය තමන් කරන යහපත් දෙයට ඔවුන් ද සම්බන්ධ කර ගැනීම ය. අන්‍යයන් කරන යහපත් කාර්යයන්ට තමන් ද සම්බන්ධ වීම පින් අනුමෝදන් වීමයි.

විහාර පිරිසුදු කිරීම, මල් නෙළීම, පරමල් ඉවත් කිරීම, විහාර මලු ඇමදීම ආදිය පින් වැඩෙන වතාවත් ය.

මේ ආදී වශයෙන් දස පුණ්‍ය ක්‍රියාවන්ගෙන් සිදු වන්නේ සිත පිරිසුදු වීමය. ආධ්‍යාත්මික සංවර්ධනය ම ය.

කුසල් රැස් කිරීම ම යහපතට හේතු වේ. ඒ යහපත් දේ නිතර සිහි කිරීමෙන් සිත සැනසීමටත්, ප්‍රබෝධයටත් පත් වේ. එසේ ලබන්නා වූ සතුට මිල කළ නොහැකි ය. දෙලොවට ම වැඩදායක ය.

# දානය අර්ථසම්පන්න වීමට නම්...

**සියලු ලෝ සතුන් අමා දහමින් සනසා වදාළ අප අංගීරස අමාමෑණී තථාගත බුදුපියාණන් වහන්සේ විසින් දේශිත වටිනා දහම් කරුණු කිහිපයක් පහදා දීම සඳහා යි බලාපොරොත්තු වන්නේ.**

දානය පිළිබඳ කියැවෙන ඉතා අගනා කරුණු අටක් අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ "සප්පුරිස දාන" සූත්‍රයෙහි දැක්වේ. දානය යනුවෙන් අර්ථ ගැන්වෙන්නේ අත්හැරීම යි. මේ සඳහා පරිත්‍යාගය, දීම ආදී අර්ථ ද සපයනු ලැබේ.

ඒ අනුව ඉහත සූත්‍ර පාඨයෙන් කියැවෙන්නේ බුදුරදුන් භික්ෂූන් අමතා දන්දීමේ දී දන් දිය යුතු ආකාරයත් එය තව දුරටත් අර්ථ සම්පන්නවීම උදෙසා සප්පුරිස දාන දේශනා කරනු ලබයි. එකී කරුණු පිළිවෙලින් මෙසේ ය.

- සුචිං දේති (පිරිසුදු දෙය දන්දෙයි)
- පණීතං දේති (ප්‍රණීත දෙය දන් දෙයි)
- කාලේන දේති (සුදුසු කාලයෙහි දන් දෙයි)
- කප්පියං දේති (කැප වූ දෙයක් දෙයි)
- විචෙය්‍ය දේති (පරීක්ෂා කර දන් දෙයි)
- අභිණ්හං දේති (නිතර දන් දෙයි)
- දදං චිත්තං පසාදේති (සිත පහදවාගෙන දන් දෙයි)
- දවා අත්තමනෝ හෝති (දන් දී සතුටු සිත් ඇත්තෙක් වෙයි)

මෙම කරුණු අට දන් දීමේ දී අතිශයින් වැදගත් වනු ඇත. මෙයින් පළමුවැනි කරුණ මගින් කියැවෙන්නේ පිරිසුදු දේ පමණක් දන් දීම යි. අපිරිසුදු අප්‍රසන්න දෙයක් දීම කිසි විටෙකත් නොගැළපෙන්නකි. තිරිසන් ගත සත්ත්වයෙකුට වුව ආහාර වේලක් ලබා දුන්න ද එය පිරිසුදු ලෙසින් ලබා දීම සත්පුරුෂ ක්‍රියාවකි. දෙවැනි කරුණ වනුයේ ප්‍රණීත දෙයක් දන් දීම යි. ප්‍රණීත ප්‍රසන්න යම් දෙයක් ලබාදීම තුළින් එය ලබන තැනැත්තා ද අතිශය සතුටට පත් වේ. දන් දීමේ දී මෙකී කරුණ ඉතා වැදගත් වනු ඇත.

> අපිරිසුදු අප්‍රසන්න දෙයක් දීම කිසි විටෙකත් නොගැළපෙන්නකි. තිරිසන් ගත සත්ත්වයෙකුට වුව ආහාර වේලක් ලබා දුන්න ද එය පිරිසුදු ලෙසින් ලබා දීම සත්පුරුෂ ක්‍රියාවකි.

සුදුසු කල දන් දීම බුදු හිමියන් තෙවැනි කරුණ වශයෙන් පෙන්වා වදාරනු ලබයි. එයින් අර්ථ ගන්වන්නේ තමා ධනයෙන් පෝෂණය වීම හා සිල්වත් ගුණවත් උතුමන් ලොව පහළ වීම දන් දීමට සුදුසු කාලය යි. එමගින් මහත්ඵල මහානිශංස ලබා ගැනීමේ හැකියාව පවතිනු ඇත.

කැප වූ දෙයක් දීම යනුවෙන් අදහස් කරන්නේ ප්‍රයෝජනයට ගත හැකි කැමති දෙයක් දීම යි. එමගින් දෙන කෙනා මෙන්ම එය ලබන කෙනා ද ඉතා සතුටු වනු ලබයි.

පස්වැනි කරුණ වනුයේ පරීක්ෂා කර දන් දීම යි. දෙන දේ පිළිබඳ සොයා බලා එහි හොඳ නරක පරීක්ෂා කර දන් දීමයි. දෙන දේ පිළිබඳ මනාව සොයා බලා එහි හොඳ නරක පරීක්ෂා කිරීම බෙහෙවින් වැදගත් වනු ඇත. නොමැති නම් එකී දීමෙන් ඵලක් නොවේ. ලබන අය ද ප්‍රසාදයට පත් නොවේ.

"අභිණ්හං දේති" යනුවෙන් අදහස් කරන්නේ නිතර දන්දීම යි. එසේ දන් දෙන තැනැත්තා "දදං චිත්තං පසාදේති" සිත පහදවා ගන්නා බව සත් වැන්න තුළින් බුදුරදුන් අර්ථ දක්වයි.

එලෙස දන් දෙන්නා අවසානයේ දී ද සතුටු සිත් ඇති කර ගන්නා බව "දත්වා අත්තමනෝ හෝති" යනුවෙන් අටවෙනි කරුණ මඟින් පෙන්වා දෙනු ලබයි.



ගාල්ල ශ්‍රී ලංකා ධර්මදූත මහ පිරිවෙනේ ආචාර්ය, ශාස්ත්‍රපති
**කනංකේ විජිත නන්ද හිමි**

දන් දීමේ දී ඉහත සඳහන් කරුණු බෙහෙවින් වැදගත් වේ. මන් ද ඒවා සත් පුරුෂ කරුණු වන හෙයිනි. අතීතයෙහි බෞද්ධයා තුළ මෙකී ලක්ෂණ තිබුණ ද නූතනයෙහි ඇති වී තිබෙන පරිහානිය නිසා ඒවා ගිලිහී ගොස් ඇති බව නොරහසකි.

මේ නිසා සත්පුරුෂ ගුණ ධර්මයන් අපගේ දිවි මඟට බෙහෙවින් වැදගත් ඒවා ය. දන් දීමේ දී ද එකී ලක්ෂණ පුද්ගලයා තුළින් දැක ගැනීමට හැකි නම් එය දියුණුවේ ලක්ෂණයකි. ලෝභ, ද්වේශ, මෝහ යන අකුසල මූලයන් ප්‍රහාණය කර ගැනීමට උත්සාහ දරන අප දන්දීම මනා අවබෝධයෙන්ම කළ යුතු ක්‍රියාවකි.

විශේෂයෙන් සප්පුරිසදාන සූත්‍ර දේශනාවෙහි සඳහන් කරුණු අපගේ දිවි මඟට බෙහෙවින් වැදගත් හා ආලෝකය සපයන ඒවා බව අමතක නොකළ යුතු ය.

තමා සතු දෙයක් අන් කෙනකුට දීම තරම් අපහසු දෙයක් නොමැතිය. "දානය" බුදු සමය ඉතා ඉහළින් අගය කරනු ලබනුයේ ඒ නිසා ය. විවිධ දාන පින්කම් සිදු කරන අප මෙකී කරුණු දෙස අවධානය යොමු කොට තථාගත බුදුරදුන් පෙන්වා දුන් ඉහත දහම් කරුණු ඔස්සේ ගමන් කොට සසර දුකින් එතෙර වීම උදෙසා සත් පුරුෂ කරුණු ඔස්සේ පින්කම් කිරීමට අදිටන් කර ගැනීම ඉතා වැදගත් වන බව මතකයෙහි තබා ගත යුතු ය. ඒ වෙනුවෙන් ඔබට ධර්මයේ ආශීර්වාදය ම ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

# බුදුරජාණන් වහන්සේගේ දේශනා විලාසය



**දෙතිස් මහාපුරුෂ ලක්ෂණ හා අසූවක් වූ අනුව්‍යඤ්ජන හෙවත් අතිරේක සුවිශේෂ ලක්ෂණ සංඛ්‍යාත වූ රූප කාය සම්පත්තිය මෙන් ම උන්වහන්සේගේ දේශනා විලාසයේ විවිධ සන්නිවේදන ක්‍රම පාලි සත්‍ර, අට්ඨකතා, ටීකා, ජිනචරිත, ජිනාලංකාරවණ්ණනා ආදී පාලි ග්‍රන්ථවල ද ඒවා මූලාශ්‍ර කොට ලියැවුණු සිංහල සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථවල ද වර්ණනාවට පාත්‍ර වී තිබේ.**

ධර්මය ඇසීමට ද, යම් යම් කරුණු නිරවුල් කොට ගැනීමට ද උපදෙස් ලබා ගැනීමට ද ඒ ඒ ලබ්ධීන්හි එල්බ ගෙන වාද කිරීමට ද විවිධාකාර පුද්ගලයෝ බුදුන් වහන්සේ වෙත පැමිණියහ. එසේ ම පිහිට අවශ්‍ය අය දිවැසින් දැක උන්වහන්සේ එවැන්නන් වෙත වැඩියහ.

හික්මවිය යුත්තන් හික්මවා දහම් දෙසා යහ මඟට යොමු කළහ. මෙකී සියලු දෙනාට ම බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළේ එකම ආකාරයකට නොවේ.

දේශනාවේ ඉලක්කය එක් තැනැත්තකු නම් ඒ පුද්ගලයාගේ බුද්ධි මට්ටම, සමාජ පසුබිම, එම අවස්ථාවේ ඒ පුද්ගලයාගේ මානසික වාතාවරණය, සිත උකටලී ද සංසුන් ද සාහසික ද සැක සංකා සහිතව ද බියපත්ව ද යන වග අවබෝධ කොට ගැනීමේ හැකියාව ආදිය බුදුරජාණන් වහන්සේගේ සැලකිල්ලට හසු විය.

හික්මවිය යුතු සත්ත්වයන් හික්මවීම සඳහා බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ ක්‍රම දෙකක් බෞද්ධ සාහිත්‍යයෙහි දැක්වේ. එනම්, දේශනා විලාසය හා ඍද්ධිප්‍රාතිහාර්ය යන ක්‍රමෝපායද්වය යි. ප්‍රශ්න ව්‍යාකරණ විධිය බුදුන් වහන්සේගේ දේශනා විලාසයේ වැදගත් ලක්ෂණයකි. උන්වහන්සේ මේ ක්‍රමය උපයෝගී කොට ගත්තේ අන්‍ය ලබ්ධිකයන් උන්වහන්සේ හා වාදයට පැමිණි විට ය. නිගණ්ඨනාතපුත්‍ර පෙන්වන පරිදි කුසලාකුසල කෙරෙහි වඩාත් ම බලපාන්නේ කායික ක්‍රියාව බව සනාථ කොට මනසෙහි මූලිකත්වය සම්බන්ධ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම (වාදයෙන් වාද කොට) නිශ්ප්‍රභා කිරීමට ය.

උපාලි තම වාද ශක්තිය ගැන ඉමහත් ආත්ම විශ්වාසයකින් පසු වූවෙකි. එසේම පාපයට මනස නොව කායික ක්‍රියාව ම ප්‍රධාන වශයෙන් හේතු වන බවට තම ශාස්තෘවරයාගේ ඉගැන්වීම තදින් ම පිළිගත් තැනැත්තෙකි. 'මනෝ කර්ම හා කාය කර්ම' අරබයා තමන් වහන්සේ හා වාදයට පැමිණි උපාලිට බුදුන් වහන්සේ පළමුව ධර්මය දේශනා කළේ නැත. උන්වහන්සේ කළේ උපාලිගේ ලබ්ධිය ගැන ප්‍රශ්න කිරීම ය. එක් ප්‍රශ්නයකට දෙන පිළිතුර පාදක කොට ඊළඟ ප්‍රශ්නය නැඟෙයි. මේ ප්‍රශ්නෝත්තරාවලිය මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රයේ පැහැදිලිව දැක්වේ. ක්‍රමයෙන් බුදුරජාණන් වහන්සේගේ ප්‍රශ්නයට උපාලි දෙන පිළිතුර මනසෙහි මූලිකත්වය ම තහවුරු කරන්නක් විය.

නිගණ්ඨ ධර්මය අනුගමනය කරන තැනැත්තා ප්‍රාණඝාත, අදින්නාදාන, පඤ්චකාමානුභාවය, බොරු කීම ආදියෙන් වැළකෙන්නා සේ ම සීතල වතුර, දිරච්ච කෝටු, පරඬලා, ගල්, කැබිලිති ආදිය ප්‍රාණීන් සේ සලකා සීතල වතුර බීමෙන්, කෝටු ආදිය කැඩීමෙන් වැළකෙයි. එහෙත් ඇවිද යන විට පයට පෑගී සමහර කුඩා ප්‍රාණීහු මැරෙති. එහි විපාකය කවරේ ද? යි බුදුහු උපාලිගෙන් ඇසූහ.

මරණ චේතනාවක් නැති නිසා පව් නැත යනු උපාලිගේ පිළිතුර යි. 'සිටුවරය, තමා මුලින් ම කිවූ දෙය හා දැන් කියන දෙය ගැළපෙන්නේ නැ නොවේ ද? බුදුරදුන් විමසූ විට බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම 'යතාර්ථය' ලෙස පිළිගැනීමට උපාලිට අවසානයේ සිදු විය.

> **තමන් කළ වරද නිසා උපන් පශ්චාත්තාපයෙන් අජාසත් රජුට සුව නින්දක් නොලැබුණි. තමාට චෛතසික සහනයක් ලබා දිය හැක්කේ බුදුරජාණන් වහන්සේට පමණක් බව දැන ජීවක සමඟ ඔහු බුදුරදුන් දැකීමට අඹ වනයට ගියද වරදකාරී හැඟීම නිසා බුදුරජාණන් වහන්සේ හා කතා කිරීමට ධෛර්යය නොමැතිව වට පිට බලමින් සිටියේ ය. සංසුන්ව වාඩි වී සිටි භික්ෂූන් වහන්සේලා බලා "මගේ පුතාටත් මේ විදියට සංසුන්ව ඉන්නට පුළුවන් නම් කොච්චර හොඳදැයි" සිතුවේ ය. බුදුරජාණන් වහන්සේ අජාසත්තගේ සිත හඳුනා ගෙන ඔහුට කතා කළ සේක.**

උපාලි සිටුවරයා එතෙක් තමා ඇදහූ ලබ්ධිය අතැර බුදුරදුන් සරණ ගියේ ය. සූත්‍රයේ ඊළඟ කොටසින් දැක්වෙන්නේ අන්‍යාගමිකයන් කෙරෙහි පැවති සහනශීලී පිළිවෙත ය.

තමන් වහන්සේ කෙරෙහි පැහැදී සරණ ගිය උපාලි නම් ප්‍රසිද්ධ සිටුවරයාට බුදුරජාණන් වහන්සේ වදාළේ ඉක්මන් නොවී සිතා පරීක්ෂා කොට සරණ යන ලෙස ය. එසේ ම එතෙක් පවත්වාගෙන ආ ලෙසට ම නිගණ්ඨයන්ට දානය දෙන ලෙස ද බුදුහු වදාළහ.

බුදුරජාණන් වහන්සේ බ්‍රාහ්මණික යාග හෝම විධි අනුමත නොකළහ. යාග හෝමාදියේ දී තිරිසන් සත්ත්වයෝ සිය දහස් ගණනින් මරන ලදහ. එසේ මරනු සඳහා විවිධ වර්ගයේ සතුන් සත්සියය බැගින් අල්ලා බැඳ යාගය පටන් ගැනීමට පෙර කූටදන්ත බමුණාට යාග පටිපාටියට සම්බන්ධ එක්තරා කරුණු දෙකක් පැහැදිලි කොට ගැනීමට අවශ්‍ය විය. ඒ කරුණු දෙක නම්, යාග සම්බන්ධ වූ ත්‍රිවිධ යාග සම්පත් හා සොළස පරිවාර යි. කූටදන්ත බුදුරදුන් වෙත ගොස් ඒ කරුණු පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටියේ ය.

බුදුරජාණන් වහන්සේ ඒවා විග්‍රහ කළ ආකාරය දීඝ නිකායේ කූටදන්ත සූත්‍රය හා එම අටුවාවේ දැක්වේ. 'යාග' ශබ්දයේ 'දානය' යන තේරුමක් ද ඇත. බුදුරජාණන් වහන්සේ ඒ අර්ථය 'යාග' යන්නට ආරෝපණය කරමින් පෙර ආත්මභාවයක මහාවිජිත නම් රජකු කිසිම සත්ත්ව ඝාතනයක් නොකොට රටවාසීන්ට පීඩනයක් ඇති නොවන සේ ද, දානයට සහභාගිවීමට කැමති අයට අවකාශ දෙමින් ද 'යාගයක්' පැවැත් වූ ආකාරය ද ඒ යාගය පැවැත්වූ රජ හා යාගයට උපදෙස් දුන් පුරෝහිත ද දිව්‍ය ලෝකයෙහි උපන් බව ද වදාළ සේක.

ඒ යාග පටිපාටිය සම්බන්ධ ත්‍රිවිධ යාග සම්පත්ති හා සොලොස පරිවාර ද බුදුරදුන්ගේ ඉගැන්වීම්වලට අනුකූල විය. කතන්දරය අවසානයේ බෙහෙවින් සතුටට පත් කූටදන්ත සතුන් මුදා හරින ලෙස පණිවුඩ යවා බුදුරජාණන් වහන්සේට පසුදින දානයට ද ආරාධනා කළේ ය.

මෙසේ 'දේශනා විලාසයේ' අංගයක් ලෙස බුදුරජාණන් වහන්සේ උපහැරණ කතා දැක් වූ බවට නිදසුන් එමට ඇත. කෙනෙකුගේ බාහිර හැසිරීම අනුසාරයෙන් ඔහුගේ සිත වැඩ කරන ආකාරය හඳුනාගෙන ඔහුගේ සිතේ සබකෝලය හැර බුදුරජාණන් වහන්සේ ම ඔහුට ඇමතීම උන්වහන්සේ අනුගමනය කළ තවත් උපක්‍රමයකි. අජාසත් රජ පිතෘ ඝාතකයෙකි.

තමන් කළ වරද නිසා උපන් පශ්චාත්තාපයෙන් අජාසත්ට සුව නින්දක් නොලැබුණි. තමාට චෛතසික සහනයක් ලබා දිය හැක්කේ බුදුරජාණන් වහන්සේට පමණක් බව දැන ජීවක සමඟ ඔහු බුදුරදුන් දැකීමට අඹ වනයට ගියද වරදකාරී හැඟීම නිසා බුදුරජාණන් වහන්සේ හා කතා කිරීමට ධෛර්යය නොමැතිව වට පිට බලමින් සිටියේ ය.

සංසුන්ව වාඩි වී සිටි භික්ෂූන් වහන්සේලා බලා "මගේ පුතාටත් මේ විදියට සංසුන්ව ඉන්ට පුළුවන් නම් කොච්චර හොඳදැයි" සිතුවේ ය. බුදුරජාණන් වහන්සේ අජාසත්තගේ සිත හඳුනා ගෙන ඔහුට කතා කළ සේක.

16 පිටුවට...

මහාචාර්ය **පියසීලි විජේමාන්න**

# ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ අභිනව උත්තරීතර මහා නායක මහා මහෝපාධ්‍යාය අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය දොඩම්පහළ චන්ද්‍රසිරි මහනාහිමියෝ

**ශ්‍රී ලංකා ධරණීතලය සද්ධර්මාලෝකයෙන් එකලු කළේ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ දූත පිරිස විසිනි. එතැන් පටන් වසර දෙදහස් තුන්සියයකට වඩා වැඩි කාලයක් අනේකවිධ වූ බාධා මැද සම්බුදු සසුන අවිච්ඡින්නව පැවතගෙන එනු ලබයි.**

අනුබුදු මිහිඳු මාහිමියන් ඇති කළ ශාසනික ප්‍රබෝධය මහනුවර යුගය වනවිට පරිහානිය කරා ගමන් කරමින් පැවතිණ. එම දුර්දශාපන්න තත්වයෙන් ශාසන සම්ප්‍රදාය සුරක්ෂිත කරගැනීමෙහිලා පුරෝගාමී වූවෝ බෝධිසත්ව ගුණෝපේත අසරණ සරණ වැලිවිට පිණ්ඩපාතික සරණංකර සංඝරාජයාණන් වහන්සේ ය.

එනමුදු උන්වහන්සේ සිදුකළ ශාසන සංග්‍රහය ඇතැම්විට පරමාර්ථ ශූන්‍ය බවට පත්වූයේ එකල වැඩසිටි ඇතැම් භික්ෂූන් වහන්සේලාගේ අදූරදර්ශී ක්‍රියාකලාපයන් නිසා ය. කුලගොත් විචාරා මිස භික්ෂූන් වහන්සේලාට ගෞතම බුදුසසුනේ උපසම්පදාව ලබා නොදීමට කීර්ති ශ්‍රී රාජසිංහ රජු නීතියක් පැනවූ බව මන්දාරම් පුවතෙහි සඳහන් වේ. රජුගේ මෙම නියෝගය බුද්ධ නීතිය ඉක්මවා යන්නක් විය.

එවන් පසුබිමක් තුළ සියලු කුල පුත්‍රයනට ගෞතම බුදුසසුනේ උතුම් මහණ උපසම්පදාව ලබාදීමෙහිලා පුරෝගාමී වූයේ බෝධිසත්ව ගුණෝපේත වැලිතර මහකරාවේ ඤාණවිමලතිස්ස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.

උන්වහන්සේ වර්ෂ 1799 දී බුරුම රටට වැඩමකොට මහාවිහාර පරම්පරානුගත සුපරිසුද්ධ උපසම්පදාව ලබා, වර්ෂ 1802 දී ශ්‍රී ලංකාද්වීපයට වැඩමකොට සිව්දෙස කුල පුත්‍රයන්ට සසුන් පිළිවෙත් පුරන්නට අමරපුර මහානිකාය ආරම්භ කර ඉඩහසර විවර කළහ.

ලක්දිව දෙවන මිහින්තලාව ලෙස බලපිටිය අම්බරුක්ඛාරාම මූලමහා විහාරය විරුදාවලිය ලබන්නේ එනිසා ය. පූජ්‍ය බෝගහපිටියේ ධම්මජෝති, අත්තුඩාවේ ධම්මරක්ඛිත, කතලුවේ ගුණරතනතිස්ස, කපුගම ධම්මක්ඛන්ධ ආදී මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේලා බුරුම රටට වැඩමකොට සුපරිසුද්ධ උපසම්පදාව ලබා මෙරටට වැඩමකොට අමරපුර නිකාය පෝෂණය කළහ.

එතැන්සිට පාර්ශව විසිදෙකකින් සැදුම්ලත් ව ක්‍රියාත්මක වන අමරපුර මහානිකායේ උසස්ම පදවිය වනුයේ උත්තරීතර මහානායක ධුරය යි. මෙයට ප්‍රථම අග්ගමහාපණ්ඩිත මඩිහේ පඤ්ඤාසීහ මහානාහිමි, අග්ගමහාපණ්ඩිත දවුල්දෙණ ඤාණිස්සර මහානාහිමි, අග්ගමහාපණ්ඩිත කොටුගොඩ ධම්මාවාස මහානාහිමි ආදී මහ තෙරවරුන් වහන්සේලා එම පදවිය හොබවමින් වැඩසිට අපවත්වී වදාළහ.

අග්ගමහාපණ්ඩිත කොටුගොඩ ධම්මාවාස උත්තරීතර මහානාහිමියන්ගේ අපවත්වීමෙන් හිස්වූ එම පදවිය සඳහා සිව්වන වරට ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ මහා මහෝපාධ්‍යාය ශ්‍රී කල්‍යාණිවංස නිකායේ මහානායක, කලපඑවාව ගෝතම තපෝවනය ප්‍රධාන තදීය ශාඛා මධ්‍යස්ථානයන්හි අධිපති අග්ගමහාපණ්ඩිත දෙඩම්පහළ චන්ද්‍රසිරි මහානායක මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ 2021 ජූලි මස 20 වන දින ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ පාලක සංඝ සභාවේ සමාන ඡන්දයෙන් තෝරා පත්කර ගන්නට යෙදින.

මේ උන්වහන්සේගේ ජීවන ගමන් මඟ පිළිබඳ මතකාවර්ජනාවකි.

ධීරවීර වීරවික්‍රමාන්විත ජාතිවාත්සල්‍යයෙන් හා ආගමාලයෙන් ඔදවැඩුණු යති ශ්‍රේෂ්ඨයන් වහන්සේලාට සහ රාජ රාජ මහාමාත්‍යාදීන්ට ජන්මලාභය දුන් ක්ෂේම භූමියක් ලෙස අතීතයේ සිට දක්ෂිණ ලංකාව චිරප්‍රසිද්ධ ය. තවත් එවැනි යති ශ්‍රේෂ්ඨයන් වහන්සේ නමක වන අප කථානායකයාණන් වහන්සේද මාතර දිස්ත්‍රික්කයේ, දෙඩම්පහළ නමැති රමණීය ග්‍රාමවරයේදී වර්ෂ 1939 දෙසැම්බර් මස 20 දින එදිරිසූරිය පටබැඳිගේ මිසිනෝනා උපාසිකා මාතාවට සහ එදිරිවීර පටබැඳිගේ සරණේරිස් සිල්වා මහතාට දාව උතුම් පුත් රුවනක් මනුලොව උපත ලැබීය. එම දෙපළට දාව උපත ලද මේ කුමරුවා ධන්‍ය පුණ්‍ය ලක්ෂණයන්ගෙන් සමුපශෝභිත විය. සුදුසු වයස පැමිණි විට අධ්‍යයන කටයුතු සඳහා යොමු කළ මෙකුමරුවාණෝ මූලික අධ්‍යයන කටයුතු දෙඩම්පහළ මධ්‍ය මහා විද්‍යාලයෙන් ලැබූහ.

මේ අතර, සංසාරගත ධන්‍ය පුණ්‍ය ලක්ෂණ ඉස්මතුවී ආයෙන්, පැවිදිදිවියට ඇතුළත්වීමට

සිත්පහළව ඊට අවැසි මූලික වත් පිළිවෙත් මාතර වීරබා පිරුවණින් ලබා වර්ෂ 1950 නොවැම්බර් 25 දින කුඩාවැල්ල වාලුකාරාමයේ දී, නූපේ ජයමහා විහාරාධිපති, විද්‍යාවිශාරද පණ්ඩිත, මාතර ශ්‍රී මේධානන්ද නාහිමියන් වහන්සේගේ සහ වාලුකාරාමාධිපති, මාතර ශ්‍රී සද්ධාරාම නාහිමියන් වහන්සේගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන් උතුම් ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් විය.

පැවිදිදිවියට ඇතුළත් වීමෙන් පසු මූලික අධ්‍යයන කටයුතු සඳහා මාතර වීරබා පිරිවෙණට ඇතුළත් වූ දෙඩම්පහළ චන්ද්‍රසිරි හෙරණපාණෝ, එහිදී පැවිදිදිවියට අවැසි වත් පිළිවෙත් මැනවින් උගත්හ. ඉන් අනතුරුව උසස් අධ්‍යාපන කටයුතු සඳහා යොමු වූ උන්වහන්සේ ගාල්ලේ විද්‍යාලෝක පිරිවෙනට ඇතුළත්ව විද්‍යාලෝක පරිවෙණාධිපති ධුරය හෙබවූ, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, මහෝපාධ්‍යාය අකුරටියේ අමරවංස නායක මාහිමියන් වහන්සේ සහ තොටගමු රත්පත් රජමහ විහාරාධිපති රාජකීය පණ්ඩිත, සාහිත්‍ය විශාරද, අතිගරු ගම්මැද්දේගොඩ ශ්‍රී පුඤ්ඤසාර නායක මාහිමියන් වහන්සේ ගුරුතන්හි තබා ගනිමින් සිංහල, පාලි, සංස්කෘත, ඉතිහාසය, පුරා විද්‍යාව ඡන්දාලංකාර ආදි විෂයයන් පිළිබඳව ප්‍රාමණික උගතෙකු බවට පත්වූහ.

මේ වන විට විසිවසක් සම්පූර්ණ ව උපසම්පදාර්හව වැඩ සිටි අප හිමිපාණෝ වර්ෂ 1962 ජූනි මස 17 වෙනි දින මාතර නිල්වලා නදී සීමා මාලකයේදී එවකට ශ්‍රී කල්‍යාණිවංස මහා නිකායේ මහානායක ධුරන්ධරව වැඩ සිටි විද්‍යා විශාරද පණ්ඩිත, අතිගරු මාතර මේධානන්ද මහානායක මාහිමියන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් සහ අතිගරු මාතර සද්ධාරාම නායක මාහිමියන් වහන්සේගේ ආචාර්යත්වයෙන් සුපරිශුද්ධෝපසම්පදාවට ඇතුළත් විය.

උපසම්පදාවෙන් පසු අගනුවරට සම්ප්‍රාප්ත වූ දෙඩම්පහළ චන්ද්‍රසිරි ස්වාමින් වහන්සේ, මාතර ශ්‍රී සද්ධාරාම නායක මාහිමියන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවරයාණන් වූ කුඩාවැල්ලේ වංගීස අධිකරණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සෙවණෙහි භාවනා ප්‍රගුණ කිරීමට පටන් ගත් අතර, විපස්සනා කම්මට්ඨානාචරිය අතිගරු කහටපිටියේ සුමතිපාල මාහිමියන් වෙතින් වැඩි දියුණු කර ගත්හ. අභිධර්මය කෙරෙහිද විශේෂ උනන්දුවක් දැක්වූ අප හිමිපාණෝ දෙමටගොඩ මහා විසුද්ධාරාමයේ දී අභිධර්ම විශාරද අතිගරු දෙවිනුවර ඤාණාවාස නාහිමියන් වෙතින් අබිදම් ඉගෙන ඒ පිළිබඳව ද ප්‍රාමාණික උගතකු බවට පත්වූහ.

විපස්සනා භාවනා පුහුණුව ලැබූ අපේ චන්ද්‍රසිරි ස්වාමීන් වහන්සේ අතිගරු කුඩාවැල්ලේ වංගීස අධිකරණ නායක මාහිමියන් වහන්සේ සමග එක්ව වර්ෂ 1962 දී විශේෂ කර්තව්‍යයකට මුල පිරූහ.

එනම් කලපඑවාව පෙදෙසින් අක්කර අටක පමණ භූමි භාගයක් ලබා ගෙන එහි 'ගෝතම තපෝවනය' නමින් භාවනා මධ්‍යස්ථානයක් පිහිටු වීමයි. අද වන විට මෙය ශාඛා, ප්‍රශාඛා වශයෙන් ලක්දිව නොයෙක් පළාත්වල ව්‍යාප්තව ඇත. මේ කර්තව්‍ය අපේ චන්ද්‍රසිරි ස්වාමීන්වහන්සේ අතින් සිදු වූ වැදගත්ම ක්‍රියාව ලෙස අගය කළ හැකි ය. අද වනවිට විපස්සනා භාවනා ක්‍රමය මේ හේතුවෙන් ලක්දිව පුරාම පාහේ ව්‍යාප්තව ඇත.

අතිගරු කුඩාවැල්ලේ වංගීස අධිකරණ නායක මාහිමියන් වහන්සේ වර්ෂ 1982 දී අපවත් වූයෙන් ශ්‍රී ගෝතම තපෝවනය ප්‍රධාන ශාඛා මධ්‍යස්ථානයන්හි අධිපති ධූරයට දෙඩම්පහළ චන්ද්‍රසිරි ස්වාමීන්වහන්සේ පත් වූහ. එදින සිට අප දෙඩම්පහළ නායක හාමුදුරුවෝ කලපඑවාවේ ගෝතම තපෝවනයට වැඩම කොට, මාතිකමාතා සමිතියේ පින්වතුන් සමඟ එක්ව ගෝතම තපෝවනයේ දියුණුවට සුවිශාල සේවාවක් සිදු කළහ.

මේ අතරතුර ශ්‍රී කල්‍යාණිවංස නිකාය මගින් 'තපෝවන සංඝනායක' පදවිය පිරිනැමූ අතර, ඉන් ටික කලකට පසු 'ප්‍රධාන අධිකරණ සංඝනායක' 'අනුනායක' යන ධුරද්වයෙන් ද පුදනු ලැබූහ. මේ අතර කල්‍යාණිවංස මහ නිකායේ මහා නායක ධූරය හෙබවූ, මහෝපාධ්‍යාය, වීමලකීර්ති ශ්‍රී කොග්ගල සිරි විසුද්ධි නායක මාහිමියන් වහන්සේ වර්ෂ 1996 දී අපවත් වූයෙන් එතෙක් අනුනායක ධූරය හෙබවූ අතිපූජ්‍ය දෙඩම්පහළ චන්ද්‍රසිරි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වර්ෂ 1996 මාර්තු 31 දින දෙඩන්දූව, ශෛලබිම්බාරාම මූල මහා විහාරයට රැස්වූ කල්‍යාණිවංසික සංඝසභාව විසින් ඒකමතිකව නිකායේ 'මහානායක ධූරයට' තෝරා පත්කර ගන්නා ලදහ. එම දිනයේ සිට මේ දක්වා අප නායක මාහිමියන් වහන්සේ නිකායාභිවෘද්ධිය උදෙසා සිදුකළ සහ සිදුකරණ මෙහෙවර අතිශය ප්‍රශංසනීය ය. කොටස් තුනකට බෙදී වෙන්ව පැවති කල්‍යාණිවංශ නිකාය ඒකඡත්‍ර කිරීමට දෙඩම්පහල චන්ද්‍රසිරි මාහිමියන් කටයුතු කළ අයුරු ප්‍රශංසාර්හය. ශ්‍රී කල්‍යාණිවංස නිකායේ දෙවන ශතසංවත්සර පූර්ණය 2010 වසරේදී අති උත්කර්ෂවත් අන්දමින් සිදු කිරීමට ගත් ක්‍රියාමාර්ග හා සංවිධානත්වය එහිලා ජීවමාන සාක්ෂ්‍ය සපයයි. පැවැත්මෙන් ගමනින් වචනයෙන් සංවරශීලී වූ දෙඩම්පහළ චන්ද්‍රසිරි මහානායක ස්වාමින්ද්‍රයන් වහන්සේගෙන් ඉටුවන ලෝක ශාසනික සේවාව පිළිබඳ අවධානය යොමුකළ ශ්‍රී ලංකා අමරපුර මහාසංඝ සභාව එකී සංඝ සභාවේ උපසභාපති ධුරයකින් ගෞරව කළ අතර වර්ෂ 2013 පෙබරවාරි මස 23 වනදින එම සංඝ සභාවේ සභාපති ධුරයට නිතරඟයෙන් තෝරාපත් කර ගනිමින් නැවතත් ගෞරවෝපහාරය පුදකළහ.

උපසම්පදාවෙන් පසු අගනුවරට සම්ප්‍රාප්ත වූ දෙඩම්පහළ චන්දසිරි ස්වාමින් වහන්සේ, මාතර ශ්‍රී සද්ධාරාම නායක මාහිමියන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවරයාණන් වූ කුඩාවැල්ලේ වංගීස අධිකරණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සෙවණෙහි භාවනා ප්‍රගුණ කිරීමට පටන් ගත් අතර, විපස්සනා කම්මට්ඨානාචරිය කහටපිටියේ සුමතිපාල මාහිමියන් වෙතින් වැඩි දියුණු කර ගත්හ. අභිධර්මය කෙරෙහිද විශේෂ උනන්දුවක් දැක්වූ අප හිමිපාණෝ දෙමටගොඩ මහා විසුද්ධාරාමයේ දී අභිධර්ම විශාරද අතිගරු දෙවිනුවර ඤාණාවාස නාහිමියන් වෙතින් අබිදම් ඉගෙන ඒ පිළිබඳව ද ප්‍රාමාණික උගතකු බවට පත්වූහ.

සභාපති පදවියට පත්ව ගෙවුණු පස් වසර තුළ අමරපුර මහා සංඝ සභාවේ අභිවෘද්ධිය වෙනුවෙන් උන්වහන්සේ ඉටුකළ සේවය අතිශය ප්‍රශංසනීය ය. එමෙන්ම විවිධ උත්සව ආදිය සඳහා දසතින් ලැබෙන ආරාධනා සඳහා වැඩම වමින් අමරපුර මහා සංඝ සභාවේ නියෝජනය ලබා දීමට උන්වහන්සේ ක්‍රියා කළහ.

පස්වසරක ධුරකාලය 2018 වසරේදී අවසන් කළ නාහිමියෝ එම වසරේදීම ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ මහා මහෝපාධ්‍යාය ධුරයෙන් පිදුම් ලැබූහ. සම්බුදු සසුන වෙනුවෙන් උදාරතර ලෝක ශාසනික සේවාවක නිරතවන දෙඩම්පහළ චන්ද්‍රසිරි මහානායක ස්වාමින්ද්‍රයන් වහන්සේ වෙත 2021 ජනවාරි මස 4 වන දින මියන්මාර් රජය මගින් අග්ගමහා පණ්ඩිත උපාධිය පිරිනැමීම සඳහා ද තෝරාගෙන ඇත.

සම්මා සම්බුද්ධ ශාසනය වෙනුවෙන් අමිල සේවාවක නිරතවෙමින්, ජන්මලාභයෙන් අසූ දෙවසක් ද, පැවිදිදිවියේ සැත්තෑ එක්වසක් ද, උපසම්පදාවෙන් වසර පනස් නවයක් ද සපුරණ ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ අභිනව උත්තරීතර මහානායක, මහාමහෝපාධ්‍යාය, අමරපුර ශ්‍රී කල්‍යාණිවංස නිකායේ මහනායක ධූරන්ධර, වංගීසවංශාලංකාර, විපස්සනාකම්මට්ඨානාචරිය කල්‍යාණිවංස කීර්ති ශ්‍රී, අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය දෙඩම්පහළ චන්ද්‍රසිරි මහානායක මාහිමියන් වහන්සේට, ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ දහහතර දහසකට ආසන්න භික්ෂූන් වහන්සේලාගේ සහ සමස්ත මහා සංඝරත්නයේ ආරක්ෂාව සහ පෝෂණය සඳහා අවැසි අවවාද අනුශාසනා ලබාදෙමින් ශාසනචිරස්ථිතිය පිණිස තව තවත් ලෝ සසුන් වැඩ වඩන්නට බුද්ධාදි රත්නත්‍රයේ ආශිර්වාදය සැලසේවා'යි ඉතසිතින් ආශිංසනය කරම්හ.

අමරපුර කල්‍යාණිවංශ නිකායේ
මහාලේඛකාධිකාරී (වැබ.)
ගිංතොට ශ්‍රී ථූපාරාම රාජමහා විහාරාධිපති
විද්‍යානිධි පණ්ඩිත
**අම්බලන්ගොඩ**
**සුමේධානන්ද හිමි**





## සඳ සේ සුදිලේ සඟ රද මාහිමි සැම වෙත සම මෙත් සිසිල බෙදා

සීල සුසංවුත අනතිමානි ගුණ
සමලංකෘත වූ සඟ රජිඳේ
උතුරුතර මහනා හිමි පදවිය
ඔබ සිරිනම පා මුල බැබළේ

තපෝවනයේ සීල සුගන්ධය
ලොව දස දෙස වෙතටම පැතිරූ
දෙඩම්පහළ චන්ද්‍රසිරි සඟ රද
මා හිමි වොරැදෙයි සසුන දිලු

ශ්‍රී ලංකා අමරපුර සඟ ගණ
දුළවා සම්බුදු සසුන නඟා
සඳ සේ සුදිලේ සඟ රද මාහිමි
සැම වෙත සම මෙත් සිසිල බෙදා

**තලල්ලේ චන්දකිත්ති හිමි**



# ශාසනයේ පැවැත්ම රඳාපවතින්නේ විනය මතයි



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ දෙල්ලව ශ්‍රී නාථාරාමය, පරදුව ශ්‍රී වර්ධනාරාමය, පොල්ගම්පොළ ධර්මරාජ විහාරය, දේවාලේගම ශ්‍රී සුගත මහා විහාරය යන සිව්මහා විහාරාධිකාරී ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ උපසම්පදා කාරක සභික හා ජ්‍යෙෂ්ඨ කර්මවාගාචාර්ය ශ්‍රී රෝහණ තරුණ භික්ෂු සංවිධානයේ සභාපති පිරිවෙන් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ දෙල්ලව ධම්මරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

**අපේ හාමුදුරුවනේ, පිරිවෙන් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් කටයුතු කරන ඔබ වහන්සේ කුඩා අවධියේදී ගුරු හාමුදුරුවන් වහන්සේලාගේ ආභාසය ලබා ගනිමින් පැවිදි ජීවිතය ආලෝකවත් කරගැනීමට කටයුතු කළේ කුමන ආකාරයෙන් ද?**

ගාල්ල දිස්ත්‍රික්කයේ මොරවක ප්‍රදේශයේ දෙල්ලව කියන බොහොම සුන්දර ග්‍රාමීය පරිසරයක 1977 වර්ෂයේ ජූලි 17 වෙනි දින ගාමිණී ගුණතුංග යන ගිහි නාමයෙන් උප්පත්තිය ලැබුවා. මගේ ආදරණීය මෑණියන් එම් . එස් . හින්නිනෝනා මාතාවත්, ඒවගේම පියාණන් වුණ සිරිසේන ගුණතුංග මහතාත් බොහොම ශ්‍රද්ධාවන්ත ගුණවත් මව්පිය දෙපළක් බවත් සිහිපත් කළ යුතුයි. මා ඇතුළුව දරුවන් 8ක් අපේ පවුලේ සිටියා. කුඩා අවධියේ සිටම පැවිදිවීමට බොහොම ආසාවක් තිබුණා. ගා/ දෙල්ලව මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබාගනිමින් සිටි අවධියේදී මව්පිය ආශිර්වාදය ඇතිව දෙල්ලව ශ්‍රී නාථාරාම විහාරය, පරදූව ශ්‍රී වර්ධනාරාම විහාරය,පොල්ගම්පොළ ධර්මරාජ විහාරය,දේවාලේගම ශ්‍රී සුගත විහාරය යන සිව් මහා විහාරාධිපති ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ කාරක සභික හා උපාධ්‍යාය ධූරන්දර ගාලු මාතර දෙදිසාවේ උපප්‍රධාන අධිකරණ සංඝනායක සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටක විශාරද දෙල්ලව ජිනරතන නායක හාමුදූරුවන්ගේ හා බණ්ඩාරගම ධර්මාලෝක විහාරාධිපති බඹරැන්දේ උපරතන මා හිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන්, අලපලාදෙණිය ශ්‍රී විජිතාරාමාධිපති බෙන්ගමුවේ උපාලි මා හිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන්1994 ජනවාරි මස 14 වෙනි දින දෙල්ලව ධම්මරතන යන ශාසනික නාමයෙන් දෙල්ලව ශ්‍රී නාථාරාම විහාරස්ථානයේදී උත්තරීතර පැවිදි බව ලබා ගැනීමට සංසාරගත පුණ්‍ය ශක්තිය හේතු වුණා.

ගුරු හාමුදූරුවන් වහන්සේලාගේ අවවාද අනුශාසනා පරිදි කීකරු ශිෂ්‍යයකු ලෙස අප්‍රමාණ ගුරු ගෞරවයක් සහිතව පැවිදි ජීවිතයට ඇවැසි බණ දහම් ඉගෙන ගත්තා. පොඩි හාමුදූරුවන් වහන්සේ නමක් වශයෙන් පැවිදි ජීවිතයට අවශ්‍ය කරන ශක්තිමත් පදනමක් ගොඩනගා ගැනීමට එම ගුරුදේවෝත්තමයන් වහන්සේලාගේ මඟ පෙන්වීම අතිශයින් වැදගත් වුණ බව මේ අවස්ථාවේදී ගෞරව පූර්වකව සිහිපත් කළ යුතුයි. සැම අවස්ථාවකදීම උන්වහන්සේලාගේ අනුශාසනාවට ඇහුම්කම්දෙමින් කටයුතු කිරීමට වගබලා ගත්තා.

පැවිදි වීමෙන් පසුව ගාල්ල දෙල්ලව විද්‍යාවර්ධන පිරිවෙන,මාතර ශ්‍රී සුදර්ශී විද්‍යායතන පිරිවෙන යන පරිවේණස්ථානයන් තුළින් වර්ග පටිපාටියෙන් ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය සිදුකළා. විශ්ව විද්‍යාල වරම් ලබාගනිමින් රුහුණු විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියත්,ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියත්,ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් බුද්ධ ධර්මය ඩිප්ලෝමාවත්,ජාතික අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපන ඩිප්ලෝමාවත්, කොළඹ විශ්ව විද්‍යාලයෙන් පුස්තකාල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් ලබාගත්තා.

විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබූ කාල පරිච්ඡේදයේදී සුදුසු වයස් සම්පූර්ණ වූ නිසා 1998 වර්ෂයේ අප්‍රේල් 26 වෙනි දා දෙල්ලව විද්‍යාවර්ධන පිරිවෙන් විහාරාධිපති දෙල්ලව ජිනරතන නා හිමිපාණන් වහන්සේගේත් ,පරදූව ශ්‍රී වර්ධනාරාමාධිකාරී පරදූව ජිනානන්ද හිමිපාණන් වහන්සේගේත් ආචාර්ය උපාධ්‍යායත්වයෙන් රෝහණ සංඝ සභා මූලස්ථාන උපෝෂථාගාරයේදී අධිශීල සංඛ්‍යාත උතුම් උපසම්පදා සීලයට පත්වුණා.

**ඔබ වහන්සේගේ ජාතික,ආගමික, ශාසනික ,අධ්‍යාපනික සේවය පිළිබඳව සඳහන් කරනවා නම් හාමුදුරුවනේ,**

විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසුව මූලික පිරිවෙන් අධ්‍යාපනය ලැබූ ගා/ ශ්‍රී විද්‍යාවර්ධන පිරිවනේ ආචාර්යවරයකු වශයෙන් 2001 වර්ෂයේ ජනවාරි 01 වෙනි දා ගුරු සේවය ආරම්භ කළා. 2004 වර්ෂයේ මැයි 05 වෙනි දින එම පිරිවනේම පරිවේණාධිපතීන් වහන්සේ වශයෙන් කටයුතු කිරීමට සිදුවුණා. දෙල්ලව ශ්‍රී නාථාරාම විහාරස්ථානය, අකුරැස්ස පරදූව ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානය, සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරමින් සියලු විහාරාරාංගයන්ගෙන් සම්පූර්ණ විහාරස්ථාන බවට පත් කළා.පොල්ගම්පොළ ධර්මරාජ විහාරස්ථානය,දේවාලේගම ශ්‍රී සුගත විහාරස්ථානය නව විහාර කර්මාන්තයක් වශයෙන් ඉදිකළා. දෙල්ලව සිරි පුඤ්ඤානන්ද දහම් පාසලේ උප ප්‍රධානාචාර්යවරයකු වශයෙන් ප්‍රදේශයේ දරු දැරියන්ගේ දහම් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කළා. ඒ අතරතුර මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සභාවේ උපසම්පදා කාරක සභික,ගරු කර්මවාගාචාර්ය,ශ්‍රී රෝහණ තරුණ භික්ෂු සංවිධානයේ භාණ්ඩාගාරික, ලේඛකාධිකාරී, සභාපති ස්වාමීන් වහන්සේ වශයෙනුත්,නෙළුව සමථ මූල මණ්ඩලයේ සමථකාරවරයකු, උපසභාපතිවරයකු, නෙළුව ප්‍රදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රධාන ලේඛකාධිකාරී, දෙල්ලව දේවාලේගම ශ්‍රී සුගත විහාරස්ථානයේ විහාරාධිකාරී, ගාල්ල පිරිවෙන් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක ස්වාමීන් වහන්සේ නමක වශයෙනුත් විශාල ආගමික,ශාසනික කාර්යභාරයක නිරත වෙනවා. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය හා රුහුණු සේවය මගින් ධර්ම දේශනා පැවැත්වීමත් බෞද්ධ පුවත්පත්වලට ධර්ම ශාස්ත්‍රීය ලිපි සපයමින් ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා දායකත්වයත් ලබාදෙනවා. රූපවාහිනී සංස්ථාවේ උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කළ බවත් සිහිපත් කළ යුතුයි.

**පිරිවෙන් අධ්‍යක්ෂක ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ලබාගත් අත්දැකීම් අනුසාරයෙන් පිරිවෙන් අධ්‍යාපනය ලබන ස්වාමීන් වහන්සේලාට ලබාදෙන අවවාද අනුශාසනා මොනවගේද? හාමුදුරුවනේ.**

සම්බුද්ධ ශාසනයට ගැළපෙන ආකාරයට භික්ෂූන් වහන්සේලා ගොඩනැගීම පිරිවෙන තුළින් සිදුකරනවා. පොඩි හාමුදූරුනමක් ගොඩනඟනවා කියන්නේ ගමක් සකස් කිරීමක්,ගමක නායකත්වය ගොඩනැගීමක් වැනි කාරණාවක්. ශාසනයට ගැළපෙන ආකාරයට සැම අංශයකින්ම දක්ෂ සංවරශීලී වැදගත් භික්ෂුවක් සකස්කිරීම පිරිවෙන් අධ්‍යාපනයේ මූලික අරමුණයි. ඒ සඳහා ශිෂ්‍ය පොඩි හාමුදූරුවන් වහන්සේලාට අවශ්‍ය කරන විවිධ වැඩ සටහන් අපි දිවා රාත්‍රී ක්‍රියාත්මක කරනවා. පිරිවෙන් ගුරුවරයකු, පරිවේණාධිපති, ගුරු උපදේශක,සම්බන්ධීකරණ නිලධාරී ආදී වශයෙන් වසර ගණනාවක් කටයුතු කළ කාල පරිච්ඡේදය තුළත්, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක ස්වාමීන් වහන්සේ නමක් වශයෙනුත් පොඩි හාමුදූරුවන් වහන්සේලා දහස් ගණනකගේ පැවිදි ජීවිතය ආලෝකමත් කරගන්නට යන ගමන තුළ උන්වහන්සේලා ශාසනයට ඔබින ආකාරයට සකස්කිරීමට අවශ්‍ය නායකත්වය ලබාදීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

බුද්ධ දේශනාවට අනුව මේ ශාසනයේ පැවැත්ම රඳා පවතින්නේ විනය මතයි. ගිහියාට වඩා වෙනස් උත්තරීතර බවක් තිබෙනවා යන හැඟීම,අවබෝධය සැම විටම පොඩිහාමුදූරුනමක් තුළ තිබීම අවශ්‍යයි. උන්වහන්සේලාගේ ජීවිතය ආලෝකවත් කරගැනීම සඳහා දසධම්ම සූත්‍රය පොඩි හාමුදූරුවන් වහන්සේලා නිරන්තරයෙන්ම පරිශීලනය කළ යුතුයි. ඒ තුළ තමන්ගේ ජීවිතය හැඩගස්වාගත යුතු ආකාරය පිළිබඳව තොරතුරු සඳහන් වෙනවා. වත් පිළිවෙත් පුංචි හාමුදූරුවන් වහන්සේලාගේ ජීවිතය හැඩගස්වාගැනීමට ඉතාම වටින දෙයක්. වත් 14ක් බුදුරජාණන් වහන්සේ වත්තක්ඛන්ධකයේ පැහැදිලි කර තිබෙනවා.තමන්ට සාර්ථක ගමනක් යාම සඳහා එම වත් පිළිවෙත් පුහුණුකිරීම හා ඒවා අනුගමනය කිරීම, විනයානුකූලව කටයුතු කිරීම ඉතාම වැදගත්. බුද්ධ දේශනාවේ ඇතුළත් සේඛියා 75 තුළින් සඳහන් කරනු ලබන්නේත් සංවරසශීලී භික්ෂූන් වහන්සේ නමක් වීමට අවශ්‍ය කාරණායි.ඒවා අනුගමනය කිරීමෙන් භික්ෂු ජීවිතය ආලෝකවත් වීමත්, පැහැදුණ අයගේ පැහැදීම තවදුරට වර්ධනය වීමත්, අපැහැදුණ අයගේ පැහැදීම ඇතිවීමත් සිදුවෙනවා. යම් යම් කරුණු කාරණාවලදී තිබෙන ශ්‍රද්ධාවත් නැතිවන ආකාරයේ කටයුතු මාධ්‍ය තුළින් ඇතැම් අවස්ථාවල දකින්න ලැබිල තිබෙනවා. එනිසා අපි අපේ පොඩිහාමුදූරුවන් වහන්සේලාට හැමදාම අවවාද,අනුශාසනා ලබා දෙමින් පුහුණු කරන්නේ සේඛියා ආදිය තමන්ගේ ජීවිතයට ආලෝකය පිණිස තබාගෙන ඒ අනුව හික්මීම, සංවරකම ඇතිකරගෙන කටයුතු කළ යුතුබවයි.

ගිහියකුට වඩා වෙනස් වූ ස්වරූපයක් ඇති උත්තරීතර උදාර චරිතයක් බවට පත්වෙන්නට අවශ්‍යයයි යන උදාර අරමුණු ලබාදෙමින් එය පෙරදැරිව පුංචි හාමුදූරුවන් වහන්සේලා සකස් කිරීමට කටයුතු කරනවා.

**හේමමාලා රන්දුනු**

# විරිදු

සන්සුන් ලෙස හිත නිවමින් මතුවන ලොව් තුරු ගීය යි
අංගී රස බුදු සමිඳුට මගෙ හදවත මිගද ය යි
ගලලා එන දහම් රසය හෙළ දෙරණේ පින් බලය යි
තෙවලා සදහම් ගුණයට මගෙ හදවත ලුම්බිණීය යි

හරි කරුණාවෙන් කවදත් කලා කරුට අත හිතදෙන
සිරි සරසවි මව් වඩින්න කමලාසන මත වැජඹෙන
මේ වෙහෙරේ වැඩ වසනා නායක සමිඳුන් අතුලුව
මම නමදිමි හද බැතියෙන් විරිදු ගයන්නට පළමුව

**ගොඩකවෙල සුමිත්ත හිමි**
04 ශ්‍රේණිය
ශ්‍රී සුමන සාමණේර ආයතනය, වෙහෙරයාය




# මව් ගුණ කවි

ගල්වල වැදි වැදි වතුර ගලනවා
මාළුවො වතුරේ පිහිනා යනවා
ගලන ගඟේ දිය පහරයි අම්මා
මහ සයුරකි ඔබ ආදර අම්මා.....

අහසේ පිනි බිඳු බිමට වැටෙන්නේ
සීත ගඟුල සේ මෙත් පැතිරෙන්නේ
සීත පින්න මගේ ඇඟට වැටෙන්නේ
මුතු ඇටයයි ඔබ මගේ ආදර අම්මේ......

**පියරපන්දෝවේ උත්තමඥාන හිමි**
02 ශ්‍රේණිය,
ශ්‍රී ගැමුණුපුර විහාරය, හඳපානාගල

# ළමා ප්‍රහේලිකා අංක 25



**ප්‍රථම ජයග්‍රාහකයා සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම් කේ.කේ. සුගතපාල මහතාගේ අනුග්‍රහයෙන් වටිනා ත්‍යාගයක් පිරිනැමේ.**

### හරහට

1.වස් කාලය අවසානයේ මෙම පින්කම් පැවැත්වේ
3.ස්පර්ශය ගෝචර වනුයේ ශරීරයේ මෙම කොටසට ය
4.භාවනානුයෝගීව සිටීමට යොදගන්නා වනගත පෙදෙස මෙසේ හැඳින්වෙයි
5.මුව දඩයමේ ගිය දෙවන පෑතිස් රජුහට මිහිඳු හිමියන් ඇමතුවේ මෙ නමින් ය
6.සහනයක් ලබා ගැනීම සඳහා දෙවියන්හට ප්‍රතිලාභයක් පොරොන්දුවීම මෙසේවීම ලෙස හැඳින්වෙයි
7.පුදපූජා සඳහා ගනු ලබන සුලභ පලතුරු වර්ගයකි

### පහළට

1.දීර්ඝ කාල පරාසයන් දැක්වීමට බෞද්ධ සාහිත්‍යයේ යොදන කාල ඒකකයකි
2.බෞද්ධ පැවිදි පාර්ශ්වයේ අනන්‍යතාව හඟවන තවත් පදයකි
3.ගෞරවාදරය යන අර්ථයෙන් යෙදෙන වචනයකි
4.චතුරංගනී සේනාවෙන් එක් කොටසකි
5.පහනක දැල්ල කරා තෙල් සැපයෙනුයේ මේවා ආධාරයෙනි



සංස්කරණය - **නයනා නිල්මිණී**

# සදහම් අරණ

# ධර්මාශෝක රජතුමා

ධර්මාශෝක රජතුමා ශ්‍රී ලංකාවට බුදු දහම රැගෙන වැඩම කළ මිහිඳු මහරහතන් වහන්සේගේ සහ ලක්දිවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන වැඩම කළ සංඝමිත්තා තෙරණින් වහන්සේගේ පියාණන් ය. ධර්මාශෝක රජතුමාගේ පළමුවන නාමය "අශෝක" වූ අතර දෙවැනි නාමය "චණ්ඩාශෝක" ය. තෙවැනි නාමය 'ධර්මාශෝක' ය. එම නාමය හිමි වූයේ බුදුදහම වැළඳ ගත් නිසා ය.


**තිසුම් අපූර්වා**
3 ශ්‍රේණිය
වික්‍රමශීලා ජාතික පාසල

## මගේ අම්මයි තාත්තයි

මගේ අම්මයි තාත්තයි ඉර හඳ වාගේ මට විශ්වාසයි. අපගේ ජීවිත සාර්ථක කිරීමට මහත් වෙහෙස මහන්සි වී වැඩ කරනවා. මගේ අම්මාටයි තාත්තාටයි මම හුඟාක් ආදරෙයි. මම වැඩිහිටියකු වී ඔවුන් ආදරයෙන් රැක බලා ගන්නෙමි.

**මනෝෂි සඳහංසනා**
03 ශ්‍රේණිය
ශ්‍රී ධර්ම ප්‍රදීප දහම් පාසල, කිතුල්ගල

### අපේ පන්සල



**පසිඳු යළින්ස මුණසිංහ**
3 ශ්‍රේණිය
ශ්‍රී සුධර්මාරාම දහම් පාසල
රත්නපුරය

### මමයි නංගියි




**වෙනුජ ලක්දිව් පීරිස්**
01 ශ්‍රේණිය
සෝමවීර චන්ද්‍රසිරි විදුහල
පිලියන්දළ

### මල් මෝස්තරයක්



**කහටගස්දිගිලියේ ගෝතම හිමි**
02 ශ්‍රේණිය
ශ්‍රී මහා මහින්ද පිරිවෙන,
අනුරාධපුරය

### මගේ යාලුවෝ



**ඩී.කේ.එම්. ටිවිනි ආදිත්‍යා**
02 ශ්‍රේණිය
බණ්ඩාරනායක බාලිකා විදුහල,
අම්පාර



## සතුන්ට හිංසා නොකරමු

සතුන්ට හිංසා කිරීම අකාරුණික ය. ආහාර සොයා ගෙදරට එන කුරුල්ලන් එළවීම, ගව ඝාතනය, ගෙදරට කෑම සොයා එන සුනඛයන්, බළල්ලු වැනි සතුන්ට වධ දීම, ආදී දෙයට ඇතැමෙක් පෙළඹෙති. අපට ලෙඩ දුක් හැදුණු විට, කුසගින්නක් සැදුණ විට ඒ ගැන කාට හෝ කියා විසඳාගත හැකි ය. එහෙත් සතුන්ට එසේ කියා ඒවා විසඳා ගත නොහැකි ය. ඒ ගැනවත් සිතා තම නිවසට එන සතුන්ට පහර දී එළවා නොගත යුතු ය. ඒ වෙනුවට ඔවුන්ට ආහාර ලබා දී ආදරය, කරුණාව දැක්විය යුතු ය. එම සතුනට අප සැලකු විට සතුන් ද අපට කාරුණික වෙයි. අප ළඟ පමණක් නොව සතුන් තුළ ද හොඳ ගතිගුණ ඇත. එනිසා සතුන්ට ආදරය කරුණාව දයාව දක්වමු.

**හිමාෂි තත්සරණී**
09 ශ්‍රේණිය
අලුගල්ගේ වැව පාර, වැල්ලවාය.

# පැන විසඳුම්

දයාවංශ ජයකොඩි සහ සමාගම

**පහත සදහම් ප්‍රශ්නයට පිළිතුර පැහැදිලි ව ලියා අප වෙත එවන්න.**

**මගේ ලෝකයේ වීරයා** යන මාතෘකාව පිළිබඳ කෙටි රචනාවක් නිර්මාණාත්මක ව ලියා අපවෙත එවන්න.

ජයග්‍රාහී දරුවකුට දයාවංශ ජයකොඩි සහ සමාගමෙන් දහම් පඩුරක් පිරිනැමේ.

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

සම්පූර්ණ නම :– ................................................
පාසල / දහම් පාසල :– ................................................
ඉගෙනුම ලබන ශ්‍රේණිය :– ................................................
ලිපිනය :– ................................................
දුරකථන අංකය :– ................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.**

## මරණෙට මා බිය නොවනා

මහ ලොකු දේපොළ නොවනා
එනමුත් නැත සිත ලොබිනා
මන දෙළ සරලව පිරෙනා
මරණෙට මා බිය නොවනා

සගුනට දත් පැත් පිදුණා
මව් පිය යුතුකම් කෙරුණා
දූ දරුවන් යහ ගුණෙනා
මරණෙට මා බිය නොවනා

නැති බැරි අය හට බෙදුණා
සතුනට කරුණා පිදුණා
ඉසි කෝ මද මත් හැලුණා
මරණෙට මා බිය නොවනා

මත් දිය කිසි දින නොවනා
සොරකම සිත නැත හඳුනා
තිවැරැදි කාමයෙ රැඳුණා
මරණෙට මා බිය නොවනා

බොරු බස් මට ප්‍රිය නොවනා
හිස් වචනය නැත සොබනා
පරුෂ වදන් මොට හඳුනා
මරණෙට මා බිය නොවනා

**අධ්‍යාපනවේදී, විශ්‍රාමලත්
පරිවේණාචාර්ය, පී.බී. ගුණරත්න**

## වඳිමු සිරිපා පියුම්

බැතියෙන් සිත් පැහැදේ
කරුණා රැස් විහිදේ
අපේ නඩේ
මැදිකරගෙන
අපි යමුද සිරිපාදේ

කිරි කෝඩින් රැනයි
සැමටම තුන් සරණයි
සීත ගඟුල ළඟ හිඳගෙන
සුදු පිරුවට මානයි

මේ ගෙත්තම් පානයි
මහ ගිරි දඹ මුදුනයි
ඉදිකටු පාතින් පියඹන
සුදු සමනළ රැනයි

කොවිඩ් විපත් නොමවේ
වෛරස් බිය පහවේ
සුමන සමන් දෙවි පිහිටෙන්
මේ ලක් බිම සැනසේ

**ගාල්ල තෙන්කල්ලාගොඩ ශ්‍රී
විමලඥාණ දහම් පාසලේ ආචාර්ය
ජී. පියදස**


## පහන් සිතක කවි

### සතුට

කුස ගිනි නිවා ගෙන සතුටින් සිටීමට
හැම කෙනෙකුට ම ඇත අයිතිය විසීමට
වස විස නොයෙක් රසකාරක එකතුකොට
හදනා අහර විකිණෙනවා හතර වට

වස විස නැතිව හෙළ බොජුනක් වළඳන්න
අගහිඟ නැතිව සතුටින් ජීවත්වෙන්න
මෙත් කරුණාව හැම හදකම පුරවන්න
බිය සැක නැති ලොවක් ඒවිද දැක ගන්න

**ඇල්.ඩී. සිල්වා, කොත්මලේ**




**සංස්කරණය - දීපා පෙරේරා**

## ගංගාව

ඉඩෝරයට
වියළී ඉකිගසන
ගංගාව.....
අනෝරා වැස්සකදි
නැවතත් හඬයි
දරාගත නොහැකිව
ධර්මතාවය
එයයි.......

**ඒ.එච්. බුද්ධිකා සංජීවනී
මප/කොත් හැදුණුවැව මධ්‍ය මහා විද්‍යාලය,
හැදුණුවැව**

## කසාවත



උපන්ද සිට තිබුණු අප්පච්චිගේ
අයිතිය ඉවත් කෙරුණා
නැකත් බලලා - අකුරු බලලා
අම්ම දුන් නම ඉවත් කෙරුණා
පොදුවේ සැමටම ගමේ නාමෙන්
යළිත් උප්පත්තියක් ලැබුවා
සසුන සුරකින - පින් කෙතයි නුඹ
අපයි සරු අස්වැන්න නෙළණා

කෝටියක් සංවර ශීලය - පුංචි හිතට බර වැඩිද මන්ද
පරම්පරා හත නිවන් දක්නා සසර පුරුද්ද කියා සිතුණා
පූජනීයයි වන්දනීයයි සඳ බොදු හදවතේ රැඳුණා

**ගොහාගොඩ, මාලා විජේරත්න**

## බුදුන් දකින මල් පිපුණා

ගසක් සෙවණ දුන් බව මුදු සිසිල පෙරා
ඇසක් පුරා බුදු රැස් පෙළහරක් දරා
දෙසක් නොමැති ලෙස අමයුරු මියුරු පුරා
වෙසක් මල් පිපෙයි සම්බුදු ගුණ සමරා

මරු පරදවන්නට තිසි දස පෙරුම් පිපී
අරුණ ලෝකයක් ලෙස හැම නෙතම හැපී
කරුණා ගුණෙන් සපිරුණු මෙත් දියෙන් දැපී
තෙරුවන් සරණ යමු මුළු හදවතින් අපී

අන්තිම භවය මෙය වේ ළද කය දිරුව
පන් සාළිස් වසක් සත සිත නිවූ තරුව
පින් කෙත් මව මවා දුන් බවදුක් වැරුව
පුන් සඳ පවා පායන්නේ ගරු සරුව

දැල් වෙන පහන් වැට ආලෝකය පැළඳ
කල්පයකටම නොනැසෙන දහමක පැහැද
සල් මල් මැළවුණත් නිසසල බව වැළඳ
මල් සුවඳට වඩා පැතිරේ සිල් සුවඳ

දරා විදුරසුන් පරද මරු පබල
පෙරා අමම්හිර මිසදිටු කර දුබල
සරාගික සතන් යොමුකළ මඟ නමල
විරාජිතයි දහමින් පිරි සිත් කමල


මැදුම් මඟ සොයා දුන් දම් ඇසක් සැදේ
රිදුම් සියලු දුක් නිවනා ලොවක් රැදේ
මුදුන් අත් තබා වඳිනා රුවක් ඇදේ
බුදුන් දකින මල් පිපුණා වෙසක් සඳේ

**වික්‍රමසිංහ අතපත්තු
තලවත්තේගෙදර**

## ප්‍රහේලිකා අංක 20

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය බෞද්ධාලෝක පදනම

**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**



**හරහට**

1. විදුර ජාතකයෙහි සඳහන්වන යක්ෂයාගේ නමයි
4. බුදුබව ලබා ගැනීමට බෝසතුන් මෙම ගුණාංග දහයක් පුරන ලදී
6. මෙම සම්ප්‍රදායික ජ්‍යොතිෂය තොරතුරු පත්‍රය ශුභ, අශුභ කාල සහ පොහොය දින යනාදිය දක්වයි.
8. මාර්ගය යන අර්ථය දෙන වචනයකි.
9. ආශිර්වාදත්මක ප්‍රබන්ධයන් වන මෙම වචන සැකැසුම් තඹ තහඩුවල ලියා ශරීරයෙහි පැළඳීම ද කරති.
10. ගෘහ සේවිකාවන් සඳහා වන පැරැණි භාවිත නාමයකි.
12. පන්සලකට සම්බන්ධ එහි අවශ්‍යතා සපයන ගිහියන් නම් කරන අයුරුයි.

**පහළට**

1. අරහං යන බුදුගුණය අළලා ලියූ සුප්‍රසිද්ධ පැරණි සිංහල ග්‍රන්ථයකි.
2. ගල් ගුහා තුළට පර්වත බිත්තියෙන් ගලායන ජලය වළකාලීමට කර ඇති නිර්මාණයයි.
3. ඉතා නුවණැති කාන්තාවක් ලෙස මෙම දේවියගේ නම සිංහල සාහිත්‍යයෙහි කියැවෙයි.
5. මුවන්ට අභය භූමියක් වූ නිසා බරණැස ඉසිපතනයට මෙම නම යෙදිණි.
7. හින්දු ධර්මයට අයත් ග්‍රන්ථ කාණ්ඩයකි.
11. ශික්ෂා යන අරුත් දෙන වචනයකි.

**පිරුවානා පොත් වහන්සේ ඇතුළු වටිනා ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

**බුදුසරණ කර්තෘ, ලේක්හවුස්,
ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ
ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.**

**සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළ වන්නේ සියලු සත්ත්වයන් දුකෙන් නිදහස් කිරීම උදෙසා යි. උන්වහන්සේ අපට කියාදෙනවා දුකෙන් නිදහස් වන මාර්ගය ගැන. ඒ මාර්ගයේ ගමන් කරන ආර්ය ශ්‍රාවකයන් සසර දුකෙන් නිදහස් වී සැපත ළඟා කරගනු ලබනවා. ඒ දුකෙන් නිදහස් වන මාර්ගයේ ගමන් කිරීමේ දී අපේ ජීවිතයට පුරුදු කළ යුතු බොහෝ ගුණාංග ධර්මයේ සඳහන් වෙනවා. ඒ ගුණාංග අතරින් එක් ගුණයක් වන්නේ ඉවසීම යි. නැතිනම් හට ගත් තරහා නැවත මෙනෙහි නොකර සිටීම යි.**



# සිත දුර්වල කරන ද්වේෂය දුරු කරමු

### ඇයි මෙතරම් කෝපයක්...

අද අපේ සමාජයේ බොහෝ දෙනෙක් බොහෝම සුළු කරුණක් සඳහා තරහා ගන්නවා. ඇයි ඔබට මෙ තරම් කේන්ති යන්නේ? කියා ඇසුවොත් බොහෝ විට විවිධ හේතු කියන්න පුළුවන්. අන් අය වෙත දැන දිගු වෙන්නත් පුළුවන්. එහෙත් හේතු සියල්ලම හොඳින් විමසා බැලුවොත් තරහ යන්නේ ප්‍රධාන හේතු දෙකක් නිසා යි. ඒ තමා කැමැති දේ තමන්ට නොලැබීමත්, අකමැති දේ ලැබීමත්.

ලොකු, කුඩා, මහලු අපි සියලු දෙනාම කැමැතියි අන් කෙනෙක් අප වර්ණනා කරනවා නම්. මම ගැන මේ අය හොඳ කියයි කියා නිතරම අපි හිතනවා. එහෙම අවස්ථාවක අප බලාපොරොත්තු වූ වර්ණනාව ලැබුණේ නැතිනම් අපට තරහා යනවා. ඇයි ඒ අප බලාපොරොත්තුවෙන් සිටි දේ නො ලැබීම නිසා. එවිට අපට සිතෙනවා මේ පුද්ගලයාට මම මෙතරම් උපකාර කරලත් මා ගැන හොඳක් කිව්වේ නැහැනේ කියා එසේ සිතා දෙම්නසට පත් කර ගන්නවා . ඒ කැමැති දේ නොලැබීමේ දුක.

ඊළඟ කරුණ අප අකමැති දේ ලැබීම. මිනිස් සතා වේවා තිරිසන් සතා වේවා පීඩා විඳින්න කැමැති නැහැ. වචනයෙන් හෝ කායිකාව වන පීඩාවලට විවිධ ආකාරයෙන් අපට මුහුණ දෙන්න සිදුවෙනවා. එවිටත් සිතට දෙම්නස ඇතිවෙනවා. ඒ වගේම කෙනෙක් අපගේ මුහුණට හෝ නැති තැන අපට දෙස් කියනවා. එවිටත් අපට තරහා යනවා. ඉවසීම ඉක්මවා යනවා. කෙනෙක් අප සතු දේ බලෙන් ගන්නවා. එවිටත් අපට තරහා යනවා. මේ සියලු දේ අකමැති දේ ලැබීම නිසා ඇතිවන දුක් පීඩා.

සමහර පුද්ගලයන් සිටිනවා තමාට දෙස් කිව්වත් ඉවසනවා. අම්මා, තාත්තා , රට, ජාතිය, ආගමට දෙස් කිව්වත් ඉවසනවා. නමුත් තමා අමනාප, තමාට අප්‍රසන්න පුද්ගලයකුගේ ගුණයක් අසන්න ලැබුණොත් කිපෙනවා. අසතුටට පත්වෙනවා. අමනාප පුද්ගලයාගේ ගුණ අසන්න අපේ සිත එතරම් කැමැත්තක් දක්වන්නේ නැහැ. නමුත් ඒ පුද්ගලයාගේ වැරැද්දක් කිව්වොත් ඇත්ත තමා මමත් දැක්කා, එයා එහෙම තමා කියමින් නැති අඩුපාඩුත් එකතු කරලා පවසනවා. ගුණයක් කිව්වත්, ගුණයක් දුටුවත් අකමැති පුද්ගලයෙක් නම් එය අනුමෝදන් නොවීම අපේ සිතේ සාමාන්‍ය ස්වභාවයක්. නිතර ම අප උත්සාහ කරන්නේ අප අමනාප පුද්ගලයාගේ වැරැදි සාධාරණීය කරලා ඒක හරියි කියා ලෝකයාට ඒත්තු ගන්වන්න. අපේ සිත කැමැති තරහ පුද්ගලයාගේ වරදම දකින්නයි. නරකම දකින්නයි. එහෙම අවස්ථාවක හොඳක් අසන්නට හෝ දකින්නට ලැබුණොත් අපට තරහා යනවා. සිතේ අමනාපයක් ඇතිවෙනවා. එතැනදී සිදුවුණේ අප කැමැති දේ නො ලැබීමේ දුක ලැබීම යි. අකමැති දේ ලැබුණ නිසා අපි ගැටුණා.

භාග්‍යවතුන් වහන්සේ මේ පිළිබඳ ව ආඝාතපටිවිනය සූත්‍රයේ ද දේශනා කොට වදළා. අංගුත්තර නිකායේ පංචක නිපාතයේ සඳහන් මෙම දේශනාවෙන් තරහා යාම ගැන අපට සරලව තේරුම් ගත හැකියි.

භාග්‍යවතුන් වහන්සේ වදාළා යම් තැනැත්තෙක් , මේ පුද්ගලයා මට අතීතයේදී අනර්ථයක් සිදු කළා යැයි සිතමින් තරහ ගන්නවා. එය කයින්, වචනයෙන් හා සිතින් කළ හැකියි. සමහර විට අවුරුදු ගණනකට පෙර කළ දේ සිතමින් ඒ තරහා පෝෂණය කරමින් ජීවත් වෙනවා.

ඊළඟ ට සිතනවා අනාගතයේදීත් මට මේ අය ඊර්ෂ්‍යා කරයි. මගේ දේ පැහැර ගනියි කියා අනාගතය උපකල්පනය කරමින් තරහ සිතක් ඇති කර ගන්නවා. වර්තමානයේදීත්, අනාගතයේදීත් ඒ ඒ ආකාරයට ගළපමින් තරහ සිතක් ඇතිකර ගන්නවා.

මේ විවිධාකාරයෙන් තරහා යාම නැතිනම් ද්වේෂය අපේ සිතේ හට ගන්නවා. කුමන අසාධාරණයකට තරහා ගත්තත් පාපී අකුසල සිතිවිල්ලක්. සිත දුර්වල කරන, සිත කෙලෙසන, සිතේ වටිනාකම නැති කරන, ප්‍රභාශ්වරය නැතිකරන, දුර්වර්ණ කරන, අපවිත්‍ර කරන සිතිවිල්ලක්.

### සිතිවිලිවලට වටිනාකමක්

සිතට එන නරක සිතිවිලි නවතාගන්න මඟ බුදු දහමේ උගන්වනවා. ඒ තමා සිතට එන පාපී අකුසලයට වටිනාකමක් නොදී සිටීම. ඕනෑම සිතිවිල්ලකට වටිනාකමක් දුන් විට එය සිතේ ස්ථාවර වෙනවා.

සිතිවිලිවලට වටිනාකමක් ලැබෙන්නේ නැවත නැවත එයම සිතන්නට පටන්ගත් විටයි. ද්වේෂය හටගත් අවස්ථාව එයම සිතුවොත් එය සිතේ තහවුරු වෙනවා. ස්ථාවර වෙනවා. ඒ ස්ථාවර සිතිවිල්ල ආවේගයක් බවට පත්වෙනවා. ආවේගය කියන්නේ වේගයෙන් අපකරා පැමිණෙන සිතිවිල්ල යි. සිතිවිල්ලේ වේගය වැඩිවූ විට තමාට තමා පාලනය කරගත නොහැකි වෙනවා. සිතිවිවිලිවල පාලනයක් නැති වූ විට වචන පරුෂ වචන වී පවසනවා . සිතිවිලිවල පාලනයක් නැති වූ විට කරන ක්‍රියා වැරැදි ක්‍රියා බවට පත් වෙනවා. එනිසා පාලනය කරන්න බැරි ආකාරයට සිතිවිලිවලට වටිනාකමක් දියයුතු වන්නේ නැහැ. එහි ආදීනවය නුවණින් දකින්න ශ්‍රාවකයා දක්ෂ විය යුතුයි. තමාගේ සිතිවිලි පාලනය කරගත් විට තමාටත්, තමා අවට සිටින අයටත්, සමාජයටත් වන හානිය අවම කර ගත හැකි යි.

### ඉවසීම පාලනය කරන ක්‍රම

භාග්‍යවතුන් වහන්සේ මෙම සූත්‍රයේදී වදාළා මේ ආකාරයට අපට තරහා යනවානම්, ඉවසන්නට බැරිනම් එය පාලනය කර ගැනීමට ක්‍රම පහක්. ඒ තමා

- **මෛත්‍රිය උපදවා ගැනීම**

මෙහිදී මෛත්‍රිය ලෙස වදාළේ මිතුරුකම යි. හිතවත්කම යි. කෙනකුගේ නරක සිතන්නේ නැතිව හොඳ පමණක් සිතනවා නම් තරහ සිතිවිලි අඩු වෙනවා. යම් පුද්ගලයකු ගැන අපට නිතර තරහ සිතිවිලි එනවා නම් ඔහුගේ හෝ ඇයගේ හොඳක් දකින්නට පුරුදුවීම වැදගත් වෙනවා.

- **කරුණාව පුරුදු කිරීම**

කරුණාව කියන්නේ කෙනෙක් අසරණ වූ විට අපේ සිතේ ඇතිවන තෙතමනයට යි. අනුකම්පාව උපදවා ඔහුට පිහිට වීමයි. කෙනෙක් අපට දෙස් කියන විට අපට කේන්තියක් ඇති වෙනවා. එය පාලනය කරගෙන ඔහු කෙරෙහි කරුණාව උපදවාගෙන සසර බිය දකිද්දී අපගේ තරහා අඩු වෙනවා.

- **සිතේ උපේක්ෂාව ඇතිකර ගැනීම**

අප හිතවත් කෙනෙක් වේවා අහිතවත් කෙනෙක් වේවා තරහා සිතිවිල්ලක් ආ විට සිතේ උපේක්ෂාවක් ඇතිකර ගත යුතු වෙනවා. මම වගේම මේ කෙනාත් සසරේ යන කෙනෙක්. පොඩි පොඩි දේට මම ගැටිලා අකුසල් කර ගන්න හොඳ නැහැ කියා මධ්‍යස්ථ බවක් සිතේ ඇතිකර ගන්න ඕන. නමුත් බොහෝ විට අප සිතන්නේ අපටමයි හැමදාම කරදර. අපටමයි දුක කියලා. ඒත් පොදු ධර්මතාවට ආ විට අපි වගේම දුක් විඳින අය තව ඉන්නවා කියා උපේක්ෂාවෙන් බලනකොට අපේ සිත මධ්‍යස්ථ වෙනවා.

- **අරමුණ මාරු කිරීම**

කෙනෙක් තමාට දෙස් කිව්වා කියා තමාට අසන්න ලැබෙනවා. එවිට තමාගේ සිත ගැටෙනවා. එහෙම අවස්ථාවක ඒ දෙය මෙනෙහි නොකර අරමුණ මාරු කරනවා. පොතක් කියවීම, ගීතයක් ඇසීම වැනි සරල දෙයක් තමන්ට කරන්න පුළුවන්. අවධානය වෙනතකට යොමුකළ විට සිතේ කැළඹීම අඩුවෙනවා. ක්‍රමයෙන් සිත තැන්පත් වෙනවා. එනිසායි ද්වේෂය ඇවිස්සී එන අරමුණට වටිනාකමක් දියයුතු නො වන්නේ.

- **කර්මය දායාද කර ගැනීම**

භාග්‍යවතුන් වහන්සේ වදාළා තමන් යම් කර්මයක් කළවිට එය තමා පසුපස එන බව සිතන්න කියා. කර්මය දායාදය ලෙස ලැබෙන බව විශ්වාස කළයුතු වෙනවා. මේ පුද්ගලයා නිකරුණේ මට දෙස් කිව්වා. ඔහු කළ දේ ඔහු ගෙනයයි. මම එකට එක කළොත් මටත් විඳවීමට සිදුවෙයි කියා සිතීමෙන් කර්මය පිහිට කරගෙන අකුසල් සිත බැහැර කළ හැකියි.

නයනා නිල්මිණී

# “මෙත් වැඩීමෙන් කොරෝනා දුරලමු”

අනුරාධපුර, උණගස්වැව, සදහම් සෙවණ භාවනා මධ්‍යස්ථානය මඟින් නොමිලයේ නිකුත් කරන සදහම් සෙවණ දහම්පත් මාලාවේ 300 වැනි දහම්පත අනුරාධපුර අටමස්ථානාධිපති, ආචාර්ය පල්ලේගම සිරිනිවාස නාහිමියන් වෙත එම දහම්පත් මාලාවේ සම්පාදක අනුරාධපුර සදහම් සෙවණ භාවනා මධ්‍යස්ථානයේ භාවනා උපදේශක, විශ්‍රාමික අධ්‍යාපනඥ රෝහිත විජයතිලක මහතා විසින් පිළිගන්වන ලදී.

“මෛත්‍රී බෙලෙන් කොරෝනා දුරලමු” නම් මෙම දහම්පත අනුරාධපුර සදහම් සෙවණ භාවනා මධ්‍යස්ථානය මඟින් එළිදක්වන ලද, බුදුදහම ඇසුරෙන් කොවිඩ් - 19 වසංගතය පිටුදැකීමට යොමුකැරෙන 5වැනි දහම්පත වේ.

## වස් සමාදාන පින්කම්

### ශ්‍රී දළදා මාලිගාව



ශ්‍රී දළදා මාලිගාවේ 2021 වසරේ වස් ආරාධනාව තේවාව භාර මල්වතු පාර්ශවයේ කාරක සංඝ සභික තිබ්බටුවාවේ ශ්‍රී මේධංකර නායකහිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නය හමුවේ කටුකැලේ ලේඩිබ්ලේක් ආරාමාධිපතිනි ශ්‍රද්ධා ප්‍රසාදිනී ධම්මචාරී කොත්මලේ සුධර්මා සිල් මෑණියන් වහන්සේ 57 වෙනි වතාවට පිළිගන්වන ලදී. දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මහතාද මේ අවස්ථාවට දායකත්වය දරන ලද අතර කඨින පින්කමේ ප්‍රධාන දායකත්වය දරන්නේ අනුරාධපුර දේවානම්පියතිස්සපුර තිසා වැව තුන්වන පියවර කිරිගෙදර පදිංචි යූ. වජීන්ද්‍ර ප්‍රනාන්දු ඇතුළු හිතමිත්‍රාදීන් විසිනි.

### පල්ලේකැලේ සිරි සම්බෝධිය විහාරය



කුණ්ඩසාලේ පල්ලේකැලේ සිරි සම්බෝධි ධර්මායතන විහාරස්ථානයේ වස් ආරාධනා පින්කම විහාරාධිපති බුලංකුලමේ උපවංශ නාහිමියන්ගේ අනුශාසනා පරිදි පසුගිය දින ඉපැරැණි චාරිත්‍රානුකූලව විහාරස්ථානයේදී සිදු කෙරිණි. පල්ලේකැලේ සාසා නිවාස සංකීර්ණයේ පදිංචි විශ්‍රාමික ඩබ්. එම්. පී. ජී. වික්‍රමසිංහ මහතා හා එම මැතිනිය වස් ආරාධනය කළහ. වස් කාලසීමාව තුළදී කිරි ආහාර පූජා, සත් බුදු වන්දනා, රෝග වසංගතය පහවීමට තුන් සූත්‍ර දේශනා ආදිය පැවැත්වීමට කටයුතු යොදා ඇත.

සුනිල් ගුණවර්ධන – කුණ්ඩසාලේ සමූහ


**හිමිනමක් සඳහා A+ වර්ගයේ වකුගඩුවක් දන්දීම පිණිස**

ගම්පොළ පදිංචි අවු. 23 ක් වයසැති තරුණයෙකු වන මා ගරුතර හිමිනමක් සඳහා වකුගඩුවක් දන්දී දන උපපාරමී පිංකමට දායක වීමට කැමැත්තෙමි.

විමසීම් : 076-0276197

පිං කැමැති ඇත්තෝ සහයෝගය දෙනු ලබත්වා...!

තෙරුවන් සරණයි



**"නිබ්බානයට අත්වැලක්"**

**පමා නොවන්න, ගෝතම බුදු සසුනෙහි නිවන් අවබෝධයට මග හෙලි කරන දහම් පොත නොමිලේ.**

**තරුණ සිසුන්ට, වැඩිහිටි පිරිසට, පුස්තකාලවලට විමසන්න.**

**සීමිතයි.**

**අරියසිහ - 077-3170033**



# මෙත්සවිය

කළුතර අභිනවයෙන් ඉදිකළ මෙත්සවිය සදහම් අරණ සාමනේර භික්ෂු පුහුණු මධ්‍යස්ථානයේ සිල්වත් භික්ෂූන් වහන්සේ නමක් යටතේ

**පැවිදි කිරීම සඳහා වයස 12-15 අතර පිරිමි ළමුන් 15 ක් පමණ අවශ්‍ය වේ.**

මහන කරන සියළු කුලදරුවන් හට හොරණ විද්‍යාරතන පිරිවෙනෙන් අධ්‍යාපනය ලබාදී අවසානයේ ශාසනයේ චිරස්ථිතිය පිණිස වැසුනු පන්සල් නැවත ඇරීමට සහ භික්ෂූන් වහන්සේලා හිඟ පන්සල් වලට කැමති පරිදි යොමු කෙරේ.

**තවද, ස්ථානය රැකබලාගෙන කටයුතු කළහැකි ඉවුම් පිහුම් දන්නා**

**මැදිවියේ හෝ වයසක උපස්ථායක මහතකු ද අවශ්‍ය වේ.**

ආරණ්‍යයෙහි මෝටර් රථය පැදවීමේ හැකියාව අතිරේක සුදුසු කමකි. (මාසික දීමනාව 15/- - 25/- අතර)

**මෙත්සවිය සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා (දු.ක. 0714800800) අමතා (දහවල් 12.00 - 1.00 හෝ රාත්‍රී 9.00 - 10.00 අතර කාලය තුළ පමණි) දැනුම් දෙන්න. විස්තර www.methsaviya.lk වෙබ් අඩවියේ ද ඇත.**


09 පිටුවෙන්...

### බුදුරජාණන් වහන්සේගේ දේශනා විලාසය...

අංගුලිමාලට තවත් දිවීමට නොහැකි තරමට මහන්සි වන තුරු බුදුරජාණන් වහන්සේ දිගට ම සංසුන්ව වැඩියහ. අංගුලිමාල නැවතී ‘මහණ නවතිනු’යි අණ කළේ ය. ‘මා නම් නැවතිලා. ඔබ තමා දුවන්නේ’යි බුදුරජාණන් වහන්සේ වඩිමින් ම වදාළ සේක. අංගුලිමාල විමතියට පත් විය.

‘ගමන් කරන ඔබ නැවතී සිටින බවත් නැවතී සිටින මා දුවන බවත් කියා බොරුවක් කියන්නේ ඇයිදැයි අංගුලිමාල විමසුවේ ය.’

‘ක්ෂාන්ති මෛත්‍රියෙහි පිහිටා කෙලෙස් සිඳ දමා මා සසර ගමන නවතා සිටිමි. ආයුධ රැගෙන හිංසාකාරී ලෙස හැසිරෙන ඔබ දැන් ඔය විධියට නැවතී හිට ගෙන සිටියත් ඔබ සසර දුවන්නෙහි’ ය යනු බුදුරදුන්ගේ පිළිතුර විය. අංගුලිමාලට තම අරමුණ අමතක විය. ඔහු බුදුරදුන් හැඳින ගත්තේ ය. ආයුධ ඉබේ ම බිම පතිත විය. ඔහු බුදුරදුන් වෙත ගොස් බිම වැටී වැන්දේ ය. ඔහුගේ මානසික වාතාවරණය ධර්ම ශ්‍රවණයට සුදුසු සේ සැකසිණ.

මෛත්‍රිය පැතිරවීමෙන්, සුහද සල්ලාපයෙන්, සාපිපාසාවෙන් පෙළෙන්නන්ගේ සාපිසාසා නිවීමෙන්, අවාසනාවන්ත ඉරණමකට හසුව වියරුවෙන් තමන් වෙත දුව එන්නන් සංසුන් කරමින් බුදුරජාණන් වහන්සේ සත්වයනට ශාන්තිය සැලසූහ.

පුද්ගලයන් කීප දෙනෙකු එකවර ප්‍රශ්න ඇසූවත් ඒ හැමට පැහැදිලිව සැණෙකින් පිළිතුරු දීමට බුදුරජාණන් වහන්සේට තිබූ හැකියාව පෙළ අටුවාව මෙන් ම සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථවල ද විස්තර වේ.

### පෝය ලබන සහ ගෙවෙන අයුරු

| ඇසළ අව අටවක | ඇසළ අමාවක |
|---|---|
| ජූලි 31 සෙනසුරාද පූර්ව භාග 05.40 අව අටවක ලබා පසුදා පූර්වභාග 07.56 ගෙවේ. සෙනසුරාදා සිල්. | අගෝස්තු 07 සෙනසුරාද අපර භාග 19.11 අමාවක ලබා 08 ඉරිදා අපරභාග 19.19 ගෙවේ. ඉරිදා සිල්. |

## ගැබිනි මාතාවන්ට උපකරණ ප්‍රදානයක්



ජාත්‍යන්තර සිංහ සමාජ 306 සී2 දිස්ත්‍රික් මහරගම සෙන්ට්‍රල් සිංහ සමාජය, 23/07/21 ඇසළ පෝය දිනයේ වැල්ලවායේ මූලික රෝහලේ වෛද්‍ය ජගත් පුෂ්පකුමාර මහතාගේ ඉල්ලීම පරිදි වෛද්‍ය ඕමාලි ස්වර්ණනායක මහත්මියගේ සම්බන්ධීකරණයෙන් කොවිඩ් 19 ආසාදිත රෝගීන් සඳහා පරිහරණය කිරීමේ වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම සහ වටිනා ත්‍යාග පාර්සලයක් ගැබිනි මාතාවන් 50 දෙනෙකු සඳහා ලබා දීම සිදු කරන ලදී.

# සිරි සදහම් මඟ හැඳින සතර අපායෙන් මිදෙමු

**වර්තමානයේ බොහෝ බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ට යම් වූ ද දහම් දැනුමක් වේ. ඒ වගේ ම ප්‍රතිපදා මාර්ගයෙහි ගමන් කරමින් සිටින්නෝ ද වෙති. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ නොසිටින බැවින් සිහිනුවණින් යුතුව නිවැරැදි ම වූ ධර්ම මාර්ගය වටහා ගෙන ගමන් කළ යුතු වන්නේ ය.**

මෙම කරුණේදී බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාරණ ලද සතර මහෝපදේශ පිළිබඳව ද සිහිපත් කළ යුතු ය. ඒ ධර්ම විනය පිළිබඳව මනා වූ පරිණත වූ ද, පිළිපන් වූ ද, ඵල ලැබුවා වූ ද, එක් නමක්, දෙනමක් හෝ බොහෝ තෙරවරු සමඟ සාකච්ඡා කරමින්, ඇසුරු කරමින්, සක්කායදිට්ඨිය බැහැර කරන්නෙමි' යි වූ මාර්ගයට පැමිණිය යුතු වන්නේ ය.

තණ්හා, මද, මාන, දිට්ඨි බැහැර කර ගනිමින් චිත්ත පාරිශුද්ධිය උදෙසා සතිය හෙවත් සතර සතිපට්ඨානයේ උගන්වන සිහිය පිහිටුවීම ප්‍රගුණ කළ යුතු වන්නේ ය. අප බුදුරජාණන් වහන්සේ විසින් සර්වඥතා ඤාණයෙන් යුතුව මහා කරුණාවෙන් මේ සසරෙහි ඇති බියකරු බව ගැන දෙසූ දහම නැවත නැවතත් අවබෝධයෙන් යුතුව මෙනෙහි කළ යුතු වන්නේ ය. කෙළවරක් දකින්නට නොමැති මේ සසරෙහි මුලක් අගක් නොපෙනේ.

සියලු සංඛත සංඛාර ධර්ම, අනිච්ච, දුක්ඛ අනත්ත නම් වූ ත්‍රිලක්ඛණ ධර්මයන්ට යටත් කොට නුවණින් දැක ගන්නට නොහැකි සත්වයෝ අවිද්‍යාවෙන් යුතුව, නැවත නැවතත් සසරට බැඳී ගමන් කරති. සැරිසරති. මේ ඇවිද යන භව ගමනේ තිස් එකක් සක්වල සියලු සත්වයෝ වැඩිපුර ම උපත ලබා ඇත්තේ නරක, තිරිසන්, ප්‍රේත, අසුර නම් වූ සතර අපායේ බව බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සේක.



> සියලු සත්වයෝ ම මේ සසරේ බලවත් ලෙස දුක්විඳ ඇත්තෝ ය. මහත් වූ ව්‍යසනයන්ට ද ලක් වූවෝ ය. මිය යන්නට යෙදුණු මළ සිරුරුවලින් මේ මහ පොළොවේ සෑම බිම් අඟලක් ම සුසානයක් බවට පත්ව ඇත්තේ ය. අනන්ත සසරෙහි දීර්ඝ කාලයක් දුක් විඳ ඇත්තේ ය. මෙවැනි බියකරු සසරෙහි ගමන් කරමින්, මේ මිනිස් ලොව ඉපදී මව් ලෙස හමු නොවුණ කෙනෙක් පියා ලෙස හමු නොවුණ කෙනෙක් සොයාගත නොහැකි ය.

සියලු සත්වයෝ ම මේ සසරේ බලවත් ලෙස දුක්විඳ ඇත්තෝ ය. මහත් වූ ව්‍යසනයන්ට ද ලක් වූවෝ ය. මිය යන්නට යෙදුණු මළ සිරුරුවලින් මේ මහ පොළොවේ සෑම බිම් අඟලක් ම සුසානයක් බවට පත්ව ඇත්තේ ය. අනන්ත සසරෙහි දීර්ඝ කාලයක් දුක් විඳ ඇත්තේ ය. මෙවැනි බියකරු සසරෙහි ගමන් කරමින්, මේ මිනිස් ලොව ඉපදී මව් ලෙස හමු නොවුණ කෙනෙක් සොයාගත නොහැකි ය. පියා ලෙස හමු නොවුණ කෙනෙක් සොයාගත නොහැකි ය. දුව, පුතා, සොහොයුරිය හා සොහොයුරා ලෙස හමු නොවුණ කෙනෙක් සොයා ගත නොහැකි ය. ඒ වගේ ම තමන් මනාප වූ යම් දෙයින් වෙන්වන විට, අමනාප වූ යම් දෙයක් සමඟ එකතු වන විට වැගිරූ කඳුළු කොතරම් ද? සිව් මහා සාගරයේ ජලයටත් වඩා වැඩි වන්නේ ය.

ඒ වගේ ම අවිද්‍යාව නිසා, එනම් සියලු සංඛත, සංඛාර වස්තූන් ත්‍රිලක්ෂණයට යටත් කොට දැක රාගාදී කෙලෙසුන් සමනය කර ගැනීමට නොහැකි වීම නිසා ඤාති ව්‍යසනයේදී භෝග ව්‍යසනයේදී, ඒ වගේ ම ලෙඩදුක් නිසා අපමණ දුක් වන්නේ ය. කඳුළු වගුරන්නේ ය. ශෝක වන්නේ ය. වැළපෙන්නේ ය. මුළාවට පත් වන්නේ ය. මේ ආකාරයෙන් අවිද්‍යාවට ම හසුව සිටීමෙන් මේ ගමන් කරන්නේ කෙළවරක් දකින්නට නැති බියකරු ගමනක නේද?

අවිද්‍යාව නිසා ම අකුසල් රැස්ව සතර අපායෙහි, අවීචිය වැනි නරකයක උප්පත්තියක් ලැබුවොත්, යම් අවස්ථාවක කල්ප ගණනාවක් අපමණ දුක් විඳින්නට වන්නේ ය. නරක, තිරිසන්, ප්‍රේත, අසුර නම් වූ සතර අපායේ බියකරු බව කෙතරම් ද?

අපි ඒ බියකරු වූ සතර අපායෙන් දුරස්ථ ව මනුෂ්‍ය ආත්මයක් ලබා සිටිමු. සම්මා සම්බුද්ධත්වය ලැබිය හැකි වන්නේ ද මනුෂ්‍යයකුට ම පමණි. අප උපතින් ලද ශරීරයේ වර්ණය, හැඩය කුමක් වුව ද දුර්ලභ වූ මනුෂ්‍ය ජීවිතයක් ලබා ඇති බව නිතර සිහිපත් කරමු. මේ ආකාරයෙන් සිහිකර බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් දේශනා කළ මාර්ගයට යොමු වූ ශ්‍රාවකයන් බවට පත්වෙමු.

බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන් වෙතින් අසන ලද ප්‍රශ්නයක් වේ. ඒ "කුල ධර්මයන්හි අප්‍රමාදීව, කෙලෙස් නවන වීර්යයෙන් යුතුව නිවන් පිණිස මෙහෙයවන සිත් ඇතිව වාසය කරන්නේ ද" යන්නයි. මෙම උතුම් ප්‍රශ්නයට අවබෝධයෙන් යුතුව නිවැරැදි පිළිතුරක් ලබා දීමට හැකි දැයි අපි අපේ සිතින් ම විමසා බලමු. "බුද්ධං සරණං ගච්ඡාමි" යන්නෙන් සිහිකරන සෑම විට ම අවබෝධයෙන් බුදුරජාණන් වහන්සේ සරණ යන්නේ දැයි සිහි කරන්න. "ඉතිපි සෝ භගවා අරහං" නව අරහාදී බුදුගුණ සිහි කරන සෑම විටක ම අවබෝධයෙන් බුදු ගුණ දැන මෙනෙහි කරන්නේ ද? ඒ අපමණ වූ බුදුගුණ තම සිතට කැඳවා ගැනීමට වීර්යය වඩන්නේ ද යන්න සිහිපත් කරන්න.

බුදුගුණ, සදහම් ගුණ, සඟගුණ අවබෝධයෙන් යුතුව මෙනෙහි කරන්නෙක් නම් චතුරාර්ය සත්‍යය අවබෝධයෙන් නිවනට මඟ සකස්වනු ඇත. අප බොහෝ කෙනකුට පවතින්නේ අනුමානයෙන් ඇතිකර ගන්නා වූ ඤාණ ශක්තියයි. මෙය ප්‍රත්‍යක්ෂ ඤාණයක් බවට පත් කර ගැනීමට නම්, ධර්ම විනය, ශාස්තෘත්වයේ පවත්වාගෙන කල්‍යාණ මිත්‍ර ගුරු ඇසුරක් ඇතිව නිවන ම අරමුණු කරගනිමින් සිත සහ සතිය පැවැත්වීම අවශ්‍ය ම ය.

සද්පුරුෂ ඇසුර, සද්ධම්ම සවණ, යෝනිසෝ මනසිකාරය, ධම්මානුධම්ම පටපත්ති, අනුගමනය කිරීම අවශ්‍යයයි. මේ මඟ ශ්‍රාවක ශ්‍රාවිකාවන් සියලු දෙනාට ම එකසේ ම ය. අප්‍රමාදීව වාසය කරන්නෝ වෙමු'යි තම සිතින් බුදුරජාණන් වහන්සේට පිළිතුරු දීමට මෙය ම අවස්ථාවකි.

**දීපා පෙරේරා**

## කවරයේ කතාව



මිසදිටු බමුණෙක් අචිරවතී ගඟ අද්දර කුඹුරක් සකස් කළා. පිඬු පිණිස වඩිනා බුදුරජාණන් වහන්සේ, යම් දිනක මේ බමුණාගේ මේ ගොයම් නැසෙන බව ද, එයින් බමුණා ශෝකයට පත්වන බව ද, අනතුරුව බණ අසා සෝවාන් වන බව ද නුවණින් දුටු සේක.

මිසදිටුවකු වූ මේ බමුණා ගේ සිත ක්‍රමයෙන් මෘදු කරනු පිණිස බමුණා බිම් නඟන කෙතට බුදුරජාණන් වහන්සේ වැඩි සේක. බමුණා බුදුරජාණන් වහන්සේ දැක තුෂ්ණීම්භූත විය. බුදුරජාණන් වහන්සේ ඔහු අමතා බ්‍රාහ්මණය, කුමක් කෙරෙහි දැ?යි ඇසූ සේක. එවිට පින්වත් ගෞතමය කෙතක් ඉදි කරමියි කීය.

වපුරන නෙළන කාලයන්හි ද ගොයම් රක්නා කල්හි ද බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට කුමක් කරන්නේ දැ?යි අසන සේක. බමුණා ද තමා කරන කටයුත්ත මේ මේ යැයි පවසයි. යළි යළි වැඩමවා තොරතුරු විමසති. එසේ විමසන බුදුරජාණන් වහන්සේට දිනක් පින්වත් ගෞතමයිනි, බිම් ඉදි කරන කාලයේ සිට ඔබ වහන්සේ මෙහි යළි යළි වැඩමකොට පිළිසඳර කතා කරති. එබැවින් මේ කුඹුර පැසුණු විට ඔබ වහන්සේටත් කොටසක් පූජා කරමි. ඔබ වහන්සේට නොදී නො කමි. ඔබ වහන්සේ මෙතැන් පටන් මගේ යහළුවකු යැයි බමුණා පැවසී ය.

කල් යෑමේ දී ගොයම් පැසුණේ ය. හෙට ගොයම් කපන්නෙමි"යි සිතා සැරැසී සිටි නමුත් රෑ මහ වැසි වැස ගොයම් සියල්ල වැහි වතුරේ ඉදිරී ගසා ගෙන ගියේ ය. කුඹුර හිස් විය. පසුදා මෙය දුටු බමුණාට බලවත් ශෝකයක් ඇති විය. "මම කුඹුර ඉදි කිරීමේ සිට ගෞතමයන් වහන්සේ මෙහි වැඩි සේක. ගොයම් පැසුණ කල බුදුරජාණන් වහන්සේට කොටසක් පූජා කරන බව ද පැවසීය. අහෝ ඒ මා තුළ වූ බලාපොරොත්තු සියල්ල සුන් වී ගියා යැයි සිතමින් කෑම ද නොකා තැවි තැවී යහන් ගැබෙහි සිටියේ ය.

බුදුරජාණන් වහන්සේ බමුණාගේ ගෙදරට වැඩි සේක. ඒ බව දැන ගත් බමුණා උන් වහන්සේ කැඳවා වාඩිවෙන්න සලස්වන්නැයි පිරිවර ජනයාට අණ කළේ ය. බුදුරජාණන් වහන්සේ ද වැඩහිඳ බමුණා කැඳවා 'කිමෙක් ද බ්‍රාහ්මණ යැ යි වදාළ සේක'.

ඒ අවස්ථාවේ දී, කෙත ඉදිකිරීමේ සිට සියලු පුවත් පැවසුවා. ගොයම පැසුණී නම් මම ඔබ වහන්සේට කොටසක් පූජා කරමියි කීය. එය ඉටු කළ හැකි නොවෙමි.ගොයම නැසුණාටත් වඩා මා ඒ ගැන මහත් වූ ශෝකයට පත් ව හිඳිමි යි කී ය.

බමුණ, ශෝකයට හේතුව දන්නෙහිදැ'යි බුදුරජාණන් වහන්සේ අසා වදාළ සේක. නො දනිමි, ඔබ වහන්සේ දනිත් දැ'යි බමුණා විමසීය. එසේ ය, මම දනිමි යි වදාරා බ්‍රාහ්මණය, ශෝකය හෝ භය හෝ කුමක් වුවත් ඒ සියලු දුක තෘෂ්ණාව හේතුවෙන් උපදින්නාහ. යැ'යි වදාරා දම් දෙසා බමුණා සැනැසූ සේක. බුදුරජාණන් වහන්සේගේ දේශනාවසානයේ දී බමුණා සෝවාන් ඵල ලැබීය.

**- දීපා**

# ගැමුණු කුමාරයාට රජ කුමරියක්

**දුටුගැමුණු මහ රජතුමා 41**

"සිරිනාග එවා තිබූ තල්පතේ රහස් තොරතුරු පිළිබඳ ඔබ වහන්සේගේ අවධානය යොමුකරන එක හොඳයි. ඒ වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග ප්‍රමාද කරන්නට හොඳ නැහැ."

ත්‍රිපිටක තිස්ස තෙරුන් වහන්සේ එම රහස් තොරතුරු අතර වැදගත් කරුණු දෙකක් ගැන යම් යම් පියවර ගත යුතු බවයි මගේ අදහස. දීඝාභය මගින් තිස්ස කුමරු අවනත කරගෙන දීඝවාපිය ප්‍රාන්ත රාජ්‍යක් වීමට ඉඩ දෙන්නට බැහැ."

ඔව්, ඒ පිළිබඳ ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක්ම තියෙනවා. තිස්ස කුමරුට දීඝාභය හමුවීමට මේ වනතුරුත් අවස්ථාවක් ලැබී නැති බවයි මගේ අවබෝධය. රජතුමා අවසන් හුස්ම හෙළන මොහොතේ දීඝාභය කුමාරයා හදිසියේම දිගාමඩුල්ලට ගියේ ඇයි? ඔහු ආපසු පැමිණියේ කුමන තීරණයක් අරගෙනද?"

"තිස්ස අපට වෙනස් කරගන්න බැරිද?"

"ඇයි බැරි? මට ඒක කරන්න පුළුවන්. නමුත් ඒ සඳහා තිස්ස හමුවන්නට ඕනෑ. හෙට හවස ඔහු හමුවේවි."

"අපි උත්තර මහ ඇමතිතුමාට කියමු කෙසේ හෝ තිස්සට දීඝාභය කළ මෝඩකම් කරන්නට එපා කියා අවවාද කරන්නටත් දීඝාභය කුමරු තමන් කළ මෝඩකම අවබෝධ වී ඒ ගැන පශ්චාත්තාප වන බව අවබෝධ කරවන්නත්."

ඒ උත්සාහයෙන් ප්‍රතිඵලයක් නොලැබුණොත් කුණ්ඩල බ්‍රාහ්මණතුමා මගින් දීඝාභය කුමරු වෙනස් කර ගන්නට බලමු."

මේ සිදුවන දේවල් කාලයට ඉඩදී බලාගෙන ඉඳිමු. නැතිනම් කුණ්ඩල බ්‍රාහ්මණතුමා මගින් දීඝාභය වෙනස් කරන්නට බලමු.

කුණ්ඩල බ්‍රාහ්මණතුමා ජාත්‍යන්තර වෙළඳ ශ්‍රේණියක නායකයෙක්. ඉතා ලාභ ලබන වෙළඳ ආයතන කිහිපයක හිමිකම් දරන මහා සිටාණෝ කෙනෙක්. ඔහුගේ ගුරුකුලය උසස් එකක්. රජයේ ඉහළ තැන්වලට පත් වන බොහෝ පිරිසක් එම ගුරුකුලයෙන් බිහිවන අය බව ප්‍රකට කරුණක්. නමුත් එතුමා කිසිම දේශපාලන කටයුත්තකට සම්බන්ධ නොවීමේ ප්‍රතිපත්තිය තිසි ලෙස රකිනවා."

නමුත් සිංහල බෞද්ධ ජනතාවට හානිදායක තැන් වලදී කුණ්ඩලි බ්‍රාහ්මණතුමා ඉදිරිපත් වන බව මට මතකයි. ප්‍රධාන යුද කඳවුර මහමෙව්නාව අසලට ගන්නට සූදානම් වූ අවස්ථාවේ එයට විරුද්ධත්වය පළ කළා. දීඝාභය කුමරු එළාර රජු යටතේ මහා සෙනෙවියකු වී තමන් හමුවීමට පැමිණි අවස්ථාවේ බැන වැදී එළවාගත් බව අපට දැනගන්නට ලැබුණා."

දීඝාභය වගේම උපතිස්සත් අපෙන් වෙන්වීම විශාල පාඩුවක්. දෙදෙනාම වැරදි අවබෝධය නිසා විරුද්ධ පිලට එක් වුණු අය. එය ඔවුන්ට අවබෝධ කරවීම කල් ගනිමින් සීරුවෙන් කළ යුතු වැඩක්. සිරිනාගට එය කරන්නට හැකිද?"

"සිරිනාග ශූරයි. ඔහු එළාර රජුගේ සිත් දිනාගත් ශූරයෙක්. මෙහිදී ඔහු එය කළ යුත්තේ වෙනත් මගකින්."

"දීඝාභය, දුටුගැමුණු දෙදෙනාම කුඩා කළ සිටම විරුද්ධ ආකල්ප දරමින් වැඩුණේ. දීඝාභයගේ මව මැරුණු පසු දුටුගැමුණුත් දීඝාභයත් හැදුණේ එකට. විහාර මහා දේවිය ඔවුන් තිවුන් දරුවන් ලෙස සිතා ඇති දැඩි කළත් රාජ්‍ය හිමි කුමරු ලෙස දුටුගැමුණුට ලැබුණු විශේෂ සැලකිල්ල නිසා දීඝාභය හීනමානයෙන් පෙළුණු කෙනෙක්. ඒ නිසයි ඔහු තුළ විරුද්ධ ආකල්ප ඇතිවුණේ."

"කාලය විසින් බොහෝ ප්‍රශ්න විසඳනු ඇත. දීඝාභය හෙමින් සීරුවේ වෙනස් කරගන්නට උත්සාහ කරමු. තිස්ස හෙට උදේ පැමිණි පසුව අපි මේ ගැන තවදුරටත් කතා කරමු. ගැමුණු කුමාරයාට විරුද්ධව කුමක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීම වරදක් බව පෙන්වා දෙමු."

මෙතෙක් වේලා චෛත්‍ය මලුවේ සක්මන් කරමින් සාකච්ඡාවේ යෙදී සිටි ආචාර්ය හිමිවරුන් වෙත, ශිෂ්‍ය හිමිනමක් පැමිණ ගිලන්පස සූදානම් වී ඇති බව දැන්වූයෙන් මාහිමිවරු සිලාපස්ස පිරිවෙනට ඇතුළු වූහ.

නගරයෙන් ගෙන්වා ගත් අවමංගල්‍ය සැරසිලිකරුවන් කිහිප දෙනෙකු සමග ථේරපුත්තාභය, සූරනිමල මහා සෙනෙවිවරුන් පැමිණියේ ය. ඔවුන් පසුපසින් රන්සිවිගෙය චිතකය ආදිය තැනීමට අවශ්‍ය උපකරණ රැගත් ගැල් කිහිපයක් ද ආවේය.

කටයුතු සියල්ල අසල පිරිස් වෙත පැවරීමෙන් අනතුරුව ස්වාමින් වහන්සේලා දෙදෙනා සැය ඉදිකෙරෙන තැනට ගියහ. ආදාහන උත්සවය සඳහා වැඩම කරන පන්දහසකට අධික ස්වාමීන්වහන්සේලාට සොහොනෙහි උතුරු පැත්තේ පහසුකම් සැලසෙන අතර, සිව්රඟ සේනා ඇතුළු වාදක මණ්ඩලයට දකුණු පැත්ත වෙන්කිරීමට තීරණය විය. රාජ්‍ය නායකයන්ට හා ප්‍රභූන්ට බටහිර පැත්ත හා රජ පවුලේ සියලු දෙනාට නැගෙනහිර පැත්තද වෙන් කිරීමට උපදෙස් ලැබිණි. අවමඟුල් කටයුතු ඉතා චාම් ලෙස කිරීමට තීරණය කෙරිණි. එකම අනුශාසනාවකින් අවමංගල සභාවේ කටයුතු අවසන් කිරීමටත් සැවොම එකඟ වූහ. අනුලා දේවියගේ පුතුන් දෙදෙනෙකු විසින් චිතකයට ගිනි දැල්වීම සිදු කිරීමටත් තීරණය කෙරිණි.

"කාවන්තිස්ස රජතුමා මියගියා" යන පුවත තිල නිවේදනයක් ලෙස ප්‍රචාරයට පත් වූයේ ආදාහනයෙන් දින පහකට පසුව ය. රුහුණු ජනපද වාසීන්ගේ ශෝකය දරාගත නොහැකිව රජ මාළිගය දෙසට ජනතාව ඇදී ඒම වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර මහා සෙනෙවිවරු විසින් ගෙන තිබිණි.

සුදු මල් වට්ටියක් අතින් ගත් ජනතාව තිස්ස මහා චෛත්‍ය වෙත මල් පුදා කාවන්තිස්ස රජතුමාගේ සොහොන වෙත ගොස් පින් පැමිණ වූහ. සති ගණනක් පුරා මේ සිදුවීම අඛණ්ඩව පැවතිණි.

මේ වන විට ත්‍රිපිටක තිස්ස තෙරුන් වහන්සේ ප්‍රකාශ කළ අනාවැකි එලෙසම සිදුවෙමින් තිබිණි. තිස්ස කුමාරයා රජතුමාගේ ආදාහනය පැවති දිනට පසුදින හිමිදිරියේම දීඝවාපිය බලා පිටත් විය. ඒ තනිවම නම් නොවේ. මව්බිසව හා කඩොල් ඇතු ද සමඟය. මාගම රාජධානියේ ශ්‍රේෂ්ඨතම කාන්තාව වන විහාර මහා දේවිය හා මංගල හස්තියා රැගෙන යාම මාගම රාජ්‍ය තමන් වෙත පවරා ගැනීමක් බඳු විය.

මාගම රාජ්‍ය සත්දිනකට වඩා අරාජිකව නොතැබිය යුතුය යන්න අමාත්‍ය මණ්ඩල තීරණය විය. ගැමුණු කුමාරයා සොයා රාජ දූතයන් පිටත් කර යැවීමට වඩා මංගල හස්ති රාජයා සරසා යවා රාජ්‍ය හිමි කුමාරයා ගෙන්වා ගැනීම සුදුසු බව ඒකමතික ව තීරණය විය.

ඇසළ මස පුර පසළොස්වක පොහොය දිනයේ තෝරාගත් මංගල හස්ති රාජයකු සරසා සිව්සැට ආභරණ, ඔටුණු, රජ ඇඳුම් සහිතව පංචතූර්යවාදකයන් පෙරටු කරගෙන අමාත්‍ය මණ්ඩලය ද ආරක්ෂක සේනා සහිතව ගමන් ඇරඹිණි.

රජ මාළිගයෙන් පිටත්ව මඟුල් ඇතු රජ මාවත ඔස්සේ ගමන් කළේය. අනුරාධපුර රජ වීදියට පැමිණ එතැනින් කොත්මලේ දෙසට වේගයෙන් ගමන් කළේය. ගම්වැසියෝ මග දෙපස එක් රැස්ව තමන්ගේ අනාගත වීරයා වන දුටුගැමුණු කුමාරයා කැඳවාගෙන එන්නට යන රජ පෙරහර දෙස මහත් අපේක්ෂාවෙන් යුතුව බලා සිටියහ.

තිස්ස කුමාරයා විසින් කරන ලද අසම්මත ක්‍රියාවෙන් සියලු දෙනා මහත් කලබලයටත්, කළකිරීමටත් පත් වූව ද කිසිවකුත් ඒ ගැන කතා නොකළේ විහාරමහා දේවියද තිස්ස කුමාරයා විසින් කැඳවාගෙන ගොස් තිබූ බැවිනි.

"සියලු ආරක්ෂක සේනා සීරුවෙන් තබන්න." වේළුසුමන කිවේය. මංගල හස්ති රාජයා පිටත් වී හෝරාවකට පමණ පසු සිව්රඟ සේනාංකවලින් කොටසක් පෙරමගට ගමන් කිරීමට සූදානම් කරන ලෙස වේළුසුමන දැනුම් දුන්නේ ය.

ඒ අනුව ඇතුන් දෙසියයක්, අසුන් තුන්සියයක්, අස්රිය සියයක් හා පාබල සේනා තුන් දහසක පිරිසක් පංචතූර්ය වාදක කණ්ඩායම් සහිතව ඉදිරියට ගමන් කළහ.

දුටුගැමුණු කුමාරයාගේ රාජාභිශේක උත්සවයේ කටයුතු සියල්ල කාම්බෝජ පඬිතුමාට පවරා තිබිණි. ක්ෂත්‍රිය කුමරියක දුටුගැමුණු කුමාරයාගේ බිසව ලෙස අභිෂේක කළ යුතු බව මහා ඇමතිවරුන්ගේ අදහස විය.

දුටුගැමුණු කුමාරයා මාගමට පැමිණෙන්නේ ගොවි රැජිණියක සමඟ බව කී වේළුසුමන ඒ නිසා අභිෂේකයට වෙනත් කුමරියක් අවශ්‍ය නැතැයි පැවසිය. නමුත් කාම්බෝජ පඬිතුමා විසින් ඒ අදහස ප්‍රතික්ෂේප කෙරිණි.

ගැමුණු කුමාරයාත් එම තීරණයට එකඟ විය. හැකි වුවත් සාම්ප්‍රදායට අනුව රජ කුමරියක් අවශ්‍යයි. ගොවි රැජිණියටද සිත නොරිදෙන අයුරින් ඇයද අභිෂේක කරමු. ඒ සඳහා කාගේත් එකඟතාව හිමි විය.

කතරගම අභය නාග – අනුලා රාජකීය යුවළගේ දියණිය වූ රජිතා කුමරිය සමග ගැමුණු කුමාරයා ප්‍රිය මනාපව ඇසුරු කළ බව හරණ විසින් සඳහන් කරන ලදී. ඒ අනුව අභිසේක මංගල්‍ය සඳහා අභයනාග රජුට අනුලා දේවිය සමග පැමිණීමට ආරාධනා කෙරුණු අතර රජිතා කුමරිය ගෙන්වාගෙන සමන්තා කුමරියගේ ඇසුරට පත් කිරීමටත් උත්තර මහා ඇමතිතුමාට අවසර ලැබිණි.

**අයන්ති විතාන**

## සිරි සදහම් පැන විසඳුම්

සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරු ලියා එවා ගුණසේන සහ සමාගමෙන් පිරුවානා පොත් වහන්සේ නම් යුත් "මහ පිරිත් පොත් වහන්සේ" හිමිකර ගන්න.

**සතිපතා ජයග්‍රාහකයන් පස් දෙනකුට ත්‍යාග තිළිණ කෙරේ.**

බුදුසරණ

සතියේ ප්‍රශ්නය – 56

**දස පින් කිරියවත් නම් කරන්න?**

පිළිතුර : ..........................................

නම : ..........................................

නිවසේ ලිපිනය : ..........................................

..........................................

දුරකතන අංකය : ..........................................

ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

ඇම්. ඩී. ගුණසේන – බුදුසරණ සිරි සදහම් පැන විසඳුම්, බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10

# පිරිස් බලය ලබන්න නම් දන් දෙන්නේ මෙහෙමයි



**ලොව උපන් හැම සත්වයකු ම දුක සහ සැප අඩු වැඩි වශයෙන් ලබයි. ඇතැම්හු අධික දුකත්, තවත් අයෙක් අධික සැපත් මරණය දක්වා ම හිමි කර ගනිති. කෙනෙක් සැප නො ලැබුවත් පරිවාර සම්පත් සහිත වෙති. කෙනෙක් පරිවාර සම්පත් නො ලැබුවත් අධික සැප සම්පත් ලබති. කෙනෙක් පරිවාර සම්පත් සමඟ භෝග සම්පත් ද ලබති.**

අයෙක් නායකත්වය හෝ සැප සම්පත් හෝ වෙනත් ඕනෑම භෞතික සම්පත්තියක් ලැබුවත් කිසිවකුත් තමාට සහාය දැක්වීමට ඉදිරිපත් නො වෙති. හුදකලාව ජීවත් වෙති. එහෙත් සමාජයේ ඇතැම් පුද්ගලයින් භෞතික සම්පත්වලින් දුප්පත් ය. පරිවාර සම්පත් හෙවත් සේනා සම්පත්තියෙන් පොහොසත් ය. අයෙක් පිරිස් බලයෙන් සහ භෞතික බලයෙන් ශක්තිමත් ය.

මරණය දක්වා කිසිදු දුකක් නොමැති ව සැප සේ ජීවත් වෙති. සමාජයේ විවිධ ස්ථරවල සිට දුක සහ සැප විඳින පුද්ගලයින් නිතර දක්නට ලැබෙයි. තමා කළ පෙර පින් ඇති බව සහ නැති බව ම එයින් පෙනෙයි. කෙනෙකුගේ සේනාසම්පත්තිය හෝ භෞතික සම්පත් හෝ දැක ඔවුන්ට ඊර්ෂ්‍යා කිරීමෙන් හෝ ක්‍රෝධ කිරීමෙන් හෝ සොරකම් කිරීමෙන් හෝ ඒවා විනාශ කිරීමට සිතීමෙන් හෝ එසේ කිරීමෙන් ඵලක් නැත.

කොපමණ අහිමි වුවත් පෙර කළ පින් ඇති බැවින් ඒවා විපාක දෙන්නේ ය. එබැවින් කුමන දුකක් හෝ සැපක් හෝ වින්දත් සසර සුගතිය වෙනුවෙන් හැකි අයුරින් පින් කර ගත යුතු ය. බුදුරජාණන් වහන්සේ මේ පිළිබඳ කරුණු පැහැදිලි කරමින් එක් උපාසකයකු අරබයා ධර්ම දේශනාවක් පැවැත්වූහ. එම ධර්ම දේශනාව මෙසේ ය.

බුදුරජාණන් වහන්සේ ලෝක සත්වයාගේ යහපත වෙනුවෙන් පිණ්ඩපාත චාරිකාවේ යෙදෙමින් ආහාර සපයා ගත්හ. තම ශ්‍රාවකයන් වහන්සේලාට ද උතුම් ගුණය පුරුදු කළහ.

සැවැත් නුවර වැසියෝ බුදුරජාණන් වහන්සේ සහ ශ්‍රාවක සංඝයා වහන්සේලා පිණ්ඩපාත චාරිකාවේ යෙදෙන බැවින් සැම දිනකම පිණ්ඩපාතය පිළිගැන්වීමට පුරුදු වී සිටියහ. දිනක් බුදුරජාණන් වහන්සේ එක් උපාසකයකුගේ නිවසකට වැඩම කර දන් පිළිගත්හ.

අනතුරුව උපාසකයා අමතා "පින්වත් උපාසකය, අද මේ ධර්මය ඔබට දේශනා කරමි. මෙ ලොව දන් දෙන යම් කෙනෙක් වේ ද? ඔහු තමා සතු සම්පත් පමණක් වැය කරමින්, සෙසු අය සම්බන්ධ කර ගැනීමකින් තොරව දන් දෙන්නේ ද? ඔහුට සසරෙහි දී භෝග සම්පත් පමණක් ලැබෙයි. එහෙත් යමෙක් තමාගේ පින්කමට අන් අයත් සම්මාදම් කරවාගෙන දන් දෙයිද? ඔහුට භෝග සම්පත් සහ සේනා සම්පත් දෙක ම හිමි වන්නේ යැයි දේශනා කළහ.

මෙය අසා සිටි නුවණැති එක් පුරුෂයෙක් බුදුරජාණන් වහන්සේ දන් පිළිගෙන නිවසින් බැහැරව වඩිනු දැක වහා පසුපසින් දිව ගියේ ය. බුදුරජාණන් වහන්සේ ඉදිරියේ සිට වන්දනා කර

"ස්වාමිනි, හෙට දින මාගේ නිවසට දනට වඩිනු මැනවි" යි ආරාධනා කළේ ය.

බුදුරජාණන් වහන්සේ නිශ්ශබ්දව ආරාධනාව පිළිගෙන කොපමණ භික්ෂූන් වහන්සේලා ප්‍රමාණයක් වැඩම කළ යුතු ද? යි විමසූහ. එවිට උපාසක පවසන්නේ "ස්වාමිනි, ආරාමයේ වැඩ සිටින සියලු ම භික්ෂූන් වහන්සේලා වැඩම කරවා දෙන්නැ' යි ආරාධනා කළහ. ඉන් පසු බුදුරජාණන් වහන්සේ භික්ෂූන් සමඟ ආරාමයට වැඩියහ. උපාසක තෙමේ වහා අවශ්‍ය කටයුතු සූදානම් කළේ ය.

තම නිවසේ ආසන පැනවීම්, සැරසිලි කිරීම් ආදිය පිරිසකට පැවරී ය. තවත් පිරිසක් අමතා ගමෙහි විවිධ මාර්ග ඔස්සේ යවමින් සෙසු අයගේ උදව් ලබා ගැනීමට යොමු කරවීය. උපාසක තෙමේ තවත් කිහිප දෙනෙකු සමග නගරයේ කඩ වීථියේ මුදලාලිලාගෙන් මුදල්, හාල්, පොල්, කිරි සහ පැණි ආදිය එකතු කරමින් ගියේ ය.

ක්‍රමයෙන් වීථියේ සැරිසරන විට එම පුවත වහා නගරය පුරා පැතිර ගියේ ය. විවිධ අදහස් ඔවුන්ගෙන් පිටවන්නට විය. ඇතැමෙක් ගුණ කිවූහ. අයෙක් විවේචනය කළහ. විශාල කඩහිමියෙක් සේවකයින් අමතා "තමන්ට හැකි ප්‍රමාණයකට ආරාධනා නො කර ගම පුරා සම්මාදම් කරමින් දැන් ඇවිදින්නේ ය., කරන්න පුළුවන් දේ සහ බැරි දේ තේරුම් ගන්නේ නැතිව මේ මෝඩ මිනිහා වැඩ කරන්නේ, වැඩියෙන් බඩු උපයාගෙන ලාබ ලබන්නට තමයි ඔහොම කරන්නේ. අපි දන්නේ නැද්ද ඔය මනුෂ්‍යයාගේ හැටි..."

යනාදි වශයෙන් දෙස් කියමින් සිටින විට උපාසකයා එම කඩයට පැමිණ "මුදලාලි අපි හෙට විශාල පින්කමක් කරනවා බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ උදෙසා. ඔබතුමාට පුළුවන් උදව්වක් කරන්න යි පැවසී ය.

මුදලාලිත් ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට නො හැකි ව තම දකුණු අතේ ඇඟිලිතුඩු තුනින් හසුවන ප්‍රමාණයට ගෙන මුං, මෑ, තල, සහල් ආදිය ඔහුට දුන්නේ ය.

උපාසක තෙමේත් ඒ සියල්ල වෙනම මල්ලකට දැමී ය. ඉදිකටු තුඩක් පමණ සිහින් සිදුරක් හදා පැණි බෝතලයෙන් සහ තෙල් බෝතලයෙන් පැණි සහ තෙල් ගැනීමට පටන් ගත්තේ ය. එයින් බින්දුවක් වැටීමට බොහෝ වේලාවක් ගත වෙයි.

උපාසකයාට සහ පැමිණි පිරිසට තවත් වැඩ බොහෝ ඇති බැවින් එහි වැඩි වේලා ගත කිරීමට නො හැකි විය. එබැවින් වැටුණු පැණි සහ තෙල් බිඳු කිහිපය වෙනත් භාජනයකට ගෙන යන්නට ගියේ ය.

උපාසක තෙමේ මා දුන් මුං, මෑ ආදි ධාන්‍යයත්, පැණි සහ තෙල් ආදියත් වෙනම ගත්තේ ය. පොදු මල්ලට දා නො ගත්තේ ය. කුමක් නිසා මේ මිනිහා එසේ කළේ දැයි දැන ගැනීමට සේවකයකු ඔහු පසු පස යැවී ය.

උපාසක තෙමේ ආහාර පිසීමට පටන් ගත් කල්හි මුදලාලි දුන් ධාන්‍යවලින් ඇට දෙක බැගින් සහ තෙල් සහ පැණිවලින් බිංදු දෙක බැගින් එකතු කර "මුදලාලිට යහපතක් වේවා" යි ප්‍රාර්ථනා කළේ ය.

සේවකයා එය වහා දැන්වීය. අද පින්කමට එන පිරිස මැද මාගේ නම කියමින් මට නිගා කළහොත් මොහුගේ ගෙල සිඳ දමමි යැයි තීරණය කර කිනිස්සක් ඉනෙහි සඟවාගෙන පින්කම වන ස්ථානයට ගියේ ය. බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ සංඝයා වහන්සේට දන් පිළිගන්වා අවසානයේදී උපාසක තෙමේ

බුදුරජාණන් වහන්සේ අමතා "ස්වාමිනි, මම හැම කෙනෙකුගෙන් ම දානෝපකරණ ලබාගෙන මේ දානය දුන්නෙමි., හැම කෙනෙක්ම තමන්ගේ වත් පොහොසත්කම් අනුව දානෝපකරණ ලබා දුන්නා. ඒ හැම දෙනාටම මෙ පිනෙන් වැඩක්ම වේවා. මෙහි අනුසස් හැමදෙනාටම ලැබේවා, යි කීය.

බුදුරජාණන් වහන්සේ එය අනුමත කරමින් ප්‍රශංසා කළහ. මේ සියල්ල බලා සිටි මුදලාලි "අසවලා ඇඟිලිතුඩු තුනට අසුවන ප්‍රමාණයෙන් මට දානෝපකරණ දුන්නේ ය. යි, මාගේ නම නො කියා මට වෙනසක් නො කළේ ය. සම සේ විපාක ලැබෙන ලෙසට පින් දුන්නේ ය. නැළිවලින් දුන්නත්, ඇඟිලිතුඩුවලින් දුන්නත් එහි විපාකවල වෙනසක් නැත. ඒ බැවින් මෙබඳු අදහස් ඇති පුද්ගලයකු මරා දැමීමට මා සිතූ සිතුවිල්ල ද විපාක ගෙන දෙන්නේ ය. වහා ඔහු කමා කරවා ගත යුතු යි සිතා උපාසකයා වෙත එළැඹ


"උපාසකය, මට කමා කරන්න,යි කීය. උපාසක තෙමේ කිසිත් නො දැන අදහා ගත නො හැකි ව

"මුදලාලි මම කුමකට ද ඔබට සමාව දෙන්නේ. ඔබ කවර වරදෙක් කළාට ද?යි විමසී ය. මුදලාලි සියලු පුවත් දැන්වී ය. ඔවුන් දෙදෙනාගේ කතාව දුටු බුදුරජාණන් වහන්සේ සමීපයෙහි සිටි පිරිසගෙන් පුවත අසා දැනගෙන දෙදෙනාම සමීපයට කැඳවා "උපාසකයෙනි, පින ටිකක් යැයි නො සිතන්න., පිනට අවමන් නො කරන්න., බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ සංඝයාට ටිකක් දන් දුන්නත්, බොහෝ දුන්නත්, එහි විපාකවල අඩුවක් නො වන්නේ ය.,

දිය හිස් කළයකට ජලය බිඳුව බිඳුව වැටීමෙන් ක්‍රමයෙන් එය පිරී යන්නා සේ ටිකෙන් ටික පින් කර ගැනීමෙන් පින් කළය පිරෙන්නේ ය., එබැවින් හැකි අයුරින් දන් දීම කරන්න., යැයි "මාප්පමඤ්ඤෙත පුඤ්ඤස්ස – න මන්තං ආගමිස්සති, උදබිංදු නිපාතේන – උදකුම්භෝ'පි පූරති, පූරති ධීරෝ පුඤ්ඤස්ස – ථොකථොකම්'පි ආචිනන්ති" යන ගාථාව දේශනා කරමින් ධර්මාවවාද කළහ.

ඇඟිලිතුඩු තුනට හසුවන ප්‍රමාණයට මුං, මෑ, තල ආදි ධාන්‍ය පින්කමට දුන්නේ ය යන පුවත ගම පුරා පැතිර ගියේ ය. එදින සිට ගම් වැසියෝ "බිළාල පාද මුදලාලි, බළල් පා ඇති මුදලාලි, බළල් කකුල් මුදලාලි" යනාදි නම්වලින් ඔහු හැඳින්වීමට පුරුදු වූහ.

දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**



# කඳ සුරිඳුන්ගේ මුල් වාසභූමිය වූ
# දොඩන්දූවේ කුමාර මහා විහාරය

කුමාරසම්භව ග්‍රන්ථය ඇතුළු මූලාශ්‍රයන්ට අනුව කතරගමට වැඩමවීමට පෙර ස්කන්ධ කුමාර දෙවිඳුන් වැඩසිටි නිසා කුමාරකන්ද නමින් හැඳින්වූ කඳු මුදුනෙහි තනවන ලද කුමාර මහාවිහාරය ගාලු කෝරළයේ වැල්ලබඩ පත්තුවේ ඉපැරැණි දෙඩන්දූව වරායට නුදුරින් කොළඹ ගාල්ල මහා මාර්ගය පේන මානයේ ගොඩබිම දෙසින් පිහිටා ඇත.

ධීවර කර්මාන්තය හා රුවල් ඔරු ආශ්‍රිත නාවික කටයුතුවලට යොමු වූ ජනතාව වාසය කළ, කෝට්ටේ යුගයේ උඩුගල්පිටිය වරාය ලෙස හඳුන්වා ඇති මෙම ප්‍රදේශය වාරකන් කාලයේදී කලපුවේ හා ඔයේ පිහිටීම සමඟ අර්ධ දූපතක් බවට පත්වීම නිසා දෙඩන්දූව නම් ලදැයි සම්මතයයි. දෙඩන්දූවේ පැවති මෙම රුවල් නැව් තාක්ෂණයෙන් ශේෂ වූ අවසාන රුවල් නැව මින් සියවසකටත් එහා අතීතයේදී හම්බන්තොටින් ලුණු පටවාගෙන මහ සයුරේ යාත්‍රා කරද්දී කුණාටුවකට හසු වී මාලදිවයින කරා ගසාගෙන ගොස් විනාශයට පත් වූ පුවතක් ජනප්‍රවාදයේ සඳහන් ය.

කුමාරසම්භව සංස්කෘත කාව්‍යයට අනුව ඉන්ද්‍ර දිව්‍යරාජයා යුද්ධයට අධිපති කඳ සුරිඳුන් වෙත පැමිණ ලංකාපුරයේ අධිපති තාරක අසුරේන්ද්‍රයන් පරදවන ලෙස දැන්වූ කල සිවුරඟ සේනා පිරිවරා ලක්දිවට පැමිණ රජ්ගමට නුදුරු කුමාරකන්දෙහි කඳවුරු බැඳගෙන සත් අවුරුද්දක් දරුණු යුද්ධයක් සිදු කොට ජය ලැබීය. කුමාරකන්දෙහි බලකොටුව පිහිටවූ තැන මඤ්ජු රජු විසින් කාශ්‍යප බුදුරදුනට ආරාමයක් කරවන ලදින් පසුකලෙක ජුතින්ධර නම් පසේ බුදුන් වහන්සේ එහි වැඩ විසූ බව කියැවේ.

කුමාර මහාවිහාරයේ ආරම්භය 1765 වර්ෂයේදී සිදු වී යැයි සැලකෙයි. වඩුමෙස්ත්‍රිගෙයි සීලධර සාමණේර සිල්වතුන් විසින් විහාර කර්මාන්ත ආරම්භ කොට තිබුණු මෙහි එම විහාර කර්මාන්ත විධිමත් කරවන ලද්දේ තොටගමු රන්පත් රජමහා විහාරයෙන් පැමිණි තෙලිකඩ සෝණුත්තර මාහිමිපාණන් වහන්සේ විසිනි. සෝණුත්තර හිමියන් බුරුමරට කල්‍යාණී සීමාවේදී උපසම්පදාව ලබා ලක්දිව අමරපුර කල්‍යාණිවංශ මහා නිකාය පිහිටුවා වදාළ කතලුවේ ගුණරතනතිස්ස මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යභාවයට පත් වී ඇත.


විහාර බිම එළි පෙහෙළි කිරීමේදී එල දෙකක් පමණක් පිහිටි කුඩා අඹ ගසක් පිහිටි තැන වර්ෂ 1781 දී තනවන ලද වෙහෙර වහන්සේ අවස්ථා දෙකකදී විශාල කොට තිබේ. පෞරාණික බෝධීන් වහන්සේගේ ශාඛා තවමත් පොදුජන වන්දනාවට පත්වන අතර නව බෝධීන් වහන්සේ නමක් 2010 වසරේදී රෝපණය කරවන ලදි. ලන්දේසි යුගයේ ගෘහ නිර්මාණ ලක්ෂණයන්ගෙන් සමන්විත කුටි තුනකින් සමන්විත මනරම් විහාර මන්දිරය විහාරස්ථානය වරින් වර නවීකරණය කිරීම් කරවා විචිත්‍රවත් කොට ඇති අතර 1853 වසරේ තනවා ඇති දෙමහල් ධර්ම ශාලාව ද සුවිශේෂී නිර්මාණයකි.

තෙලිකඩ සෝණුත්තර හිමියන්ගෙන් පසු තෙවසරක් දෙඩන්දූවේ ජෝතිරතන හිමියන් විහාරාධිපතීත්වය හෙබවූ පසු හික්කඩුවේ රතනපාල හිමියන් විහාරාධිපතිත්වයට පත් වූහ.

හික්කඩුවේ රතනපාල හිමියන්ගේ මූලිකත්වයෙන් 1869 වර්ෂයේදී කුමාර විද්‍යාලය නමින් පිරුවනක් ආරම්භ කරවා ඇති අතර එය අක්‍රීය වීමෙන් පසු 1949 වර්ෂයේදී රාජගිරි පිරුවන ලෙසින් ද නැවත අක්‍රිය වීමෙන් පසු 1983 දී සීලක්ඛන්ධ පිරුවන වශයෙන් ද ආරම්භ කර පවත්වා ගෙන එනු ලබයි.

වාදීභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද මාහිමිපාණන් වහන්සේ පැවිදිබිමට පත් වන්නේ ද කුමාර මහා විහාරස්ථානයේදී ය. මසක් පුරා විහාරස්ථානයේ ත්‍රිපිටක පොත් පිටපත් කිරීමේ පින්කම් මාලාවක අවසාන දිනයේ ධර්මදේශනා පින්කමක දායකත්වය භාර ගත් පුස්කොළ පොත් පිටපත් කිරීමේ නිරත වූ තරුණයන් අතර සිටි ගිංගම ලද්දු මිගෙල් මැන්දිස් නම් තරුණයා නියමිත දිනයේ සන්ධ්‍යාවේ හික්කඩුවේ රතනපාල හිමියන් සෙවණේ මොහොට්ටිවත්තේ ගුණානන්ද නමින් පැවිදි බව ලබා තුන්යම් රාත්‍රී මුළුල්ලේ ධර්ම දේශනාවක් පැවැත් වූ බව සඳහන් වෙයි.

කොස්වත්තේ අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේගෙන් පසු තැන්නේකුඹුරේ සෝණුත්තර මාහිමිපාණන් වහන්සේ විහාරාධිපති ධුරය හෙබවූහ. කුමාර



විහාරාධිපති
ගන්තලාවේ ගුණානන්ද නාහිමි



අම්බලන්ගොඩ
සුමේධානන්ද හිමි

> දොඩන්දූවේ ශෛලබිම්බාරාමයෙහි වැඩසිටි අග්‍රගණ්‍ය පඬිරුවනක වූ අලුත්ගම සීලක්ඛන්ධ කල්‍යාණිවංශ නිකායේ මහානායක හිමිපාණන් වහන්සේ ස්වකීය පොත්පත් කුමාරකන්දේ වැඩ සිටි තම උපස්ථායක තැන්නේකුඹුරේ සෝණුත්තර හිමියන් වෙත පිරිනමන ලදින් ගැල් දොළහක පැට වූ පැරැණි පොත් පත් ශෛලබිම්බාරාමයේ සිට කුමාරකන්දට රැගෙන එන ලදි.

මහාවිහාරය ශාස්ත්‍රාභිලාෂීන්ගේ තෝතැන්නක් වන්නේ විහාරස්ථ ශ්‍රී ශීලක්ඛන්ධ පුස්තකාලය නිසාවෙනි. දෙඩන්දූවේ ශෛලබිම්බාරාමයෙහි වැඩසිටි අග්‍රගණ්‍ය පඬිරුවනක වූ අලුත්ගම සීලක්ඛන්ධ කල්‍යාණිවංශ නිකායේ මහානායක හිමිපාණන් වහන්සේ ස්වකීය පොත්පත් කුමාරකන්දේ වැඩ සිටි තම උපස්ථායක තැන්නේකුඹුරේ සෝණුත්තර හිමියන් වෙත පිරිනමන ලදින් ගැල් දෙළහක පැට වූ පැරණි පොත් පත් ශෛලබිම්බාරාමයේ සිට කුමාරකන්දට රැගෙන එන ලදි. හික්කඩුවේ සුමංගල නාහිමි, රත්මලානේ ධර්මාරාම නාහිමි, බුලත්ගම ධම්මාලංකාර නාහිමි, වස්කඩුවේ සුභූති නාහිමි, රන්දෙඹේ ධම්මාලංකාර නාහිමි, බෝපාගොඩ සිරිසුමන මහානාහිමි, යාත්‍රාමුල්ලේ ධම්මාරාම නාහිමි, අඹගහවත්තේ ඉන්දාසභ වරඤාණසාමි මහානාහිමි, සෙන්පති ඕල්කට්තුමා, අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර මැතිතුමා වැනි සම්භාවනීය පුද්ගලයන් රාශියක් සීලක්ඛන්ධ මාහිමියන් වෙත එවූ ලිපිවල අත් පිටපත් මෙහි තැන්පත් කොට තිබේ. දන්තධාතු වංශය, ලලාට ධාතුවංශය යන කෘතීන් තැන්නේකුඹුරේ සෝණුත්තර මාහිමියන් රචිත ග්‍රන්ථ වෙයි.

දෙඩන්දූවේ ධම්මාරාම අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට පසු සුවිශේෂී පඬිවරයෙකු වූ දෙඩන්දූවේ ධම්මසේන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ කුමාර මහා වෙහෙරපති පදවිය දැරූහ. අඳුරු යුගයකින් පසු ගාලු දිසාවේ ප්‍රධාන සංඝනායක ගන්තලාවේ ගුණානන්ද නාහිමිපාණන් වහන්සේ විහාරාධිපති පදවියට පත්ව මහත් මෙහෙවරක් සිදු කරති.

ශ්‍රී ශීලක්ඛන්ධ පුස්තකාලය විමර්ශිත පුස්තකාලයක් ලෙස සංවර්ධනය කිරීම ඇතුළු සෑම කටයුත්තක් සඳහාම අමරපුර කල්‍යාණිවංශ මහානිකායේ වැඩබලන ලේඛකාධිකාරී, විද්‍යානිධි, පණ්ඩිත අම්බලන්ගොඩ සුමේධානන්ද නාහිමිපාණන් වහන්සේ සමුපකාරීව ක්‍රියා කරති.

රටෙහි බොහෝ ප්‍රදේශවලට අනන්‍ය වූ කෘෂිකර්මාන්තය පදනම් කොටගත් අර්ථ ක්‍රමයක් වෙනුවට නාවික කටයුතුවල නියැළුණු අර්ථක්‍රමයක් සහිත දායක පිරිසක් සහිත, සුප්‍රකට දෙඩන්දූව ගුරුකුලය ඔස්සේ ශික්ෂණය ලද පඬිවරුනගේ පහස ලද දෙඩන්දූවේ කුමාර මහාවිහාරය ලක්දිව විහාරස්ථාන අතර සුවිශේෂී මංසලකුණු විදහාපාන විහාරස්ථානයකි.

දිමුතු පුන්සර කොළඹගේ

වර්ෂ 2021 ක් වූ ජූලි 31 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.